# කාර්ය සාධන වාර්තාව
# 2018

ශ්‍රී ලංකා පොලීසිය



**පොලිස්පති පණිවිඩය**

2018 වසරේ ශ්‍රී ලංකා පොලිසියේ කාර්ය සාධනය පිළිබිඹු කෙරෙන මෙම වාර්තාව සඳහා පණිවුඩයක් ලබාදීමට හැකිවීම සතුටට කරුණක් ලෙස සළකමි.

රටේ නීතිය හා සාමය ආරක්‍ෂා කරමින් සියලුම පුරවැසියන්ට අපරාධ බියකින් තොරව ජීවත්වීමේ වටපිටාවක් නිර්මාණය කිරීම ශ්‍රී ලංකා පොලිසියේ ප්‍රමුඛ පරමාර්ථයයි. එකී පරමාර්ථය සාධනය කරගැනීම උදෙසා ශ්‍රී ලංකා පොලිසිය කැපවී සිටියි.

87000 කට අධික වූ පොලිස් කාර්ය මණ්ඩලය සහ ඔවුන්ට සහාය දක්වන 4000 කට අධික වූ සිවිල් කාර්ය මණ්ඩලයකින් ද සැදුම්ලත් ශ්‍රී ලංකා පොලිසිය 2018 වසරේ සිය පරමාර්ථයන් සාධනය කරගත් ආකාරය මෙම වාර්තාව මගින් විදහා දැක්වෙනු ඇත. එමගින් පිළිබිඹු කෙරෙන ඉතා කැපී පෙනෙන කාරණා කිහිපයක් මෙහි ඉතා සංක්ෂිප්තව සටහන් කිරීමට කැමැත්තෙමි.

මෙම වාර්තාවේ අඩංගු දත්තවලට අනුව 2017 වසර හා සංසන්දනය කළ විට බල අපරාධ වාර්තා වීමේ 1% ක පමණ ඉහළයාමක් දැකිය හැකි වුවද ගෙවල් බිඳුම්, කොල්ලකෑම් වැනි අපරාධවල ද කාන්තාවන්ට එරෙහි බල අපරාධවල ද 2017 වසරට වඩා අඩුවීමක් පෙන්නුම් කර ඇත. බල අපරාධ විසඳීමේ ප්‍රතිශතය 78% කි.

මත් උවදුර සමාජයෙන් තුරන් කිරීම සඳහා පොලිසිය ගන්නා උත්සාහය මැනවින් පිළිබිඹු කෙරෙන සාධකයක් ලෙස මෙහි ඇතුළත් මත්කුඩු වැටලීම් සම්බන්ධ දත්ත පෙන්වා දීමට කැමැත්තෙමි. විශේෂයෙන්ම පසුගිය වසර තුනක කාලය ගත්විට මෙරටට ගලා එන මත්කුඩුවල විශාල අඩුවීමක් හඳුනාගත හැකිය. උදාහරණ ලෙස 2016 වසරේ හසුවූ මත්කුඩු ප්‍රමාණය කිලෝ 38876 ක් වූ අතර 2018 වසර වන විට එම ප්‍රමාණය ක්‍රමානුකූලව කිලෝ 10254 දක්වා 74% කින් අඩු වී ඇත. එමගින් පෙන්නුම් කෙරෙන්නේ ශ්‍රී ලංකා පොලිසිය නිරන්තරයෙන් සිදුකරනු ලබන මහා පරිමාණ මත්කුඩු වැටලීම් හේතුවෙන් මෙරටට මත්කුඩු ගලාඒමේ ප්‍රවාහය අඩපණ වී ඇති ආකාරයයි.

2017 වසරට සාපේක්ෂව දූෂණ වැරදිවල 9% ක අඩුවීමක් දත්ත විශ්ලේෂණය මගින් පෙන්නුම් කර ඇති අතර විවිධ පැමිණිලි, පවුල් ආරවුල්, පුද්ගලයන්ට හා දේපළවලට එරෙහි සුළු වැරදි වාර්තාවීම් ද පහළයාමක් දක්නට ලැබේ.

ව්‍යවස්ථාපිත පනත් යටතේ එන වැරදිවල විශාල අඩුවීමක් සිදුව ඇති අතර විශේෂයෙන්ම පරිසරයට එරෙහි වැරදිවල පැහැදිළි අඩුවීමක් දක්නට ඇත. වෙරළ සංරක්‍ෂණ පනත යටතේ එන වැරදි 46% කින් ද පරිසර ආඥා පනත යටතේ එන වැරදි 3% කින් ද අනවසර පතල් කැණීම් 16% කින් ද කැලෑ ආඥා පනතෙහි දක්වා ඇති වැරදි 36% කින් ද අඩුවී තිබීම උදාහරණ ලෙස පෙන්වා දියහැකිය.

ස්වාභාවික ආපදා සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොලිසියේ සාමූහික ක්‍රියාකාරීත්වය තුළ 2018 වසරේ ස්වභාවික ආපදා අනතුරු බොහෝ සෙයින් අඩු වී ඇත. ඒ අනුව 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ ස්වාභාවිකවිපත් මරණ සහ අවතැන්වීම් ඉතා විශාල ලෙස අඩුකර ගැනීමට හැකිවීම සුවිශේෂී ජයග්‍රහණයක් ලෙස මෙහිදී සඳහන් කළ යුතුය.

මානව සම්පත් සංවර්ධනය සම්බන්ධයෙන් සළකාබැලූ විට පොලිස් නිලධාරීන් විශාල ප්‍රමාණයකට 2018 වසරේ උසස්වීම් ලබාදීමට හැකි වී ඇත. විශේෂ කාර්ය බලකාය ද අතුළත්ව ශ්‍රී ලංකා පොලිසියට නිලධාරීන් 2313 ක් බඳවා ගැනීමට ශ්‍රී ලංකා පොලිසිය 2018 වසරේ කටයුතු කර ඇත.

ශ්‍රී ලංකා පොලිසියේ සේවාවන් තවදුරටත් පුළුල් කරමින් මත්තෙගොඩ සහ අක්කරායන්කුලම් යන පොලිස් ස්ථාන දෙක පිහිටුවීමට අප සමත්ව ඇත.

මෙහි දක්වන ලද්දේ ඉතා සංක්ෂිප්ත කරුණු කිහිපයකි. 2018 වසරේ ශ්‍රී ලංකා පොලිසියේ කාර්ය සාධනය පිළිබඳ තව බොහෝ තොරතුරු මෙම වාර්තාවෙහි ගැබ් වී ඇති අතර ඒ පිළිබඳව තවදුරටත් විමර්ශනසීලිව අධ්‍යයනය කරන ලෙස මා ඔබට ආරාධනය කරමි.

ශ්‍රී ලංකා පොලිසියේ වසර 152 ක් පසුකර ආ ගමන්මගෙහි ඉදිරියටත් අභිමානයෙන් යුතුව රට දැය සමය වෙනුවෙන් සේවය සැලසීම සඳහා ඔබගේ සහාය නිරතුරුව අපේක්‍ෂා කරමි.

**පූජිත් ජයසුන්දර**
**පොලිස්පති**



## දැක්ම

අපරාධ සහ ප්‍රචණ්ඩත්වය
පිළිබඳව බියකින් තොරව
විශ්වාසයෙන් යුතුව
ජීවත් වීමට හැකි සාමකාමී
පරිසරයක් බිහි
කිරීම.

## මෙහෙවර

සැමට සමාන,
කිසිවකුටත් අගතියක්
සිදුකිරීමකින් තොරව
අපරාධ සහ
ත්‍රස්තවාදය
වැළැක්වීමටත්, සාමය
ආරක්ෂා කරගැනීමටත්,
දිවයිනේ නීතිය
පවත්වාගෙන යාමටත්,
එය ක්‍රියාත්මක කිරීමටත්
ශ්‍රී ලංකා පොලිසිය
විශ්වාසයෙන් යුතුව ක්‍රියා
කිරීමට ඇප කැප වී සිටියි.

# ශ්‍රී ලංකා පොලීසියේ කාර්යභාරය

- ❖ මහජන ආරක්ෂාව හා සාමය පවත්වාගෙන යාම
- ❖ අපරාධ පාලනය හා වැළැක්වීම
- ❖ අපරාධ විමර්ශනය හා නඩු මෙහෙයවීම
- ❖ මාර්ග ආරක්ෂාව හා රථවාහන පාලනය
- ❖ ප්‍රභූ ආරක්ෂාව
- ❖ පරිසර ආරක්ෂණ කටයුතු සහ ආපදා අවස්ථාවන්හි දී අදාළ අංශ වෙත සහාය ලබාදීම
- ❖ කැරළි හා දූෂණ මර්දන සහ විවිධ පැමිණිලි විසඳීම
- ❖ පොලිස් නිශ්කාෂණ හා පසුබිම් වාර්තා අදාළ අංශ සහ පුද්ගලයින් වෙත නිකුත් කිරීම.

# පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| 01. | ශ්‍රී ලංකා පොලීසියේ සංවිධානාත්මක ව්‍යුහය | 01 – 04 |
| 02. | අපරාධ | 05 – 12 |
| 03. | සුළු අපරාධ | 13 – 16 |
| 04. | විවිධ පැමිණිලි | 17 – 20 |
| 05. | සියදිවි හානිකරගැනීම් | 21 – 28 |
| 06. | සුරාව සහ නිද්‍රාජනක ද්‍රව්‍ය සම්බන්ධ වැරදි | 29 – 33 |
| 07. | දූෂණ හා ව්‍යවස්ථාපිත වැරදි | 34 – 39 |
| 08. | රිය අනතුරු | 40 – 45 |
| 09. | හදිසි මරණ | 46 – 48 |
| 10. | ස්වාභාවික විපත් | 49 – 50 |
| 11. | විශේෂිත මහජන සේවාවන් | 51 – 52 |
| 12. | ප්‍රජා පොලිස් සේවාව | 53 – 59 |
| 13. | පරිසර ආරක්ෂණය | 60 – 61 |
| 14. | මානව සම්පත් සංවර්ධනය | 62 – 76 |
| 15. | භෞතික සම්පත් සංවර්ධනය | 77 – 82 |
| 16. | සමස්ථ මූල්‍ය ප්‍රගතිය | 83 – 85 |
| 17. | 2017 වර්ෂයේ කාර්ය සාධනය සැකෙවින් | 86 – 87 |
| 18. | ඇමුණුම 01 - කෙටි යෙදුම් සඳහා අර්ථ දැක්වීම | 88 – 88 |
| 19. | ඇමුණුම 02 - හදිසි මරණ | 89 – 89 |
| 20. | ඇමුණුම 03 - දේශීය ක්‍රීඩා තරඟ ජයග්‍රහණ | 90 – 92 |
| 21. | ඇමුණුම 04 - ඉදිකිරීම් | 93 – 97 |

# 01.ශ්‍රී ලංකා පොලීසියේ සංවිධානාත්මක ව්‍යුහය



1\. 1. ප්‍රාදේශීය පොලිස් කොට්ඨාස ව්‍යුහය ( ප්‍රාදේශීය පොලිස් කොට්ඨාස ප්‍රමාණය 42 කි. )



1. 2. ක්‍රියාකාරි පොලිස් කොට්ඨාස ව්‍යුහය ( ක්‍රියාකාරි පොලිස් කොට්ඨාස ප්‍රමාණය 62 කි. )



### 1. 3. විශේෂ කාර්ය බලකායේ ව්‍යුහය හා කාර්යභාරය




#### 1 3. 1. විශේෂ කාර්ය බලකායේ කාර්යභාරය

- අපරාධ මර්දන මෙහෙයුම් සිදු කිරීම (සංවිධානාත්මක අපරාධ)
- දෙස් විදෙස් ප්‍රභූ ආරක්ෂක රාජකාරි
- සෝදිසි හා බෝම්බ නිශ්ක්‍රිය මෙහෙයුම් සිදු කිරීම.
- නීතිය හා සාමය ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකා පොලිසියට සහයවීම.
- ස්වභාවික හෝ මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇති වන හදිසි ආපදා තත්වයන් වලදී ජන ජීවිතය යථාතත්වයට පත්කිරීමට සහය වීම.
- සමාජ විරෝධී අවකල් ක්‍රියා මැඩපැවැත්වීමට කටයුතු කිරීම. (නීති විරෝධී මත්කුඩු ජාවාරම, ගංජා ජාවාරම් වැනි දෑ)
- ස්වභාව ධර්මයේ දායාදයන් සුරැකීම හා මිනිසා විසින් සිදු කරනු ලබන පාරිසරික විනාශයන් වැළැක්වීමට කටයුතු කිරීම.
- ජීවිතාරක්ෂක කටයුතු සිදුකිරීම.

# 02. අපරාධ

අපරාධ මූලිකවම බල අපරාධ සහ සුළු අපරාධ ලෙස වර්ගීකරණය කර ඇත. ඉතා බරපතල ගණයේ ලා සැළකෙන අපරාධ බල අපරාධ ලෙස ද බරපතල නොවන අපරාධ සුළු අපරාධ ලෙස ද සරලව විග්‍රහ කළ හැක. මෙම පරිච්ඡේදය යටතේ 2018 වසරේ අපරාධ වාර්තාවීම හා විසඳීම පිළිබඳ තොරතුරු 2016 සහ 2017 යන වසර දෙක හා සංසන්දනාත්මකව ඉදිරිපත් කර ඇත.

## 2.1 බල අපරාධ

ශ්‍රී ලංකා පොලීසිය වෙත වාර්තා වන අපරාධ අතුරින් ඉතා බරපතල ගණයෙහිලා සැළකෙන අපරාධ බල අපරාධ ලෙස හැඳින්වේ. මෙබඳු අපරාධ මගින් පුද්ගලයාට සහ පොදුවේ සමාජයට සිදුකරනු ලබන හානිය ඉතා විශාල වේ. ශ්‍රී ලංකා පොලීසිය මෙම බල අපරාධ වර්ග 26 ක් යටතේ වාර්තා කරනු ලබන අතර මෙම අනු ඡේදය මගින් 2018 වසරේ පොලීසිය වෙත වාර්තා වූ බල අපරාධ පිළිබඳ සංඛ්‍යා දත්ත ඉදිරිපත් කර ඇත. එම දත්ත පසුගිය වසර දෙක එනම් 2016 සහ 2017 හා සංසන්දනාත්මකව විශ්ලේෂණය කර දක්වා ඇත.

වගු අංක 01 **2016 – 2018 බලඅපරාධ වගුව**

| ග්‍රහණ අපරාධ | | 2016 | | | | 2017 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා වූ | විමර්ශනය වෙමින් පවතින | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා වූ | විමර්ශනය වෙමින් පවතින | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා වූ | විමර්ශනය වෙමින් පවතින | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය |
| 1 | අපහරණය | 738 | 73 | 665 | 90% | 647 | 64 | 583 | 90% | 754 | 82 | 672 | 89% |
| 2 | පැහැරගෙනයාම | 297 | 33 | 264 | 89% | 251 | 21 | 230 | 92% | 260 | 26 | 234 | 90% |
| 3 | ගිනි තැබීම හෝ පුපුරණ ද්‍රව්‍යවලින් අනර්ථය සිදුකිරීම | 486 | 119 | 367 | 76% | 418 | 102 | 316 | 76% | 460 | 114 | 346 | 75% |
| 4 | රු25000 ට වැඩි අලාභ ඇති වන පරිදි සිදු කෙරෙන අනර්ථ | 394 | 36 | 358 | 91% | 424 | 27 | 397 | 94% | 476 | 53 | 423 | 89% |
| 5 | ගෙවල් බිඳීම | 10287 | 4589 | 5698 | 55% | 8913 | 3394 | 5519 | 62% | 8085 | 3217 | 4868 | 60% |
| 6 | බරපතල තුවාල සිදුකිරීම | 1205 | 29 | 1176 | 98% | 1075 | 25 | 1050 | 98% | 942 | 30 | 912 | 97% |
| 7 | අන්තරාදායක ආයුධවලින් (පිහි ආදිය) තුවාල කිරීම) | 2358 | 67 | 2291 | 97% | 2131 | 66 | 2065 | 97% | 1947 | 92 | 1855 | 95% |
| 8 | මනුෂ්‍ය ඝාතනය | 502 | 37 | 465 | 93% | 452 | 32 | 420 | 93% | 489 | 47 | 442 | 90% |
| 9 | මනුෂ්‍ය ඝාතනයට තැත්කිරීම / සියපණ හානිකර ගැනීමට අනුබලදීම | 160 | 12 | 148 | 93% | 163 | 12 | 151 | 93% | 144 | 12 | 132 | 92% |
| 10 | ස්ත්‍රී දූෂණය (වයස අවුරුදු 16 ට වැඩි) | 350 | 21 | 329 | 94% | 294 | 15 | 279 | 95% | 346 | 23 | 323 | 93% |
| 11 | ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය (වයස අවුරුදු 16 ට අඩු) වින්දිතයාගේ කැමැත්ත ඇතිව | 1394 | 19 | 1375 | 99% | 1206 | 37 | 1169 | 97% | 1196 | 34 | 1162 | 97% |
| | ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය (වයස අවුරුදු 16 ට අඩු) වින්දිතයාගේ කැමැත්ත නොමැතිව | 292 | 8 | 284 | 97% | 232 | 13 | 219 | 94% | 248 | 17 | 231 | 93% |
| 12 | නීති විරෝධී රැස්වීම / කැරළි කොල්හලය | 21 | 0 | 21 | 100% | 22 | 1 | 21 | 95% | 39 | 4 | 35 | 90% |
| 13 | කොල්ලකෑම | 3455 | 1031 | 2424 | 70% | 3366 | 872 | 2494 | 74% | 3146 | 798 | 2348 | 75% |
| 14 | අස්වාභාවික වැරදි හා බරපතල ලිංගික අපයෝජනය | 716 | 16 | 700 | 98% | 616 | 21 | 595 | 97% | 750 | 39 | 711 | 95% |
| 15 | බලෙන් ලබාගැනීම (යම් දේපලක් හෝ වටිනා ඇපයක් හෝ වටිනා ඇපයකට හැරවිය හැකිව අත්සන් කරනු ලැබූ හෝ මුද්‍රා තබනු ලැබූ යමක්) | 131 | 14 | 117 | 89% | 178 | 25 | 153 | 86% | 149 | 16 | 133 | 89% |
| 16 | රුපියල් 300000/- කට (රුපියල් තුන් ලක්ෂයකට) වඩාවටිනාකමකින් යුතු සාපරාධි සාවද්‍ය පරිහරණය, සාපරාධි විශ්වාසය කඩකිරීම හා වංචා කිරීම | 5472 | 1964 | 3508 | 64% | 6192 | 1702 | 4490 | 73% | 6090 | 1967 | 4123 | 68% |
| 17 | රුපියල් 25000 ට වැඩි වටිනාකම ඇති වැව්ලි ද්‍රව්‍ය සොරකම | 75 | 12 | 63 | 84% | 80 | 5 | 75 | 94% | 48 | 7 | 41 | 85% |
| | රුපියල් 25000 ට වැඩි වටිනාකම ඇති ගව සොරකම | 640 | 125 | 515 | 80% | 802 | 145 | 657 | 82% | 777 | 166 | 611 | 79% |
| | රුපියල් 25000 ට වැඩි වටිනාකම ඇති දේපල සොරකම | 5448 | 1843 | 3605 | 66% | 5261 | 1366 | 3895 | 74% | 5171 | 1337 | 3834 | 74% |
| 18 | ව්‍යාජ මුදල් නෝට්ටු සන්තකය හා මුද්‍රණය | 76 | 2 | 74 | 97% | 88 | 2 | 86 | 98% | 74 | 2 | 72 | 97% |

| | ග්‍රහණ අපරාධ | 2016 | | | | 2017 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා වූ | විමර්ශනය වෙමින් පවතින | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා වූ | විමර්ශනය වෙමින් පවතින | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා වූ | විමර්ශනය වෙමින් පවතින | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය |
| 19 | රාජ්‍ය විරෝධි අන්දමින් සිදු කෙරෙන වැරදි | 0 | 0 | 0 | | 0 | 0 | 0 | | 0 | 0 | 0 | |
| 20 | ළමුන්ට කෲර ලෙස සැළකීම | 107 | 4 | 103 | 96% | 88 | 3 | 85 | 97% | 104 | 5 | 99 | 95% |
| 21 | ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම | 49 | 0 | 49 | 100% | 43 | 0 | 43 | 100% | 50 | 2 | 48 | 96% |
| 22 | කුට්ටනය කිරීම හා තැනැත්තන් වෙළදාම් කිරීම | 26 | 2 | 24 | 92% | 15 | 1 | 14 | 93% | 23 | 8 | 15 | 65% |
| 23 | පීඩාකාරි ආයුධ ආඥා පනත යටතේ ගැනෙන වැරදි | 78 | 6 | 72 | 92% | 63 | 3 | 60 | 95% | 74 | 4 | 70 | 95% |
| 24 | ස්වයංක්‍රීය ගිනි අවි හෝ රිපීටර් තුවක්කු ලඟ තබාගැනීම | 28 | 0 | 28 | 100% | 25 | 0 | 25 | 100% | 24 | 0 | 24 | 100% |
| 25 | හෙරොයින්, කොකේන්, මෝෆීන් කිසියම්ම ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීම, වෙළදාම් කිරීම, ආනයනය කිරීම හෝ අපනයනය කිරීම හෝ හෙරොයින් ග්‍රෑම් 2 ක් හෝ ඊට වැඩි කොකේන් ග්‍රෑම් 02 ක් හෝ ඊට වැඩි මෝෆීන් ග්‍රෑම් 03 ක් හෝ ඊට වැඩි ඔපියම් ග්‍රෑම් 500 ක් හෝ ඊට වැඩි ගංජා කි.ග්‍රෑම් 5 ක් හෝ ඊට වැඩි හා හෂිස් කි.ග්‍රෑම් 1 ක ප්‍රමාණයක් වූ අන්තරාදායක මත්ද්‍රව්‍ය ලඟතබා ගැනීම | 2078 | 6 | 2072 | 100% | 2845 | 7 | 2838 | 100% | 4387 | 5 | 4382 | 100% |
| 26 | පොලිස් නිලධාරීන්ගේ රාජකාරියට බාධාකිරීම | 74 | 0 | 74 | 100% | 89 | 2 | 87 | 98% | 102 | 2 | 100 | 98% |
| | එකතුව | **36937** | **10068** | **26869** | **73%** | **35979** | **7963** | **28016** | **78%** | **36355** | **8109** | **28246** | **78%** |

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යා ලේඛන ඒකකය

## ❖ දත්ත විශ්ලේෂණය

ඉහත වගු අංක 01 හි දත්තවලට අනුව 2016 වසරේ මනුෂ්‍ය ඝාතන 502 ක් වාර්තා වී ඇති අතර 2017 වසරේ එම ප්‍රමාණය 452 දක්වා 10% කින් පහළගොස් ඇත. 2018 වසරේ මනුෂ්‍ය ඝාතන 489 ක් වාර්තා වී ඇති අතර එය 2016 වසර හා සංසන්දනය කළ විට 3% ක අඩුවීමක් පෙන්නුම් කළ ද 2017 වසරට සාපේක්ෂව 8% ක ඉහළයාමකි. මනුෂ්‍ය ඝාතනවල විසඳීම් ප්‍රතිශතය ගත්විට 2016 සහ 2017 වසරවල 93% ක් වූ අතර 2018 වසරේ විසඳීම් ප්‍රතිශතය 90% ක් දක්වා පහත වැටී ඇත.

ජන ජීවිතයට ඉමහත් හානියක් සිදුකරන සහ බල අපරාධවල වැඩියෙන්ම වාර්තා වන අපරාධ වර්ගය වන ගෙවල් බිඳුම් පිළිබඳ දත්ත සළකා බැලීමේ දී 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ සැළකියයුතු අඩුවීමක් සිදුව ඇති බව පෙනේ. පසුගිය වසර තුන තුළ ගෙවල් බිඳුම්වල අඩුවීමක් දැකිය හැකි අතර ගෙවල් බිඳුම් කරන පුද්ගලයින් වැඩි වශයෙන් අත්අඩංගුවට පත්වීම සහ පොලීසියේ අපරාධ මැඩලීමේ ක්‍රියාවලිය තීව්‍ර කර තිබීම මෙම අඩුවීමට හේතු වී ඇති බව පසුගිය වසර කිහිපයක දත්ත අධ්‍යයනය මගින් පැහැදිළි වේ.

ඒ අනුව 2016 වසරේ 10287 ක් වූ ගෙවල් බිඳුම් ප්‍රමාණය 2017 වසරේ 8913 ක් දක්වා 13% කින්ද 2018 වසරේ එය තවදුරටත් පහළ ගොස් 8085 ක් දක්වා 9% කින්ද අඩුවී තිබේ. 2018 වසරේ ගෙවල් බිඳුම් අපරාධවල විසඳීම් ප්‍රතිශතය 60% කි.

පුද්ගලයාට බරපතල මානසික හා ශාරීරික පීඩාවක් එල්ලකරනු ලබන අපරාධයක් වන ස්ත්‍රී දූෂණය ගත්විට මෙම අපරාධ වගුව තුළ ඛාණ්ඩ තුනකට වර්ග කර ඇත. ඉන් මුල්ම ඛාණ්ඩය වන වයස 16 ට වැඩි ස්ත්‍රීන් දූෂණයට ලක්කිරීමේ වරද 2018 වසරේ සැළකිය යුතු ඉහළයාමක් දැකිය හැකිය. මෙම ස්ත්‍රී දූෂණ අපරාධ 2018 වසරේ 346 ක් වාර්තා වී ඇත. 2016 වසරේ මෙම අපරාධ 350 ක් වාර්තා වූ අතර 2017 වසරේ එම සංඛ්‍යාව 294 ක් දක්වා 16% කින් පහළගොස් තිබුණි. ඒ අනුව 2017 වසරට සාපේක්ෂව ස්ත්‍රී දූෂණ අපරාධ සංඛ්‍යාව 2018 වසරේ 346 ක් දක්වා 18% කින් ඉහළගොස් ඇත. 2018 වසරේ විසඳුම් ලබාදෙන ලද වයස 16 ට වැඩි ස්ත්‍රී දූෂණ අපරාධ ප්‍රමාණය 323 ක් වූ අතර එය 93% ක ප්‍රතිශතයකි.

දෙවන ඛාණ්ඩය වන වයස අවුරුදු 16 ට අඩු වින්දිතයාගේ කැමැත්ත ඇතිව සිදුකරන ලද ස්ත්‍රීදූෂණ අපරාධ ගත්විට 2016 වසරේ මෙබඳු අපරාධ 1394 ක් වාර්තා වී ඇති අතර 2017 වසරේ වැරදි 1206 ක් දක්වා 13%

ක ප්‍රතිශතයකින් අඩු වී ඇත. 2018 වසරේ එම අපරාධ 1196 දක්වා 2017 වසරට සාපේක්ෂව සුළු අඩුවීමක් (0.8%) පෙන්නුම් කර ඇත. ගැඹුරින් විශ්ලේෂණය කිරීමේ දී පෙනී යන්නේ මෙම ස්ත්‍රී දූෂණ අපරාධ බොහෝ විට ප්‍රේම සබඳතා මත සිදුව ඇති බවයි. 2018 වසරේ මෙම අපරාධවල විසඳීම් ප්‍රතිශතය 97% කි.

තෙවන බාණ්ඩය වයස අවුරුදු 16 ට අඩු වින්දිතයාගේ කැමැත්ත නොමැතිව කරන ලද ස්ත්‍රී දූෂණ අපරාධ වේ. 2017 වසරේ මෙම අපරාධ 232 ක් වාර්තා වූ අතර 2018 වසරේ 248 දක්වා 7% ක ඉහළයාමක් හඳුනාගත හැකිය. සමස්ථයක් ලෙස 2018 වසරේ සියළුම බාණ්ඩවල ස්ත්‍රී දූෂණ 1790 ක් සිදුව ඇති අතර ඉන් 1716 ක් එනම් 96% ක් සාර්ථක ලෙස විමර්ශන කටයුතු අවසන් කර විසඳුම් ලබා දී ඇත.

බල අපරාධවල ඉතා බිහිසුණු අපරාධයක් ලෙස කොල්ලකෑම් හැඳින්විය හැකිය. වගුවෙහි ඇති පසුගිය වසර තුනක දත්ත විග්‍රහ කිරීමේ දී එම අපරාධ අඩුවීමේ ප්‍රවණතාවයක් හඳුනාගත හැකිය. 2016 වසරේ කොල්ලකෑම් අපරාධ 3455 ක් වාර්තා වූ අතර එය 2017 වසරේ 3366 දක්වා 2% කින් පහළගොස් තිබූ අතර 2018 වසරේ 3146 දක්වා 6% කින් තවදුරටත් අඩු වී ඇත.

කොල්ලකෑම් අපරාධවල විසඳීම් ප්‍රතිශතය 2016 වසරේ 70% ක් වූ අතර 2017 වසරේ 74% ක් ද 2018 වසරේ 75% ක් ද ලෙස ක්‍රමිකව ඉහළගොස් ඇත.

වගුවට අනුව බරපතල ලිංගික අපයෝජනය නැමැති වරදෙහි සැළකිය යුතු ඉහළයාමක් 2018 වසරේ දක්නට ලැබේ. ඒ අනුව 2017 වසරෙහි 616 ක් වූ මෙම අපරාධ 2018 වසරේ 750 ක් දක්වා 22% කින් ඉහළගොස් ඇත. බරපතල ලිංගික අපයෝජන අපරාධ පිළිබඳ විමර්ශන කටයුතු 2018 වසරේ 94% ක් වැනි ඉහළ මට්ටමක පවත්වාගෙන ඇත.

වගුවෙහි දත්තවලට අනුව ඉතා ඉහළ අගයකින් වාර්තා වන අපරාධයක් ලෙස සැළකිය හැකි රුපියල් ලක්ෂ තුනකට වැඩි සාපරාධි සාවද්‍ය පරිහරණය, විශ්වාසය කඩකිරීම හා වංචාව පිළිබඳ වරද සළකා බැලීමේ දී 2017 වසරට වඩා 2018 වසරෙහි යම් අඩුවීමක් පෙන්නුම් කළ ද 2016 වසරට වඩා ඉහළ අගයක පවතින බව පෙනේ. නිරන්තර අවධානයට ලක්වන මිනීමැරුම්, කොල්ලකෑම් වැනි අපරාධ මෙන් ජන සමාජය තුළ ප්‍රභල ලෙස කතාබහට ලක් නොවුවද මෙම අපරාධ මගින් ද සමාජය වෙත යම් බලපෑමක් එල්ල කෙරේ. 2016 වසරේ මෙම වැරදි 5472 ක් වාර්තා වූ අතර 2017 වසරේ 6192 ක් දක්වා 13% කින් මෙම අපරාධ ඉහළගොස් ඇත. 2018 වසරේ වාර්තා වූ මෙම වැරදි ප්‍රමාණය 6090 ක් වූ අතර 2017 වසරට සාපේක්ෂව 2% ක අඩුවීමක් පෙන්නුම් කර ඇත.

මෙම අපරාධවල විසඳීම් ප්‍රගතිය පිළිබඳ පසුගිය වසර කිහිපයක් තිස්සේ සළකාබැලීමේ දී පෙනී යන කරුණක් වන්නේ මේ සම්බන්ධ විමර්ශනවල ප්‍රගතිය 75% මට්ටම ඉක්මවා නොමැති බවයි.

බල අපරාධවල ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණ වරද හැරුණු විට ළමයින්ට එරෙහිව සිදුකරනු ලබන අපරාධ දෙවර්ගයක් වගුවෙහි දක්වා ඇත. එනම් ළමයින්ට කෲර ලෙස සැළකීම සහ අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම යන අපරාධ වේ. මෙම අපරාධ දෙවර්ගයම සැළකූවිට 2016 වසරේ වාර්තා වූ අපරාධ සංඛ්‍යාව 156 කි. 2017 වසරේ මෙම වැරදි 131 දක්වා 16% කින් අඩු වී තිබුණ ද නැවතත් 2018 වසරේ 154 දක්වා 17% කින් වර්ධනය වී ඇත. මෙම අපරාධ පිළිබඳ ශ්‍රී ලංකා පොලීසියේ විමර්ශන ප්‍රගතිය පසුගිය වසර තුනෙහිම සළකාබැලූ විට විසඳීම් ප්‍රතිශතය 96% ඉක්ම වූ මට්ටමක පවතී.

දිනෙන් දින ඉහළට ගමන් කරන බරපතල අපරාධ වර්ගයක් ලෙස මත්ද්‍රව්‍ය අපරාධ හඳුනාගත හැකිය. මත්ද්‍රව්‍ය අපරාධ 2078 ක් 2016 වසරේ වාර්තා වී ඇත. 2017 වසරේ එම අපරාධ 2845 ක් වාර්තා වී ඇති අතර 2016 වසරට සාපේක්ෂව එය 37% ක වැඩිවීමකි. 2017 වසරට සාපේක්ෂව 2018 වසර තුළ මෙම අපරාධ 54% කින් ඉහළයාමක් සිදුව ඇති අතර ඒ අනුව 2018 වසරේ වාර්තා වී ඇති මත්ද්‍රව්‍ය අපරාධ සංඛ්‍යාව 4389 කි.

මත්ද්‍රව්‍ය අපරාධ විමර්ශනයේ දී ශ්‍රී ලංකා පොලීසිය ඉහළ ප්‍රගතියක් පෙන්වා ඇති අතර 2016, 2017 සහ 2018 යන වසර තුනෙහිම මත්ද්‍රව්‍ය අපරාධ විසඳීම් ප්‍රතිශතය 99% ඉක්මවා ඇත.

## 2.2 කාන්තාවන්ට එරෙහි බල අපරාධ

ශ්‍රී ලංකා පොලිසිය වෙත වාර්තා වන බල අපරාධවලින් කාන්තාවන්ට එරෙහි බල අපරාධ වෙන් වෙන්ව ද වර්ගීකරණය කරනු ලැබේ. 2018 වසරේ සමස්ථ බල අපරාධවලින් කාන්තාවන්ට එරෙහි බල අපරාධ වාර්තා වීම 2016 සහ 2017 වසර සමඟ සංසන්දනාත්මකව පහත වගුව මගින් ඉදිරිපත් කර ඇත.

වගු අංක 02

**2016 – 2018 දක්වා කාන්තාවන්ට එරෙහි බල අපරාධ වගුව**

| | වරද | 2016 | | | | 2017 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා වූ | විමර්ශනය වෙමින් පවතින | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා වූ | විමර්ශනය වෙමින් පවතින | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා වූ | විමර්ශනය වෙමින් පවතින | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය |
| 1 | මිනීමැරීම | 109 | 62 | 47 | 43% | 77 | 35 | 42 | 55% | 111 | 55 | 40 | 36% |
| 2 | සියපණ හානිකර ගැනීමට අනුබල දීම | 0 | 0 | 0 | | 0 | 0 | 0 | | 0 | 0 | 0 | |
| 3 | මිනීමැරීමට තැත්කිරීම | 23 | 18 | 5 | 22% | 10 | 6 | 4 | 40% | 11 | 9 | 2 | 18% |
| 4 | ස්ත්‍රී දූෂණය | 350 | 163 | 187 | 53% | 294 | 102 | 192 | 65% | 278 | 141 | 137 | 49% |
| 5 | ව්‍යභිචාරය | | | | | | | | | | | | |
| 6 | බරපතල තුවාල/ පිහි ආදියෙන් තුවාල සිදුකිරීම | 320 | 150 | 170 | 53% | 297 | 108 | 189 | 64% | 241 | 144 | 97 | 40% |
| 7 | අස්වාභාවික වැරදි | 48 | 23 | 25 | 52% | 33 | 15 | 18 | 55% | 5 | 5 | 0 | 0% |
| 8 | බරපතල ලිංගික අපයෝජනය | | | | | | | | | 28 | 16 | 12 | 43% |
| 9 | අපහරණය | 103 | 52 | 51 | 50% | 75 | 25 | 50 | 67% | 7 | 6 | 0 | 0% |
| 10 | පැහැරගෙනයාම | | | | | | | | | 68 | 37 | 30 | 44% |
| 11 | කාමුක සංසර්ගය සඳහා ස්ත්‍රීන් සැපයීම | 15 | 8 | 7 | 47% | 4 | 1 | 3 | 75% | 2 | 2 | 0 | 0% |
| 12 | කාමුක සංසර්ගය සඳහා වෙළඳාම | | | | | | | | | 0 | 0 | 0 | 0% |
| 13 | තැනැත්තන් අතර දැඩි අශිෂ්ට ක්‍රියා | 0 | 0 | 0 | 0% | 0 | 0 | 0 | 0% | 0 | 0 | 0 | 0% |
| 14 | වෙනත් | 0 | 0 | 0 | 0% | 0 | 0 | 0 | 0% | 24 | 13 | 11 | 46% |
| | **එකතුව** | **968** | **476** | **492** | **51%** | **790** | **292** | **498** | **63%** | **775** | **428** | **329** | **42%** |

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යා ලේඛන ඒකකය

❖ **දත්ත විශ්ලේෂණය**

කාන්තාවන්ට එරෙහි බල අපරාධවල මිනීමැරීම් පිළිබඳ මුලින්ම සළකා බැලීමේ දී එම අපරාධවල පැහැදිළි ඉහළ යාමක් 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ දක්නට ඇත. ඒ අනුව 2017 වසරේ සිදු වූ මනුෂ්‍ය ඝාතන 77 ට සාපේක්ෂව 2018 වසරේ මනුෂ්‍ය ඝාතන 111 ක් සිදුව ඇති අතර ප්‍රතිශතයක් ලෙස එය 44% ක ඉහළයාමකි. වගුවට අනුව 2016 වසරේ සිදුව ඇති කාන්තාවන්ට එරෙහි මනුෂ්‍ය ඝාතන සංඛ්‍යාව 109 ක් වූ අතර එය 2017 වසරේ 77 දක්වා 29% කින් පහළ ගොස් තිබුණි. මෙම මනුෂ්‍ය ඝාතනවල විසඳීම් ප්‍රතිශතය ද 2017 වසරේ 45% ක් වූ අතර 2018 වසරේ එය 42% දක්වා පහත බැස තිබේ.

වගුවට අනුව ස්ත්‍රී දූෂණ අපරාධ 2016 වසරේ 350 ක් වාර්තා වී ඇති අතර 2017 වසරේ එය 294 දක්වා 16% කින් පහත වැටී ඇත. 2018 වසරේ 274 දක්වා මෙම අපරාධ තවදුරටත් 7% කින් පහළ ගොස් ඇත. එමෙන්ම අපරාධ විසඳීමේ ප්‍රතිශතය ගත්විට 2016 වසරේ 47% ක්ද 2017 වසරේ 35% ක් ද වූ අතර 2018 වසරේ අපරාධ විසඳීමේ ප්‍රතිශතය 49% දක්වා ඉහළගොස් ඇත.

2016 වසරේ සිට 2018 වසර දක්වා කාන්තාවන්ට එරෙහි බරපතල තුවාල සිදුකිරීම් අපරාධ පිළිබඳ දත්ත විමසීමේ දී එම අපරාධවල ක්‍රමික අඩුවීමක් දැකිය හැකිය. 2016 වසරේ මෙම අපරාධ 320 ක් ද 2017 වසරේ 297 ක් ද වාර්තා වූ අතර 2018 වසරේ 241 ක් වාර්තා විය. ඒ අනුව 2016 වසරට සාපේක්ෂව 2017 වසරේ

කාන්තාවන්ට එරෙහි බරපතල තුවාලකිරීම් අපරාධ 7% කින් අඩු වූ අතර 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ 19% කින් අඩු වී ඇත. මෙම අපරාධවල විසඳීම් ප්‍රතිශතය ගත්විට 2016 වසරේ 53% ක්ද 2017 වසරේ 64% ක් ද වූ අතර 2018 වසරේ විසඳීමේ ප්‍රතිශතය 40% දක්වා අඩු වී ඇත.

කාන්තාවන්ට එරෙහි බරපතල ලිංගික අපයෝජනය නැමැති අපරාධය ගත්විට 2018 වසරේ මෙම අපරාධ 28 ක් වාර්තා වී ඇත. 2016 වසරේ වාර්තා වූ අපරාධ ප්‍රමාණය 48 ක් වූ අතර 2017 වසරේ අපරාධ 33 ක් දක්වා 31% කින් අඩු වී ඇති අතර 2018 වසරේ කාන්තාවන්ට එරෙහි බරපතල ලිංගික අපයෝජන අපරාධ 28 දක්වා 15% කින් අඩු වී ඇත. 2018 වසරේ මෙම අපරාධ විසඳීම් ප්‍රතිශතය 43% කි. එය 2017 වසරේ වාර්තා වූ 55% ක විසඳීම් ප්‍රතිශතයට සාපේක්ෂව පහළ අගයකි.

අපහරණය හා පැහැරගෙනයාමේ අපරාධ කාන්තාවන්ට එරෙහිව 2018 වසරේ 75 ක් වාර්තා වී ඇත. එම සංඛ්‍යාව 2017 වසරේ වාර්තා වූ සංඛ්‍යාවට සමාන වන අතර 2016 වසරේ වාර්තා වූ අපරාධ 103 ට සාපේක්ෂව 27% ක පහළයාමක් ලෙස හඳුනාගත හැකිය. 2017 වසරේ 67% ක් වූ මෙම අපරාධ විසඳීමේ ප්‍රතිශතය 2018 වසරේ 40% ක් දක්වා පහළගොස් ඇත.

වගුවෙහි සමස්ථ දත්ත විශ්ලේෂණයට අනුව 2016 වසරට සාපේක්ෂව 2018 වසරේ කාන්තාවන්ට එරෙහි සමස්ථ අපරාධ 21% කින් අඩු වී ඇති අතර 2017 වසරට සාපේක්ෂව 4% කින් අඩු වී ඇත.

කාන්තාවන්ට එරෙහි සමස්ථ අපරාධ විසඳීමේ ප්‍රතිශතය 2016 වසරේ 51% ක් වූ අතර 2017 වසරේ එය 63% දක්වා ඉහළගොස් තිබුණි. එසේ වුවද 2018 වසරේ කාන්තාවන්ට එරෙහි සමස්ථ අපරාධ විසඳීම 40% දක්වා පහළයාමක් හඳුනාගත හැකිවේ.

## 2.3 ළමයින්ට එරෙහි බල අපරාධ

ශ්‍රී ලංකා පොලීසිය වෙත වාර්තා වන බල අපරාධවලින් ළමයින්ට එරෙහි බල අපරාධ ඛාණ්ඩ 15 ක් යටතේ වර්ගීකරණය කරනු ලැබේ. 2018 වසරේ වාර්තා වූ සමස්ථ බල අපරාධවලින් ළමයින්ට එරෙහි බල අපරාධ ප්‍රතිශතයක් ලෙස 9% කි. මෙහිදී 2016, 2017 සහ 2018 වසරවල ළමයින්ට එරෙහි බල අපරාධ වාර්තා වීම් පිළිබඳ සංසන්දනාත්මකව පහත වගුව මගින් දත්ත ඉදිරිපත් කර ඇත.

වගු අංක 03 **2016 – 2018 දක්වා ළමයින්ට එරෙහි බල අපරාධ වගුව**

| | වරද | | 2016 | | | | 2017 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | වාර්තා වූ | විමර්ශනය වෙමින් පවතින | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා වූ | විමර්ශනය වෙමින් පවතින | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා වූ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය |
| 1 | මිනී මැරුම | | 27 | 10 | 17 | **63%** | 22 | 4 | 18 | **82%** | 19 | 8 | 7 | **42%** |
| 2 | සියපණ හානිකරගැනීමට අනුබල දීම | | 0 | 0 | 0 | | 1 | 1 | 0 | | 0 | 0 | 0 | **0%** |
| 3 | මිනී මැරීමට තැත්කිරීම | | 10 | 6 | 4 | **40%** | 9 | 5 | 4 | **44%** | 4 | 0 | 4 | **0%** |
| 4 | ස්ත්‍රී දූෂණය | වයස අවු 16 ට අඩු කැමැත්ත ඇතිව | 1686 | 699 | 987 | **59%** | 1438 | 446 | 992 | **69%** | 1196 | 631 | 555 | **53%** |
| | | වයස අවු 16 ට අඩු කැමැත්ත නොමැතිව | | | | | | | | | 248 | 112 | 134 | **45%** |
| | | වයස අවු 16 - 18 අතර | | | | | | | | | 72 | 36 | 34 | **50%** |
| | | ව්‍යභිචාරය | | | | | | | | | 24 | 11 | 13 | **46%** |
| 5 | බරපතල තුවාල සිදුකිරීම/ පිහි ආදියෙන් තුවාල සිදුකිරීම | | 41 | 18 | 23 | **56%** | 35 | 13 | 22 | **63%** | 54 | 21 | 33 | **39%** |
| 6 | අස්වාභාවික වැරදි | | 654 | 253 | 401 | **61%** | 556 | 194 | 362 | **65%** | 35 | 2 | 32 | **56%** |
| 7 | බරපතල ලිංගික අපයෝජනය | | | | | | | | | | 688 | 403 | 280 | |
| 8 | අපහරණය | | 788 | 364 | 424 | **54%** | 713 | 202 | 511 | **72%** | 784 | 426 | 346 | **52%** |
| 9 | පැහැරගෙනයාම | | | | | | | | | | 68 | 17 | 47 | |
| 10 | කාමුක සංසර්ගය සඳහා ස්ත්‍රී සැපයීම | | 9 | 6 | 3 | **33%** | 6 | 1 | 5 | **83%** | 8 | 5 | 2 | **63%** |
| 11 | තැනැත්තන් වෙළඳාම | | | | | | | | | | 2 | 0 | 2 | **0%** |
| 12 | ළමයින්ට කෲර ලෙස සැළකීම | | 156 | 56 | 100 | **64%** | 131 | 47 | 84 | **64%** | 104 | 45 | 58 | **41%** |
| 13 | අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම | | | | | | | | | | 30 | 10 | 19 | |
| 14 | පුද්ගලයින් අතර දැඩි අශිෂ්ට ක්‍රියා | | 0 | 0 | 0 | | 0 | 0 | 0 | | 2 | 0 | 2 | **0%** |
| 15 | වෙනත් | | 0 | 0 | 0 | | 0 | 0 | 0 | | 6 | 2 | 4 | **33%** |
| | **එකතුව** | | **3371** | **1412** | **1959** | **58%** | **2911** | **913** | **1998** | **69%** | **3344** | **1729** | **1572** | **52%** |

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යාලේඛන ඒකකය

❖ දත්ත විශ්ලේෂණය

වගුවට අනුව ළමයින්ට එරෙහි මිනීමැරීම් 19 ක් 2018 වසරේ වාර්තා වී ඇති අතර 2016 සහ 2017 වසරවලට සාපේක්ෂව 14% ක අඩුවීමක් පෙන්වයි. එනම් 2016 වසරේ මිනීමැරුම් අපරාධ 27 ක් වාර්තා වූ අතර 2017 වසරේ එය 22 දක්වා 18% කින් අඩු වී තිබුණි. ළමයින්ට එරෙහි මිනීමැරුම් අපරාධවල විසඳීම් ප්‍රගතිය ගත්විට 2018 වසරේ විසඳීමේ ප්‍රතිශතය පහළ ගොස් ඇති බව දැකිය හැක. ඒ අනුව 2016 වසරේ 63% ක් වූ විසඳීම් ප්‍රතිශතය 2017 වසරේ 82% ක් විය. 2018 වසරේ එම විසඳීම් ප්‍රතිශතය 42% කි.

වගුවෙහි දත්ත අනුව ළමයින්ට එරෙහි ස්ත්‍රී දූෂණ අපරාධ සැළකීමේ දී එබඳු අපරාධ 1518 ක් 2018 වසරේ වාර්තා විය. එයින් වයස 16 ට අඩු ළමයාගේ කැමැත්ත ඇතිව සිදු වූ ස්ත්‍රී දූෂණ අපරාධ 1199 ක් වාර්තා වී ඇති අතර වයස 16 ට අඩු ළමයාගේ කැමැත්ත නොමැතිව සිදු වූ ස්ත්‍රී දූෂණ අපරාධ 248 ක් වාර්තා වී ඇත. මීට අමතරව වයස 16 – 18 අතර ළමයින්ට එරෙහි ස්ත්‍රී දූෂණ 71 ක් වාර්තා වී ඇත. 2018 වසරේ ළමයින්ට එරෙහි සමස්ථ ස්ත්‍රී දූෂණ අපරාධවලින් 79% ක් ළමයාගේ කැමැත්ත මත (බොහෝ විට ප්‍රේම සම්බන්ධතා මත) සිදු වූ අපරාධ වේ.

2016 වසරේ වාර්තා වූ ළමයින්ට එරෙහි ස්ත්‍රී දූෂණ අපරාධ ප්‍රමාණය 1686 ක් වූ අතර 2017 වසරේ එම ප්‍රමාණය 1438 දක්වා 15% කින් අඩු වී ඇත. මෙම අපරාධ 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ 5% කින් වැඩි වී ඇත. විසඳීමේ ප්‍රතිශතය ගත්විට ළමයින්ට එරෙහි ස්ත්‍රී දූෂණ අපරාධ විසඳීම් ප්‍රතිශතය 2016 වසරේ 58% ක් වූ අතර 2017 වසරේ එය 69% දක්වා ඉහළ ගොස් ඇත. 2018 වසරේ විසඳීම් ප්‍රතිශතය 51% ක් දක්වා පහත බැසීමක් දක්නට ඇත.

ළමයින්ට එරෙහි බරපතල තුවාල සිදුකිරීම් ගත්විට වගුවෙහි දත්තවලට අනුව 2016 වසරේ වාර්තා වූ අපරාධ ගණන 41 කි. 2017 වසරේ එම ප්‍රමාණය 35 ක් දක්වා 15% කින් අඩු වී ඇති අතර 2018 වසරේ ළමයින්ට එරෙහි බරපතල තුවාල සිදුකිරීම් අපරාධ 54 දක්වා 54% ක වැඩිවීමක් සිදු වී ඇත.

ළමයින්ට එරෙහි බරපතල තුවාල සිදුකිරීම්වල විසඳීම් ප්‍රතිශතය සළකාබැලීමේ දී 2016 වසරේ වාර්තා වූ අපරාධවලින් 56% ක් සඳහා විසඳුම් ලබාදී ඇති අතර 2017 වසරේ එම ප්‍රතිශතය 63% දක්වා වර්ධනය වී ඇත. 2018 වසරේ විසඳීමේ ප්‍රතිශතයේ සැළකිය යුතු පහළයාමක් දැකිය හැකි අතර එම ප්‍රතිශතය 39% කි.

ළමයින්ට එරෙහි බරපතල ලිංගික අපයෝජනය නැමැති වරද සම්බන්ධයෙන් වගුවෙහි දත්ත පරීක්ෂා කිරීමේ දී 2016 වසරේ වාර්තා වූ මෙම අපරාධ 654 ක ප්‍රමාණය 2017 වසරේ 556 දක්වා 15% කින් අඩු වී ඇති බව පැහැදිළි වේ. 2018 වසරේ ළමයින්ට එරෙහි බරපතල ලිංගික අපයෝජන වැරදි 723 ක් වාර්තා වී ඇති අතර එය 2017 වසරට සාපේක්ෂව 30% ඉහළයාමකි.

ළමයින්ට එරෙහි බරපතල ලිංගික අපයෝජන අපරාධවල විසඳීම් ප්‍රතිශතයෙහි ද උච්ඡාවචනයන් දැකිය හැකිය. එනම් 2016 වසරේ 61% ක් වූ විසඳීම් ප්‍රතිශතය 2017 වසරේ 65% දක්වා ඉහළ ගොස් ඇති අතර 2018 වසරේ නැවත 56% දක්වා පහත වැටීමක් හඳුනාගත හැකිය.

2018 වසරෙහි ළමයින්ට එරෙහි අපහරණය හා පැහැරගෙනයාම යන අපරාධ 2016 සහ 2017 යන වසර සමඟ සංසන්දනාත්මකව සලකා බැලීමේ දී පෙර වසර දෙකට සාපේක්ෂව 2018 වසරේ මෙම අපරාධවල ඉහළයාමක් හඳුනාගත හැකිය. වගුවෙහි දත්තවලට අනුව 2016 වසරේ මෙම අපරාධ 788 ක් වාර්තා වී ඇති අතර 2017 වසරේ එම අපරාධ 713 ක් දක්වා 9% කින් පහතවැටී ඇත. 2018 වසරේ ළමයින්ට එරෙහි අපහරණය හා පැහැරගෙනයාමේ අපරාධ 852 ක් වාර්තා වී ඇති අතර එය 2017 වසරට සාපේක්ෂව 19% ක ඉහළයාමකි. එමෙන්ම 2017 වසරේ 72% ක්ව පැවති විසඳීමේ ප්‍රතිශතය 2018 වසරේ 52% ක් දක්වා අඩු වී ඇත.

වගුවෙහි දක්වා ඇති තවත් බරපතල අපරාධයක් ලෙස ළමයින්ට කෲර ලෙස සැළකීම දැක්විය හැකිය. පසුගිය වසර 03 ක දත්ත ආශ්‍රයෙන් සළකා බැලීමේ දී 2016 වසරේ මෙම අපරාධ 156 ක් වාර්තා වී ඇත. 2017 වසරේ එම අපරාධ 131 ක් වාර්තා වූ අතර එය ප්‍රතිශතයක් ලෙස 2016 වසරට වඩා 16% ක අඩුවීමක් ලෙස දැක්විය හැකිය. 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ ළමයින්ට කෲර ලෙස සැළකීමේ අපරාධවල සුළු වැඩිවීමක් සිදුව ඇති අයුරු වගුවට අනුව හඳුනාගත හැකිය.

ළමයින්ට කෲර ලෙස සැලකීමේ අපරාධවල විසඳීම් ප්‍රතිශතය ගත්විට 2016 හා 2017 වසරවල වාර්තා වූ අපරාධවලින් 64% ක් විසඳා තිබූ අතර 2018 වසරේ එම ප්‍රතිශතය 41% දක්වා අඩු වී ඇත.

2018 වසරේ ළමයින්ට එරෙහි සමස්ථ බල අපරාධ පෙර වර්ෂ දෙක හා සැසඳූ විට එහි වෙනස්වීම් රටාව හඳුනාගත හැකිය. ඒ අනුව 2016 වසරෙහි වාර්තා වූ 3371 ක් වූ මෙම අපරාධ 2017 වසරේ 2911 දක්වා 14% කින් අඩුවිය. 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ ළමයින්ට එරෙහි සමස්ථ බල අපරාධ ප්‍රමාණය 3346 දක්වා 15% කින් වර්ධනය වී ඇත.

විසඳීම් ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස ගත්කල ළමයින්ට එරෙහි බල අපරාධවලින් 2016 වසරේ 58% ක් විසඳා තිබූ අතර 2017 වසරේ 69% දක්වා එම ප්‍රතිශතය වර්ධනය වී ඇත. 2018 වසරේ නැවත 52% දක්වා අඩුවීමක් හඳුනාගත හැකිය.

## 2.4 ජනගහණය හා බල අපරාධවලට පොලිස් නිලධාරි අනුපාතය

ශ්‍රී ලංකාවේ වාර්ෂික බල අපරාධ ඉහළ හෝ පහළයාම පිළිබඳ නිගමනවලට පැමිණීම සඳහා ජනගහණයට හා බල අපරාධවලට පවතින පොලිස් නිලධාරි අනුපාතය ඉතා වැදගත් සාධකයක් ලෙස සැලකිය හැකිය. 2014 වසරේ සිට 2018 වසර දක්වා පසුගිය වසර පහක දත්ත වගු අංක 04 මගින් දක්වා ඇත.

වගු අංක 04 **ජනගහණය හා බල අපරාධවලට පොලිස් නිලධාරි අනුපාත පිළිබඳ වගුව**

| වර්ෂය | ජනගහණය දශලක්ෂ ගණනාව ලෙස | සැබෑ පොලිස් සේවක සංඛ්‍යාව | පොලීසිය ජනගහණයට අනුපාතයක් ලෙස | පොලීසිය වර්ග කිලෝමීටරයට අනුපාතයක් ලෙස | පොලීසිය බරපතල අපරාධවලට අනුපාතයක් ලෙස | සමස්ථ බරපතල අපරාධ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 2014 | 20,771 | 84,166 | 0.2125 | 01:00.8 | 01:00.6 | 50,962 |
| 2015 | 20,966 | 86,037 | 0.210416667 | 01:00.8 | 01:00.5 | 40,188 |
| 2016 | 21,203 | 85,245 | 0.213888889 | 01:00.8 | 01:00.4 | 36,937 |
| 2017 | 21,444 | 85,357 | 0.215972222 | 01:00.8 | 01:00.4 | 35,979 |
| 2018 | 21670 | 87075 | 0.213888889 | 01:00.7 | 01:00.4 | 36355 |

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යාලේඛන ඒකකය

වගු අංක 04 ට අනුව පසුගිය වසර 5 තුළ ශ්‍රී ලංකාවේ ජනගහණය මිලියන 20.7 සිට 21.6 දක්වා වර්ධනය වී ඇත. පොලිස් නිලධාරීන් සංඛ්‍යාව එම වසර 5 තුළ 84166 සිට 87075 දක්වා ඉහළ ගොස් ඇත.

ප්‍රතිශතයක් ලෙස 2014 වසරේ සිට 2018 වසර දක්වා ජනගහණය 4% කින් ඉහළ ගොස් ඇති අතර අදාළ කාලසීමාව තුළ පොලිස් නිලධාරි සංඛ්‍යාව 3% කින් ඉහළගොස් ඇත.

2014 වසරේ සිට 2018 වසර වන විට බල අපරාධ 50962 සිට 36355 දක්වා 29% කින් පහළගොස් ඇති අතර බල අපරාධ සඳහා පොලිස් නිලධාරි අනුපාතය 1:0.60 සිට 1:0.41 දක්වා 32% කින් පහළගොස් ඇත.

- ❖ **ශ්‍රී ලංකාවේ ජනගහණයට පොලිස් නිලධාරී අනුපාතය**

එක්සත් ජාතීන්ගේ නිර්දේශයන්ට අනුව ප්‍රමිතිගත ජනගහණයට පොලිස් නිලධාරි අනුපාතය වන්නේ මහජනතාව ලක්ෂයකට පොලිස් නිලධාරීන් 222 කි. එනම් පුද්ගලයින් 450 කට එක් පොලිස් නිලධරයෙකි.

එම නිර්දේශයන්ට අනුව අපට ආසන්න රට වන ඉන්දියාවේ මෙම අනුපාතය ජනගහණයෙන් ලක්‍ෂයකට පොලිස් නිලධාරීන් 150 කි. ආසන්න වශයෙන් පුද්ගලයින් 761 දෙනෙකුට එක් පොලිස් නිලධාරියෙකි. බංග්ලාදේශය ගත්විට ජනගහණය ලක්‍ෂයකට පොලිස් නිලධාරීන් 160 කි. දියුණු රටවල් සැළකූවිට එක්සත් රාජධානියේ මෙම අනුපාතය ජනගහණයෙන් ලක්‍ෂයකට පොලිස් නිලධාරීන් 208 දෙනෙකි. ස්වීඩනයේ ගත්විට ලක්‍ෂයට 195 ක් ලෙස දැක්වේ. හොංකොංහි ජනගහණය ලක්‍ෂයකට පොලිස් නිලධාරීන් 462 කි.

වගුවට අනුව ශ්‍රී ලංකා පොලීසියේ නිලධාරී අනුපාතය සැළකූවිට පුද්ගලයින් 248 කට එක් පොලිස් නිලධාරියෙකු සිටී. ජනගහණය ලක්‍ෂයකට පොලිස් නිලධාරි ප්‍රමාණය ආසන්න වශයෙන් 402 ක් ලෙස ගණනය කළ හැකිය. ඒ අනුව ශ්‍රී ලංකාවේ ජනගහණයට පොලිස් නිලධාරී අනුපාතය දකුණු ආසියාතික රටවලට සාපේක්‍ෂව ඉතා හොඳ මට්ටමක පවතී.

# 03. සුළු අපරාධ

බරපතල බවින් අඩු අපරාධ මේ පරිච්ඡේදය යටතේ විග්‍රහයට බඳුන් වේ. මූලිකවම පුද්ගලයින්ට එරෙහි සුළු අපරාධ සහ දේපලවලට එරෙහි සුළු අපරාධ ලෙස දෙයාකාර වේ. පුද්ගලයින්ට එරෙහි සුළු අපරාධ වර්ග 14 ක් යටතේ වාර්තා කරනු ලබන අතර දේපලවලට එරෙහි සුළු අපරාධ වර්ග 11 ක් යටතේ වාර්තා කෙරේ.

## 3.1 පුද්ගලයින්ට එරෙහි සුළු අපරාධ

2016 වසරේ සිට 2018 වසර දක්වා ශ්‍රී ලංකා පොලීසියට වාර්තා වූ සුළු අපරාධ පිළිබඳ සංඛ්‍යා දත්ත පහත වගුව මගින් ඉදිරිපත් කෙරේ. එහිදී 2016 හා 2017 වසර දෙක තුළ වාර්තා වූ සුළු අපරාධ පිළිබඳ සංඛ්‍යා දත්ත 2018 වසරේ එම දත්ත සමඟ සන්සන්දනය කරමින් විශ්ලේෂණාත්මකව කරුණු ඉදිරිපත් කරනු ලැබේ.

වගු අංක 05

**2016 – 2018 දක්වා පුද්ගලයින්ට එරෙහි සුළු අපරාධ වගුව**

| | වරද | 2016 | | | | 2017 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා වූ | විමර්ශනය වෙමින් පවතින | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා වූ | විමර්ශනය වෙමින් පවතින | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා වූ | විසඳූ | විමර්ශනය වෙමින් පවතින | විසඳීමේ ප්‍රතිශතය |
| 1 | සුළු පහරදීම් | 24870 | 8588 | 16282 | 65% | 22947 | 7315 | 15632 | 68% | 23629 | 15703 | 7924 | 66% |
| 2 | නීති විරෝධි ගබ්සාකිරීම් | 39 | 18 | 21 | 54% | 25 | 15 | 10 | 40% | 69 | 33 | 36 | 48% |
| 3 | සාපරාධි අයුතු ඇතුළුවීම/ නිවසකට අයුතු ඇතුළුවීම | 2178 | 900 | 1278 | 59% | 2066 | 764 | 1302 | 63% | 1803 | 1070 | 733 | 59% |
| 4 | ලිංගික අපයෝජනය | 3764 | 1370 | 2394 | 64% | 3324 | 1229 | 2095 | 63% | 3327 | 1826 | 1470 | 55% |
| 5 | අයුතු අවහිරය/ අයුතු සිරකරතැබීම | 317 | 150 | 167 | 53% | 148 | 42 | 106 | 72% | 204 | 131 | 73 | 64% |
| 6 | නීති විරෝධි කාර්යයක් සඳහා යම් ගොඩනැගිල්ලක් ආදියක සිට අසුවීම | 218 | 89 | 129 | 59% | 20 | 12 | 8 | 40% | 14 | 9 | 5 | 64% |
| 7 | ප්‍රසිද්ධ සොරකු ගැවසීම | 182 | 71 | 111 | 61% | 45 | 11 | 34 | 76% | 108 | 67 | 41 | 62% |
| 8 | ප්‍රසිද්ධ ස්ථානයක කළහකිරීම | 578 | 132 | 446 | 77% | 442 | 105 | 337 | 76% | 381 | 284 | 97 | 75% |
| 9 | සාපරාධි බලහත්කාරය පෑම, සාපරාධි බියගැන්වීම, ඕනෑකමින් කරනු ලබන නින්දාව | 2747 | 1178 | 1569 | 57% | 2199 | 777 | 1422 | 65% | 2461 | 1433 | 1028 | 58% |
| 10 | පොලිස් නිලධාරියෙකුගේ නිත්‍යානුකූල නියෝගයට අකීකරුවීමක් වශයෙන් පැමිණ නොසිටීම | 333 | 130 | 203 | 61% | 198 | 61 | 137 | 69% | 252 | 200 | 52 | 79% |
| 11 | කවර අන්දමක හෝ තුවාල සිදුකිරීමට තැත්කිරීම | 982 | 273 | 709 | 72% | 593 | 164 | 429 | 72% | 590 | 464 | 126 | 79% |
| 12 | ඇඟ බැදීමට ඉල්ලුම් කිරීම | 2092 | 152 | 1940 | 93% | 1667 | 44 | 1623 | 97% | 1841 | 1744 | 95 | 95% |
| 13 | අධිකරණයේ බොරු සැක්ෂිදීම හෝ සෑදීම | 179 | 70 | 109 | 61% | 151 | 28 | 123 | 81% | 252 | 196 | 56 | 78% |
| 14 | ල.ද.නි.ස. යටතේ කරන වෙනත් සුළු වැරදි | 7100 | 1977 | 5123 | 72% | 8399 | 2353 | 6045 | 72% | 6957 | 4671 | 2286 | 67% |
| එකතුව | | 45579 | 15098 | 30481 | 67% | 42224 | 12920 | 29303 | 69% | 41888 | 27831 | 14022 | 66% |

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යා ලේඛන ඒකකය

### ❖ දත්ත විශ්ලේෂණය

වගුවට අනුව වැඩිපුරම වාර්තා වන සුළු අපරාධ වර්ගය වන සුළු පහරදීම් 2016 වසරට වඩා 2017 වසරේ අඩුවීමක් පෙන්නුම් කළ ද 2018 වසරේ නැවත ඉහළයාමක් සිදුව ඇත. ඒ අනුව 2016 වසරේ සුළු පහරදීම් 24870 ක් වාර්තා වූ අතර එම ප්‍රමාණය 2017 වසරේ 22947 දක්වා 8% කින් පහළගොස් ඇත. 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ සුළු පහරදීම් 23629 දක්වා 3% කින් නැවත ඉහළගොස් ඇත. විසඳීම් ප්‍රතිශතය ගත්විට 2017 වසරේ 68% ක්ව පැවති සුළු පහරදීම්වල විසඳීම් ප්‍රතිශතය 2018 වසරේ 66% දක්වා පහළ බැස ඇත.

පොලිසීය වෙත වාර්තා කරන ලද නීතිවිරෝධි ගබ්සා වැරදි ඉතා අඩුමට්ටමක පවතින බව දත්ත අනුව පෙනී යයි. 2016 වසරේ නීතිවිරෝධි ගබ්සාකිරීම් 39 ක් වාර්තා වී ඇති අතර 2017 වසරේ එම සංඛ්‍යාව 25 දක්වා 36% කින් අඩුව ඇත. 2018 වසරේ නැවත 69 දක්වා 176% කින් නීතිවිරෝධි ගබ්සාව පිළිබඳ වැරදි ඉහළයාමක් දැකියහැකිය.

සාපරාධි අයුතු ඇතුළුවීමේ වැරදි 2178 ක් 2016 වසරේ වාර්තා වූ අතර 2017 වසර වන විට එය 2066 දක්වා 5% කින් අඩු වී ඇත. 2018 වසරේ වාර්තා වූ වැරදි ප්‍රමාණය 1803 ක් වූ අතර එය 2017 වසරට සාපේක්ෂව 13% ක පහළයාමක් ලෙස දැක්විය හැකිය. 2016 වසරේ මෙම වැරදිවල විසඳීම් ප්‍රතිශතය 59% ක් වූ අතර 2017 වසරේ එය 63% ක් දක්වා ඉහළගොස් ඇත. 2018 වසරේ විසඳීම් ප්‍රතිශතය 59% කි.

ලිංගික අඩන්තේට්ටම් කිරීම සළකාබැලූ විට වගුවෙහි දත්ත අනුව 2016 වසරට වඩා 2017 වසරේ මෙම වැරදි 3764 සිට 3324 දක්වා 12% ක අඩුවීමක් පෙන්නුම් කර ඇත. 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ මෙම වැරදි 3327 දක්වා ඉතා සුළු ඉහළයාමක් පෙන්නුම් කළ ද එය 2016 වසරට වඩා තවදුරටත් පහළ අගයක් ලෙස දැක්විය හැකිය. කෙසේ වුවද 2017 වසරේ 63% ක්ව පැවති විසඳීම් ප්‍රතිශතය 2018 වසරේ 54% දක්වා පහළ ගොස් ඇත.

ප්‍රසිද්ධ ස්ථානයක කළහ කිරිමේ වරද ගත්විට වගුවට අනුව 2016 වසරේ වැරදි 578 ක් වාර්තා වූ අතර 2017 වසරේ වැරදි 442 දක්වා 23% ක අඩුවීමක් ද 2018 වසරේ එම වැරදි 381 ක් දක්වා 14% ක අඩුවීමක් ද හඳුනාගත හැකිය. විසඳීම් ප්‍රතිශතය 2016, 2017 සහ 2018 යන වසරවල පිළිවෙලින් 77% ක් 76% ක් සහ 74% ක් ලෙස දැක්විය හැකිය.

වගුවෙහි දත්ත අනුව සාපරාධි බලහත්කාරයපෑම යන වරද ගත්විට 2016 වසරේ වාර්තා වූ වැරදි ප්‍රමාණය 2747 කි. එම වැරදි 2017 වසරේ 2199 දක්වා 20% කින් පහළගොස් ඇති අතර 2018 වසරේ වාර්තා වූ වැරදි ප්‍රමාණය 2461 කි. ප්‍රතිශතයක් ලෙස 2017 වසරේ වාර්තා වූ වැරදි ප්‍රමාණයට වඩා 12% ක ඉහළයාමක් 2018 වසරේ හඳුනාගත හැකිය.

සාපරාධි බලහත්කාරයපෑම වරදෙහි විසඳීම් ප්‍රතිශතය 2016 වසරේ 57% කි. 2017 වසරේ එම ප්‍රතිශතය 65% ක් වූ අතර 2018 වසරේ විසඳීම් ප්‍රතිශතය 58% ක් දක්වා සුළු පහළයාමක් හඳුනාගත හැකිය.

පුද්ගලයින්ට එරෙහි සුළු වැරදි සම්බන්ධ දත්ත පරීක්ෂා කිරීමේ දී ඇතැම් වැරදි වාර්තා වීම 2017 ට සාපේක්ෂව 2018 වසරේ වැඩිවීමක් පෙන්නුම් කළ ද 2016 වසරට සාපේක්ෂව තවදුරටත් ඉතා අඩු මට්ටමක පවතින බව හඳුනාගත හැකිය.

පුද්ගලයින්ට එරෙහි සමස්ථ සුළු අපරාධ ප්‍රමාණය 2017 වසරෙහි වාර්තා වූ 42224 ට වඩා 2018 වසරෙහි 41888 දක්වා වැරදි 7 කින් අඩු වී ඇති අතර විසඳීම් ප්‍රතිශතය 2017 වසරෙහි වාර්තා වූ 69% සිට 2018 වසරේ 66% දක්වා පහළගොස් ඇත.

## 3.2 දේපළවලට එරෙහි සුළු අපරාධ

2016 වසරේ සිට 2018 වසර දක්වා වගු අංක 06 මගින් දක්වා ඇති පරිදි කරුණු 11 ක් යටතේ දේපළවලට එරෙහි සුළු අපරාධ පිළිබඳ දත්ත ඇතුළත් කර ඇත

වගු අංක 06

**2016 – 2018 දක්වා දේපළවලට එරෙහි සුළු අපරාධ වගුව**

| | වරද | 2016 | | | | 2017 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා වූ | විමර්ශනය වෙමින් පවතින | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා වූ | විමර්ශනය වෙමින් පවතින | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා වූ | විමර්ශනය වෙමින් පවතින | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය |
| 1 | ගෙවල් බිඳීමේ උපකරණ නීති විරෝධි ලෙස තම ස්වාමීත්වයේ තබාගැනීම | 185 | 21 | 164 | 89% | 130 | 37 | 93 | 72% | 87 | 15 | 72 | 83% |
| 2 | ආගම්වලට / පූජනීය ස්ථාන/ පූජා භාණ්වලට සිදුකරන හානි පිළිබඳ වැරදි | 37 | 14 | 23 | 62% | 49 | 27 | 22 | 45% | 32 | 19 | 13 | 41% |
| 3 | කිරුම් හා මිනුම් පිළිබඳ වැරදි | 99 | 0 | 99 | 100% | 28 | 0 | 28 | 100% | 32 | 11 | 21 | 66% |
| 4 | විකිණීමට හෝ මහජන ප්‍රදර්ශනය සඳහා අසභ්‍ය පොත් ආදිය ළඟ තබාගැනීම, අසභ්‍ය සගරා, චායාරූප, පොත්පත් විකිණීම ආදිය | 112 | 5 | 107 | 96% | 84 | 16 | 68 | 81% | 49 | 4 | 45 | 92% |
| 5 | සොරකම් කිරීමට හෝ මංකොල්ල කෑමට තැත්කිරීම | 954 | 479 | 475 | 50% | 1183 | 519 | 664 | 56% | 798 | 344 | 454 | 57% |
| 6 | අනර්ථය රුපියල් 25000 ට අඩු | 3488 | 1564 | 1924 | 55% | 2863 | 1247 | 1616 | 56% | 2980 | 1476 | 1504 | 50% |
| 7 | සොරකම රුපියල් 25000 ට අඩු | 17181 | 10061 | 7120 | 41% | 17540 | 9259 | 8281 | 47% | 16817 | 10085 | 6727 | 40% |
| 8 | සාපරාධි විශ්වාසය කඩකිරීම/ වංචාව/ සාවද්‍ය පරිහරණය රුපියල් 100000 ට අඩු | 8079 | 4253 | 3826 | 47% | 8022 | 4077 | 3945 | 49% | 8047 | 4361 | 3683 | 46% |
| 9 | මහජන පීඩා සම්බන්ධයෙන් පැමිණිලි කිරීම | 360 | 58 | 302 | 84% | 171 | 36 | 135 | 79% | 158 | 47 | 111 | 70% |
| 10 | අංක 44 දරන ප්‍රාථමික අධිකරණ පනතේ වගන්ති 66 යටතේ කරන ලද ඉල්ලීම | 562 | 78 | 484 | 86% | 670 | 167 | 503 | 75% | 437 | 65 | 372 | 85% |
| 11 | වෙනත් | 2292 | 847 | 1445 | 63% | 2141 | 832 | 1309 | 61% | 1978 | 833 | 1141 | 58% |
| **එකතුව** | | **33349** | **17380** | **15969** | **48%** | **32881** | **16217** | **16664** | **51%** | **31415** | **17260** | **14143** | **45%** |

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යාලේඛන ඒකකය

### ❖ දත්ත විශ්ලේෂණය

පසුගිය වසර තුනක දත්ත අනුව පෙනී යන කරුණක් නම් දේපළවලට එරෙහි සුළු අපරාධ සමස්ථයක් ලෙස අඩුවී ඇති බවයි. උදාහරණ ලෙස ගෙවල් බිඳීමේ උපකරණ ළඟ තබාගැනීමේ වැරදි 2016 වසරේ 185 ක් වාර්තා වූ අතර 2017 වසරේ එය 130 දක්වා ද 30% කින් ද 2018 වසරේ තවදුරටත් පහළගොස් 87 දක්වා 33% කින් ද අඩුවී ඇත. මෙම සුළු අපරාධවල විසඳීම් ප්‍රතිශ.ය 2016 වසරේ 89% ක් වූ අතර 2017 වසරේ 71% කි. 2018 වසරේ විසඳීම් ප්‍රතිශතය 83% දක්වා ඉහළගොස් ඇත.

ආගමික සහ පූජනීය ස්ථාන / භාණ්ඩවලට සිදුකරන හානි 2016 වසරේ 37 ක් වාර්තා වූ අතර 2017 වසරේ 49 ක් දක්වා 32% ක ඉහළයාමක් දක්නට ලැබුණි. 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ එම වැරදි 32 දක්වා 35% කින් පහළ ගොස් ඇත. 2016 වසරේ විසඳීම් ප්‍රතිශතය 62% ක් වූ අතර 2017 වසරේ එම ප්‍රතිශතය 45% කි. 2018 වසරේ විසඳීම් ප්‍රතිශතය 41% දක්වා තවදුරටත් පහළගොස් ඇත.

කිරුම් මිණුම් පිළිබඳ වැරදි 2017 වසරේ 28 ක් වාර්තා වූ අතර 2018 වසරේ එය 32 දක්වා 14% කින් ඉහළ ගොස් ඇත. එසේ වුවද 2016 වසරේ මෙම වැරදි 99 ක් වාර්තා වූ අතර ඊට සාපේක්ෂව 2018 වසරේ කිරුම් මිණුම් වැරදි 68% කින් අඩු වී ඇත.

කිරුම් මිණුම් පිළිබඳ වැරදිවල විසඳීම් ප්‍රතිශතය ගත්විට 2016 සහ 2017 වසරවල 100% කි. 2018 වසරේ විසඳීම් ප්‍රතිශතය 66% දක්වා පහත වැටී ඇත.

අසභ්‍ය ප්‍රකාශන ප්‍රදර්ශනය, අලෙවිය හෝ ඒ සඳහා ළඟතබා ගැනීම ගත්විට දිගින් දිගටම අඩුවීමක් පෙන්නුම් කරයි. 2016 වසරේ වැරදි 112 ක් ද 2017 වසරේ වැරදි 84 ක් ද වාර්තා වූ අතර 2018 වසරේ දී 49 ක් දක්වා 42% කින් 2017 වසරට සාපේක්ෂව මෙම වැරදි අඩුවී තිබේ. අසභ්‍ය ප්‍රකාශන පිළිබඳ වරදෙහි විසඳීම්

ප්‍රතිශතය ගත්විට 2016, 2017 සහ 2018 වසරවල පිළිවෙලින් 95% ක් 81% ක් සහ 92% ක් ලෙස දැක්විය හැකිය.

වගුවට අනුව සොරකමට හෝ කොල්ලකෑමට තැත්කිරීමේ වැරදි 954 ක් 2016 වසරේ වාර්තා වී ඇති අතර 2017 වසරේ 1183 දක්වා 74% කින් ඉහළගොස් ඇත. ඊට සාපේක්ෂව 2018 වසරේ මෙම වැරදි 798 දක්වා 32% කින් පහත වැටී ඇත.

සොරකමට හෝ කොල්ලකෑමට තැත්කිරීමේ වැරදි සම්බන්ධ විසඳීමේ ප්‍රතිශතය 2016 වසරේ 50% ක් වූ අතර 2017 සහ 2018 වසරවල පිළිවෙලින් 56% ක් සහ 57% ක් ලෙස දැක්විය හැකිය.

රු: 25000 ට අඩු අනර්ථය නැමැති වැරදි 2980 ක් 2018 වසරේ වාර්තා වි ඇති අතර එය 2017 වසරේ වාර්තා වූ වැරදි 2863 ට වඩා 4% ක වැඩිවීමකි. එසේ වුවද 2016 වසරේ වාර්තා වූ අනර්ථය පිළිබඳ වැරදි 3488 ට වඩා 14% ක අඩුවීමක් 2018 වසරේ දැකිය හැකිය.

රු: 25000 ට අඩු අනර්ථය නම් වරද සම්බන්ධ විසඳීම් ප්‍රගතිය සැළකීමේදී 2016 වසරේ විසඳීම් මට්ටම ප්‍රතිශතයක් ලෙස 55% කි. 2017 වසරේ මෙම වරදෙහි විසඳීම් ප්‍රතිශතය 56% ක් වූ අතර 2018 වසරේ විසඳීම් 50% ක ප්‍රතිශතයක් දක්නට ලැබේ.

රුපියල් 25000 ට අඩු සොරකම් 17181 ක් 2016 වසරේ වාර්තා වී ඇති අතර 2017 වසරේ එය 17540 දක්වා 2% කින් ඉහළ ගොස් ඇත. 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ මෙම වැරදි 16817 දක්වා 4% කින් පහත වැටී ඇත.

25000 ට අඩු සොරකම් සම්බන්ධ විසඳීම් ප්‍රතිශතය ගත්විට 2016 වසරේ 41% ක් වූ අතර 2017 වසරේ විසඳීම් 47% ක් දක්වා ඉහළගොස් ඇත. 2018 වසර වන විට රුපියල් 25000 ට අඩු සොරකම් පිළිබඳ විසඳීම් ප්‍රතිශතය 40% දක්වා අඩුවීමක් දැකිය හැකිය.

රු: 100000 ට අඩු සාපරාධි විශ්වාසය කඩකිරීම/ වංචාව/ සාවද්‍ය පරිහරණය යන වරද සම්බන්ධයෙන් වගුවෙහි ඇතුළත් දත්තවලට අනුව 2016 වසරේ වැරදි 8079 ක් වාර්තා වී ඇති අතර 2017 වසරේ 8022 දක්වා 1% කට ආසන්න සුළු අඩුවීමක් දැකිය හැකිය. 2018 වසරේ නැවත මෙම වැරදි 8047 සුළු වැඩිවීමක් හඳුනාගත හැකිය. රපියල් ලක්ෂයට අඩු සාපරාධි විශ්වාසය කඩකිරීමේ වරදෙහි විසඳීම් ප්‍රතිශතය ගත්විට 2016 වසරේ 47% ක් ද 2017 වසරේ 49% ක් ද වූ අතර 2018 වසරේ විසඳීම් ප්‍රතිශතය 46% කි.

වගුවෙහි සඳහන් මහජන පීඩා සහ 66 වගන්තිය යටතේ ගැනෙන වැරදිවල ද පැහැදිළි අඩුවීමක් 2018 වසරේ හඳුනාගත හැකි අතර විසඳීම් ප්‍රතිශතය ද ඉහළ මට්ටමක පවතී. ඒ අනුව මහජන පීඩා සම්බන්ධ පැමිණිලි 360 ක් 2016 වසරේ වාර්තා වූ අතර 2017 වසරෙහි එය 171 දක්වා 53% කින් පහළගොස් ඇත. 2018 වසරේ මහජන පීඩා පැමිණිලි 158 ක් වාර්තා වී ඇති අතර එය 2017 වසරට සාපේක්ෂව 8% ක අඩුවීමකි. මෙම පැමිණිලිවල විසඳීම් ප්‍රතිශතය ගත්විට 2016 වසරේ 84% ක් ද 2017 වසරේ 79% ක් ද වූ අතර 2018 වසරේ 70% ක් ද ලෙස හඳුනාගත හැකිය.

66 වගන්තිය එනම් ඉඩම් ආරවුල් සම්බන්ධ සාමය කඩවීම් පිළිබඳ පැමිණිලි ගත්විට 2016 වසරේ පැමිණිලි 562 ක් වාර්තා වූ අතර ඊට සාපේක්ෂව 2017 වසරේ පැමිණිලි 670 ක් දක්වා 19% කින් ඉහළගොස් ඇත. 2018 වසරේ මේ සම්බන්ධ පැමිණිලි 437 ක් වාර්තා වී ඇති අතර එය 2017 වසරට සාපේක්ෂව 35% ක අඩුවීමක් ලෙස දැක්විය හැකිය. 66 වගන්තිය යටතේ ලද පැමිණිලිවල විසඳීම් ප්‍රතිශතය 2016 වසරේ 86% ක් වූ අතර 2017 වසරේ 75% කි. 2018 වසරේ එම ප්‍රතිශතය 85% ක් දක්වා වර්ධනය වී ඇත.

දේපළවලට එරෙහි සමස්ථ වැරදි ප්‍රමාණය ගත්විට 2017 වසරට වඩා 2018 වසරේ 4% ක අඩුවීමක් සිදුව ඇති අතර විසඳීම් ප්‍රතිශතය 50% සිට 45% දක්වා පහළයාමක් ද හඳුනාගත හැකිය.

වගුවෙහි ඇතුළත් දත්ත විශ්ලේෂණය මගින් පෙනී යන විශේෂිත කරුණක් වනනේ මූල්‍යමය වැරදි (වගුවෙහි අනු අංක 6, 7, 8 ) සම්බන්ධ විසඳීම් ප්‍රතිශතය අඩු මට්ටමක පැවතීමයි. මේ සම්බන්ධයෙන් අදාළ සියලුම අංශවල විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

# 04. විවිධ පැමිණිලි

ශ්‍රී ලංකා පොලීසිය වෙත වාර්තා වන පැමිණිලි අතුරින් බහුතර සංඛ්‍යාවක් මෙම විවිධ පැමිණිලි ගණයට අයත් වේ. මේ යටතේ ලැබෙන පැමිණිලි ක්ෂේත්‍ර 16 කට වර්ගීකරණය කර ඇති අතර වගු අංක 07 මගින් 2016, 2017 සහ 2018 යන වර්ෂවල විවිධ පැමිණිලි සම්බන්ධයෙන් සංසන්දනාත්මකව කරුණු ඉදිරිපත් කර ඇත.

වගු අංක 07

**2016 – 2018 දක්වා විවිධ පැමිණිලි වගුව**

| වාර්තා කරන ලද පැමිණිල්ලේ ස්වභාවය | | 2016 | | | | 2017 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා වූ | විමර්ශනය වෙමින් පවතින | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා වූ | විමර්ශනය වෙමින් පවතින | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා වූ | විමර්ශනය වෙමින් පවතින | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය |
| 1 | පහරදීම | 205407 | 43 | 205364 | 100% | 199622 | 10 | 199612 | 100% | 190802 | 8150 | 190802 | 100% |
| 2 | බැන තර්ජනය කිරීම | 203331 | 36 | 203295 | 100% | 199649 | 10 | 199639 | 100% | 188865 | 5453 | 188865 | 100% |
| 3 | පවුල් ආරවුල් | 114500 | 9 | 114491 | 100% | 111775 | 0 | 111775 | 100% | 103971 | 3640 | 103971 | 100% |
| 4 | පුරුෂයාගේ/ භාර්යාවගෙන් හිරිහැරවීම හෝ නොසැළකීම ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය | 25387 | 0 | 25387 | 100% | 22899 | 0 | 22899 | 100% | 22320 | 772 | 22320 | 100% |
| 5 | අනියම් සබඳතා නිසා ඇති වන ආරවුල් | 11011 | 5 | 11006 | 100% | 10056 | 0 | 10056 | 100% | 9661 | 393 | 9661 | 100% |
| 6 | ඉඩම් ආරවුල් | 96217 | 43 | 96174 | 100% | 95046 | 0 | 95046 | 100% | 85817 | 2814 | 85817 | 100% |
| 7 | සාමය කඩවීමේ ගැටළු | 2717 | 0 | 2717 | 100% | 1975 | 0 | 1975 | 100% | 2503 | 146 | 2503 | 100% |
| 8 | විශ්වාසය/ පොරොන්දු කඩකිරීම | 15043 | 1 | 15042 | 100% | 12268 | 4 | 12264 | 100% | 10580 | 929 | 10580 | 100% |
| 9 | මුදල් හා භාණ්ඩ පිළිබඳ ආරවුල් | 111213 | 96 | 111117 | 100% | 116314 | 11 | 116303 | 100% | 115352 | 7633 | 115352 | 100% |
| 10 | දෙමාපියන්ට නොසැළකීම/ හිරිහැරවීම | 8410 | 2 | 8408 | 100% | 8243 | 0 | 8243 | 100% | 7414 | 225 | 7414 | 100% |
| 11 | කුලී නිවැසියන් හා අයිතිකරු අතර ආරවුල් | 8443 | 1 | 8442 | 100% | 7891 | 0 | 7891 | 100% | 7549 | 393 | 7549 | 100% |
| 12 | සේවකයා හා ස්වාමියා අතර ඇති ආරවුල් | 4108 | 0 | 4108 | 100% | 3415 | 0 | 3415 | 100% | 3540 | 195 | 3540 | 100% |
| 13 | අලාභහානි සිදුවීම පිළිබඳව ගැටළු | 19629 | 7 | 19622 | 100% | 18146 | 0 | 18146 | 100% | 16457 | 800 | 16457 | 100% |
| 14 | මානසික පීඩාවන් ඇතිකිරීම සම්බන්ධ ගැටළු | 7928 | 6 | 7922 | 100% | 7700 | 1 | 7699 | 100% | 7283 | 278 | 7283 | 100% |
| 15 | අතුරුදහන් වීම පිළිබඳ පැමිණිලි | 6588 | 0 | 6588 | 100% | 5452 | 0 | 5452 | 100% | 3860 | 806 | 3860 | 100% |
| 16 | වෙනත් පැමිණිලි | 199418 | 159 | 199259 | 100% | 208636 | 4 | 208632 | 100% | 195643 | 9467 | 195643 | 100% |
| **එකතුව** | | **1039350** | **408** | **1038942** | **100%** | **1029087** | **40** | **1029047** | **100%** | **971617** | **42094** | **971617** | **100%** |

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යාලේඛන ඒකකය

❖ **දත්ත විශ්ලේෂණය**

පසුගිය වසර 3 ක විවිධ පැමිණිලි පිළිබඳ සලකාබැලීමේ දී 2016 වසරේ සිට 2018 වසර දක්වා විවිධ පැමිණිලිවල අඩුවීමක් පෙන්නුම් කෙරේ. ඒ අනුව 2016 වසරේ පැමිණිලි 1039350 ක් ද 2017 වසරේ 1029087 ක් ද වාර්තා වූ අතර 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ එම ප්‍රමාණය 1% ක අඩුවීමක් පෙන්නුම් කරමින් පැමිණිලි 1013661 ක් වාර්තා වී ඇත.

විමර්ශන ප්‍රගතිය ගත්විට 2016 සහ 2017 වසරවල විසඳීම් 99% ඉක්මවා තිබූ අතර 2018 වසරේ විසඳීම් ප්‍රතිශතය 96% දක්වා පහළ ගොස් ඇත.

විවිධ පැමිණිලිවල වැඩි වශයෙන්ම වාර්තා වන පැමිණිලි වර්ගය වන්නේ පහරදීමය. වගුවට අනුව එම පැමිණිලිවල අඩුවීමක් පසුගිය වසර තුන තුළ හඳුනාගත හැකිය. 2016 වසරේ පහරදීම් සම්බන්ධ පැමිණිලි 205407 ක් වාර්තා වී ඇති අතර 2017 වසරේ එය 199622 දක්වා 3% කින් අඩු වී ඇත. 2018 වසරේ මෙම වැරදිවල අඩුවීම 2017 වසරට සාපේක්ෂව 0.3% කි. 2018 වසර තුළ වාර්තා වූ පහරදීම් පිළිබඳ පැමිණිලි 198902 න් 190802 ක එනම් 96% විමර්ශන අවසන් කර විසඳුම් ලබාදී ඇත.

බැණ තර්ජනය කිරීම් පසුගිය වසර තුන ඔස්සේ ක්‍රමානුකූලව අඩුවීමක් දැකිය හැකිය. වගුවට අනුව 2016 වසරට වඩා 2017 වසරේ මෙම පැමිණිලි 3682 කින් එනම් 2% කින් අඩුවී ඇති අතර 2018 වසරේ බැණ තර්ජනය කිරීම් පැමිණිලි 2017 වසරට වඩා 5331 කින් එනම් 3% කින් පහළ ගොස් ඇත. බැණ තර්ජනය

කිරීම්වල 2016 සහ 2017 වසරවල විසඳීම් ප්‍රතිශතය ගත්විට 99% ඉක්මවා ඇති අතර 2018 වසරේ 96% දක්වා අඩුවීමක් හඳුනාගත හැකිය.

පවුල් ආරවුල්වලට අදාළ පැමිණිලි ද 2016 සහ 2017 වසරවලට සාපේක්‍ෂව 2018 වසරේ අඩුවීමක් දැකිය හැකිය. (පවුල් ආරවුල් පිළිබඳ ඊළඟ අනුඡේදය යටතේ කරුණු ඉදිරිපත් කර ඇත.)

ඉතා දැඩිලෙස සමාජගත වී ඇති මෙන්ම බොහෝ ආරවුල් සඳහා මූලබීජයක් ලෙස සැළකිය හැකි ඉඩම් ආරවුල් පිළිබඳ අවධානය යොමු කිරීමේ දී ඒ පිළිබඳ පැමිණිලි ද සැළකිය යුතු අඩුවීමක් දැකියහැකිය. 2016 වසරට සාපේක්‍ෂව 2017 වසරේ ඉඩම් ආරවුල් 96217 සිට 95046 දක්වා 1171 කින් එනම් 1% කින් අඩුවී ඇති අතර 2018 වසරේ මේ සම්බන්ධ පැමිණිලි 6415 කින් එනම් 2017 වසරට වඩා 7% කින් අඩුවී ඇත. එමෙන්ම ඉඩම් නඩුවල විසඳීම් ප්‍රගතිය ගත්විට 2016, 2017 සහ 2018 වර්ෂවල පිළිවෙලින් 99.9% ක්, 100% ක් සහ 97% ක් ලෙස හඳුනාගත හැකිය.

සාමය කඩවීම් සම්බන්ධ පැමිණිලි ද වගුවට අනුව 2016 වසරේ 2717 ක් වාර්තා වී ඇති අතර 2017 වසරේ පැමිණිලි 1975 ක් දක්වා 27% කින් අඩු වී ඇත. 2018 වසරේ සාමය කඩකිරීම් සම්බන්ධ පැමිණිලි 34% කින් නැවත ඉහළගොස් ඇත. 2017 වසරේ මෙම පැමිණිලිවල විසඳීම් ප්‍රතිශතය 100% ක අගයක් ගෙන ඇති අතර 2018 වසරේ විසඳීම් ප්‍රතිශතය 94% කි.

විවිධ පැමිණිලිවල අඩංගු විශ්වාසය සහ පොරොන්දු කඩකිරීම් පිළිබඳව පැමිණිලි සළකාබැලීමේ දී පසුගිය අවුරුදු තුන තුළ සැළකිය යුතු අඩුවීමක් දැකියහැකිය. 2016 වසරේ මෙම පොරොන්දු කඩකිරීම් සම්බන්ධ පැමිණිලි 15043 ක් වාර්තා වූ අතර 2017 වසරේ මෙම පැමිණිලි 12268 දක්වා 18% කින් පහළ ගොස් ඇත. 2018 වසරේ වාර්තා කළ පැමිණිලි සංඛ්‍යාව 11509 ක් වූ අතර එය 2017 වසරට සාපේක්‍ෂව 6% ක අඩුවීමක් වන අතර 2016 වසරට සාපේක්‍ෂව 23% ක පහළයාමකි.

මෙම විශ්වාසය හා පොරොන්දු කඩකිරීම් පැමිණිලි සම්බන්ධයෙන් විසඳීම් ප්‍රගතිය ගත්විට 2016 සහ 2017 යන වසරවල 99% ඉක්මවා ඇති අතර 2018 වසරේ විසඳීම් ප්‍රතිශතය 92% කි.

වගුවෙහි දත්ත අනුව මුදල් සහ භාණ්ඩ පිළිබඳ ආරවුල්වල සැළකිය යුතු ඉහළයාමක් පසුගිය වසර තුන තුළ හඳුනාගත හැකිය. පහරදීම්, බැනතර්ජනය කිරීම් සහ පවුල් ආරවුල් සම්බන්ධ පැමිණිලිවලට පසුව වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇති මෙම මුදල් සහ භාණ්ඩ ආරවුල් පිළිබඳ දත්ත විමසා බැලීමේ දී 2016 වසරේ මෙබඳු පැමිණිලි 111213 ක් ලැබී ඇත. 2017 වසරේ ලැබුණු පැමිණිලි සංඛ්‍යාව 116314 කි. එනම් 4% කින් මෙබඳු පැමිණිලි 2016 වසරට සාපේක්‍ෂව ඉහළගොස් ඇත. 2018 වසරේ මෙම මුදල් සහ භාණ්ඩ පිළබඳ ආරවුල්වල ඉහළයාම 2017 වසරට සාපේක්‍ෂව 6% ක ඉහළයාමකි.

මෙම මුදල් සහ භාණ්ඩ පිළිබඳ ආරවුල්වල විසඳීම් ප්‍රතිශතය ගත්විට 2016 සහ 2017 වසරවල 99.9% ඉක්මවා ඇති අතර 2018 වසරේ එම ප්‍රතිශතය 94% ක් ලෙස දැක්වේ.

දෙමව්පියන්ට නොසැලකීම හෝ හිරිහැරකිරීම සම්බන්ධයෙන් ලැබී ඇති පැමිණිලිවල යම් අඩුවීමක් පසුගිය වසර තුන තුළ දැකිය හැකිවීම විශේෂ කරුණක් ලෙස සැළකිය හැකිය. 2016 වසරේ මේ පිළිබඳ පැමිණිලි 8410 ක් වාර්තා වූ අතර එය 8243 ක් දක්වා 2017 වසරේ 2% කින් අඩු වී ඇත. 2018 වසරේ මෙම පැමිණිලිවල අඩුවීම 2017 වසරට සාපේක්‍ෂව ප්‍රතිශතයක් ලෙස 7% කි. මෙම ආරවුල් සම්බන්ධ විසඳීම් ප්‍රතිශතය 2016 සහ 2017 වසරවල 99% ඉක්ම වූ අතර 2018 වසරේ විසඳීම් ප්‍රතිශතය 97% කි.

සමස්ථයක් ලෙස විවිධ පැමිණිලිවල ඇතුළත් බහුතරයක් පැමිණිලිවල පහළයාමක් අදාළ වසර තුන තුළ දැකිය හැකි අතර 2018 වසරේ විවිධ පැමිණිලි සම්බන්ධ විසඳීම්වල 2016 සහ 2017 වසරවලට සාපේක්‍ෂව පහළයාමක් දැකිය හැකි බව ද සඳහන් කළ යුතුය.

## 4.1 පවුල් ආරවුල්

විවිධ පැමිණිලි අතර කැපී පෙනෙන ආරවුල් ලෙස පවුල් ආරවුල් හඳුනාගත හැකිය. මේ යටතට පවුල් ආරවුල්, අනියම් සබඳතා සහ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය මගින් ඇතිවන ආරවුල් ද ඇතුළත් වේ. වගු අංක 08 ට අනුව පවුල් ආරවුල් පැමිණිලි 2018 වසරේ 107611 ක් ද ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය හේතුවෙන් ඇතිවන ආරවුල් 23092 ක් ද අනියම් සබඳතා නිසා ඇතිවන ආරවුල් 10054 ක් ද ලෙස සමස්ථ පවුල් ආරවුල් පැමිණිලි 140757 ක් වාර්තා වී ඇත.

වගු අංක 08

**2016 – 2018 දක්වා පවුල් ආරවුල් වගුව**

| වාර්තා කරන ලද පැමිණිල්ලේ ස්වභාවය | | 2016 | | | | 2017 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා වූ සංඛ්‍යාව | විමර්ශනය වෙමින් පවතින සංඛ්‍යාව | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා වූ සංඛ්‍යාව | විමර්ශනය වෙමින් පවතින සංඛ්‍යාව | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා වූ සංඛ්‍යාව | විමර්ශනය වෙමින් පවතින සංඛ්‍යාව | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය |
| 1 | පවුල් ආරාවුල් | 114500 | 9 | 114491 | 100% | 111775 | 0 | 111775 | 100% | 107611 | 3634 | 87070 | 81% |
| 2 | පුරුෂයාගෙන්/ භාර්යාවගෙන් හිරිහැරවීම හෝ නොසැළකීම ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය | 25387 | 0 | 25387 | 100% | 22899 | 0 | 22899 | 100% | 23092 | 772 | 18270 | 79% |
| 3 | අනියම් සබඳතා නිසා ඇතිවන ආරවුල් | 11011 | 5 | 11006 | 100% | 10056 | 0 | 10056 | 100% | 10054 | 392 | 7804 | 78% |
| **එකතුව** | | **150898** | **14** | **150884** | **100%** | **144730** | **0** | **144730** | **100%** | **140757** | **4798** | **113144** | **80%** |

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යාලේඛන ඒකකය

❖ **දත්ත විශ්ලේෂණය**

වගු අංක 08 ට අනුව 2018 වසරේ සමස්ථ පවුල් ආරවුල් පැමිණිලි සංඛ්‍යාව 140,757 කි. එය 2018 වසරේ පොලීසිය වෙත වාර්තා වූ සමස්ථ විවිධ පැමිණිලි සංඛ්‍යාවෙන් 14% කි. වගුවෙහි සඳහන් එක් එක් ආරවුල් වර්ගය ගත්විට සමස්ථයක් ලෙස 2018 වසරේ එම පැමිණිලිවල අඩුවීමක් 2016 සහ 2017 වසරවලට සාපේක්ෂව දැකිය හැකිය.

වගුවෙහි සඳහන් පරිදි පවුල් ආරවුල් යටතේ ලැබී ඇති පැමිණිලි 2016 වසරේ සිට 2018 වසර දක්වා අඩුවීමක් පෙන්නුම් කර ඇත. එනම් 2016 වසරේ පවුල් ආරවුල් 114500 ක් වාර්තා වූ අතර 2017 වසරේ 111775 ක් දක්වා 2% කින් අඩු වී ඇත. 2018 වසරේ එම ආරවුල් 107611 ක් වාර්තා වී ඇති අතර එය ප්‍රතිශතයක් ලෙස 2017 වසරට වඩා 4% ක අඩුවීමකි. විසඳීම් ප්‍රතිශතය ගත්විට 2016 සහ 2017 වසරවල 100% ක ප්‍රතිශතයක් ද 2018 වසරේ එම ප්‍රතිශතය 81% ක් දක්වා පහළයාමක් ද හඳුනාගත හැකිය.

ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය නිසා ඇති වන පවුල් ආරවුල් 2016 ට වඩා 2017 වසරේ අඩුවීමක් පෙන්නුම් කළ ද 2018 වසරේ සුළු වැඩිවීමක් හඳුනාගත හැකිය. එනම් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය යටතේ 2016 වසරේ පැමිණිලි 25387 ක් ලැබී ඇති අතර 2017 වසරේ එය 22899 දක්වා 10% කින් පහළගොස් ඇත. 2018 වසරේ එම ප්‍රමාණය 23092 දක්වා 2017 වසරට සාපේක්ෂව 0.8% කින් ඉතා සුළු වැඩිවීමක් පෙන්නුම් කළ ද 2016 වසරට සාපේක්ෂව තවදුරටත් 9% ක පහළයාමක් පෙන්නුම් කර ඇත. මෙම ආරවුල්වල විසඳීම් ප්‍රගතිය ගත්විට 2016 සහ 2017 වසරවල 100% ක ප්‍රතිශතයක් අත්කරගෙන ඇති අතර 2018 වසරේ විසඳීම් ප්‍රතිශතය 79% කි.

අනියම් සම්බන්ධතා නිසා ඇති වන පවුල් ආරවුල්වල ද 2016 වසරේ සිට 2018 වසර දක්වා අඩුවීමක් දැකිය හැකිය. ඒ අනුව අනියම් සම්බන්ධතා පිළිබඳ පැමිණිලි 11011 ක් 2016 වසරේ වාර්තා වී ඇති අතර 2017

වසරේ එම සංඛ්‍යාව 10056 දක්වා 9% කින් පහත වැටී ඇත. 2018 වසරේ මෙම පවුල් ආරවුල් වාර්තා වීම 10054 ක් වූ අතර 2017 වසරට වඩා පැමිණිලි 02 ක අඩුවීමක් දැකිය හැකිය. කෙසේ වුවද 2016 වසරට සාපේක්ෂව එය තවදුරටත් පහළ අගයක් ගෙන ඇති බව පෙනේ. අනියම් සබඳතා පිළිබඳ පවුල් ආරවුල්වල විසඳීම් 2016 සහ 2017 වසරවල 100% ක ප්‍රතිශතයක් වූ අතර 2018 වසරේ 78% ක විසඳීම් ප්‍රතිශතයක් අත්කරගෙන ඇත.

සමස්ථ පවුල් ආරවුල් පැමිණිලි ගත්විට 2016 වසරේ සිට 2018 වසර දක්වා පැහැදිළි අඩුවීමක් හඳුනාගත හැකිය. උදාහරණයක් ලෙස 2016 වසරේ සමස්ථ පවුල් ආරවුල් 150898 ක් වාර්තා වූ අතර 2017 වසරේ එය 144730 දක්වා 6168 කින් එනම් 4% කින් අඩු වී ඇත. 2018 වසරේ මෙම පැමිණිලි 140757 ක් වාර්තා වූ අතර එය 2017 වසරට සාපේක්ෂව 3973 කින් එනම් 3% කින් පහළයාමකි.

# 05. සියදිවි හානිකරගැනීම්

ලොව වාර්ෂිකව සිදුවන මරණවලින් සැළකිය යුතු ප්‍රමාණයක් සියදිවි හානිකරගැනීම් නිසා සිදුවන බව අනාවරණය වේ. ලොව පුරා සෑම තත්පර 40 කට වරක් එක් අයෙකු සියදිවි හානිකරගන්නා බවට හෙළි වී ඇත. පර්යේෂකයින්ට අනුව තරුණ පිරිස් අතර සියදිවි හානිකරගැනීම් ඉහළ යමින් පවතී. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත්විට ලොව ඉහළ සියදිවි හානිකරගැනීම් සිදුවන රටවල් අතරට ශ්‍රී ලංකාව ද ඇතුළත්ව තිබේ. දිනෙන් දින බිඳවැටෙන සමාජ සබඳතා සහ පවුලේ සාමාජිකයින් අතර ඇතිවන දුරස්ථභාවය මෙන්ම දැඩි මානසික ආතතිය, සමාජ සහ ආර්ථික ගැටළු මෙම සියදිවි හානිකරගැනීම්වලට සෘජුවම බලපාන බවට විවිධ අධ්‍යයන මගින් හෙළි වී තිබේ.

ශ්‍රී ලංකා පොලීසිය වෙත වාර්තා වන සියදිවි හානිකරගැනීම් පිළිබඳ විශ්ලේෂණය කිරීමේ දී සියදිවි හානිකරගැනීමට හේතුව, සියදිවි හානිකරගන්නා ආකාරය, එලෙස මරණයට පත්වන පුද්ගලයින්ගේ රැකියාවේ ස්වභාවය, ස්ත්‍රී පුරුෂභාවය සහ වයස යන ඛාණ්ඩ යටතේ වර්ගීකරණයට ලක්කරනු ලැබේ. පහත වගු අංක 9, 10, 11 හා 12 මගින් එක් එක් ඛාණ්ඩ යටතේ දත්ත ඉදිරිපත් කරනු ලැබ ඇත.

## 5.1 සියදිවි හානිකරගත් ක්‍රම

සියදිවි හානිකරගැනීම් පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී ඒ සඳහා භාවිතා කරනු ලබන ක්‍රම විවිධ ආකාරයෙන් හඳුනාග හැකිය. ශ්‍රී ලංකා පොලීසිය වෙත වාර්තා වන පරිදි සියදිවි හානිකරගත් ක්‍රම 15 ක් ඔස්සේ පහත වගුව මගින් කරුණු ඉදිරිපත් කර ඇත.

වගු අංක 09 **2016 – 2018 දක්වා සියදිවි හානිකරගත් ක්‍රම ඇතුළත් වගුව**

| | ක්‍රමය | 2016 | | | 2017 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | පුරුෂ | ස්ත්‍රී | එකතුව | පුරුෂ | ස්ත්‍රී | එකතුව | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
| 1 | කෘමිනාශක හා වල්නාශක පානය කිරීම | 698 | 175 | 873 | 698 | 154 | 852 | 696 | 104 | **800** |
| 2 | ගෙල සිරකර ගැනීමෙන් | 1284 | 289 | 1573 | 1508 | 306 | 1814 | 1546 | 358 | **1904** |
| 3 | ජලය සහිත ස්ථානවලට පැනීමෙන් (ළිං, ගංගා, ඇළ, දොළ, මුහුදු ආදි) | 51 | 42 | 93 | 72 | 37 | 109 | 69 | 42 | **111** |
| 4 | ගිනි අවි භාවිතයෙන් | 14 | 2 | 16 | 6 | 8 | 14 | 14 | 6 | **20** |
| 5 | අත්බෝම්බ හෝ වෙනත් පුපුරණ ද්‍රව්‍ය භාවිතයෙන් | 1 | 0 | 1 | 2 | 0 | 2 | 0 | 0 | **0** |
| 6 | මුවහත් ආයුධ භාවිතයෙන් | 4 | 0 | 4 | 9 | 2 | 11 | 4 | 3 | **7** |
| 7 | ගිනිතබා ගැනීමෙන් | 42 | 75 | 117 | 42 | 72 | 114 | 40 | 60 | **100** |
| 8 | දුම්රිය හෝ රථවාහනවලට පැනීමෙන් | 106 | 30 | 136 | 137 | 26 | 163 | 122 | 27 | **149** |
| 9 | ඇසිඩ් වර්ග පානය කිරීමෙන් | 23 | 7 | 30 | 30 | 11 | 41 | 30 | 8 | **38** |
| 10 | ඉන්ධන වර්ග පානය කිරීමෙන් (පැට්‍රල්, භූමිතෙල්) | 2 | 1 | 3 | 2 | 1 | 3 | 4 | 0 | **4** |
| 11 | බටහිර ඖෂධ වර්ග පානය කිරීමෙන් (නිදිපෙති ආදි වශයෙන්) | 10 | 13 | 23 | 11 | 10 | 21 | 10 | 10 | **20** |
| 12 | ස්වභාවික විෂ කෑමෙන් (කනේරු ඇට, නියගලා අල ආදි) | 43 | 35 | 78 | 36 | 32 | 68 | 34 | 30 | **64** |
| 13 | උස ස්ථානවලින් පැනීමෙන් | 7 | 2 | 9 | 6 | 2 | 8 | 6 | 0 | **6** |
| 14 | මත්ද්‍රව්‍ය පානයෙන් හෝ එන්නත් කර ගැනීමෙන් | 2 | 0 | 2 | 0 | 0 | 0 | 1 | 0 | **1** |
| 15 | අනෙකුත් ක්‍රමවලින් | 52 | 15 | 67 | 27 | 16 | 43 | 43 | 14 | **57** |
| | **එකතුව** | **2339** | **686** | **3025** | **2586** | **677** | **3263** | **2619** | **662** | **3281** |

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යාලේඛන ඒකකය

❖ දත්ත විශ්ලේෂණය

වගු අංක 09 ට අනුව පසුගිය වසර තුනක දත්ත අධ්‍යයන කිරීමේ දී 2016 වසරේ 3025 ක් වූ සියදිවි හානිකරගැනීම් 2017 වසරේ 3263 දක්වා 8% කින් ද 2018 වසරේ 3281 දක්වා 0.5% කින් ද ක්‍රමිකව ඉහළයාමක් හඳුනාගත හැකිය. වගුවට අනුව වැඩිම සියදිවි හානිකරගැනීම් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ ගෙල සිරකරගැනීමෙනි. 2016 වසරේ 1573 ක් වූ එම මරණ සංඛ්‍යාව 2017 වසරේ 1814 ක් දක්වා 15% කින් ද 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ 1904 ක් දක්වා 5% කින් ද ඉහළ ගොස් ඇත. මියගිය පුද්ගලයින්ගෙන් 81% ක් පිරිමි වන අතර 2017 වසරට සාපේක්ෂව ගෙල සිරකරගැනීමෙන් මියගිය කාන්තාවන් ප්‍රමාණය 2018 වසරේ 17% කින් ඉහළ ගොස් ඇත.

සියදිවි හානිකරගැනීම් අතර දෙවන ස්ථානයට පත් වන්නේ කෘමිනාශක පානය මගින් සිදුවන මරණ බවට වගුව මගින් අනාවරණය වේ. 2016, 2017 සහ 2018 වසරවල මෙම ක්‍රමය මගින් සිදුව ඇති සියදිවි හානිකරගැනීම්වල අඩුවක් දක්නට ලැබේ. 2016 වසරේ මේ ආකාරයේ සියදිවි හානිකරගැනීම් 873 ක් වාර්තා වූ අතර 2017 වසරේ එම ප්‍රමාණය 852 ක් දක්වා 2% කින් අඩු වී ඇත. 2018 වසරේ කෘමිනාශක පානයෙන් සිදුකරගත් සියදිවි හානිකරගැනීම් ප්‍රමාණය 2017 වසරට සාපේක්ෂව 800 දක්වා 6% කින් පහළගොස් ඇත. මෙහිදී ද වැඩිම ප්‍රමාණයක් පුරුෂයින් සියදිවි හානිකරගෙන ඇති අතර එය 2016 වසරේ 80% ක් වූ අතර 2017 වසරේ 82% කි. 2018 වසරේ සියදිවි නසාගත් පුද්ගලයින්ගෙන් 87% ක් පිරිමි පුද්ගලයින් වේ.

වාර්ෂික සියදිවි හානිකරගැනීම් අතර තුන්වන ස්ථානයට පත්ව ඇත්තේ දුම්රියට පැන සියදිවි හානිකරගැනීම් වේ. 2016 වසරේ මේ ආකාරයෙන් දිවිනසාගත් පුද්ගලයින් ප්‍රමාණය 136 කි. 2017 වසරේ මෙබඳු දිවි හානිකරගැනීම් 163 ක් වාර්තා වූ අතර 2016 වසරට සාපේක්ෂව එය 20% ක ඉහළයාමකි. 2018 වසරේ දුම්රියට පැන සියදිවි හානිකරගත් පුද්ගලයින් ප්‍රමාණය 2017 වසරට සාපේක්ෂව 149 දක්වා 8% කින් අඩු වී ඇත.

ගිනි තබාගැනීමෙන් සිදුවන සියදිවි හානිකරගැනීම් ද සැළකිය යුතු ප්‍රමාණයක් වාර්තා වී ඇති අතර එම මරණ ද පසුගිය වසර තුන තුළ ක්‍රමිකව අඩුවීමක් දැකියහැකිය. 2016, 2017 සහ 2018 වසරවල පිළිවෙලින් 117, 114 සහ 100 ලෙස මෙම අඩුවීම හඳුනාගත හැකිය. ඒ අනුව 2016 වසරට සාපේක්ෂව 2017 වසරේ 2% කින් ද 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ 12% කින් ද ගිනි තබාගැනීමෙන් සිදුව ඇති සියදිවි හානිකරගැනීම් අඩු වී ඇත. මෙම මරණවල විශේෂත්වය නම් මියගිය වැඩි පිරිස කාන්තාවන් වීමයි. ඒ අනුව 2016 වසරේ ගිනි තබාගෙන සියදිවි හානිකරගත් අය අතරින් 64% ක් කාන්තාවන් වූ අතර 2017 වසරේ එය 63% කි. 2018 වසරේ ගිනි තබාගෙන සියදිවි හානිකරගත් පුද්ගලයින් අතර කාන්තාවන්ගේ ප්‍රතිශතය 60% කි.

## 5.2 සියදිවි හානි කරගැනීමට හේතු

සියදිවි හානිකරගන්නා ක්‍රමවලට අමතරව සියදිවි හානිකරගැනීමට හේතු වූ කරුණු ද ශ්‍රී ලංකා පොලීසිය වෙත වාර්තා වන පරිදි පහත වගු අංක 10 මගින් ඉදිරිපත් කර ඇත.

වගු අංක 10 **2016 – 2018 දක්වා සියදිවි හානිකරගත් හේතු ඇතුළත් වගුව**

| අනු අංකය | ක්‍රමය | 2016 | | | 2017 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | පුරුෂ | ස්ත්‍රී | එකතුව | පුරුෂ | ස්ත්‍රී | එකතුව | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
| 1 | ආර්ථික සම්බන්ධ ගැටලු (දිළිඳුකම, ණය ආදි) | 124 | 27 | **151** | 166 | 29 | **195** | 200 | 38 | **238** |
| 2 | රැකියා සම්බන්ධ ගැටලු | 21 | 0 | **21** | 21 | 4 | **25** | 23 | 3 | **26** |
| 3 | වැඩිහිටියන් සමඟ ඇති වන ගැටලු (ගුරුවරු, දෙමාපියන් ඇතුළු) | 45 | 34 | **79** | 52 | 15 | **67** | 39 | 32 | **71** |
| 4 | පුරුෂයාගෙන් හෝ භාර්යාවගෙන් සිදුවන කරදර හා පවුල් ආරවුල් | 445 | 158 | **603** | 477 | 148 | **625** | 432 | 159 | **591** |
| 5 | ප්‍රේම සම්බන්ධතා නිසා කළකිරීම, බලාපොරොත්තු කඩවීම | 152 | 120 | **272** | 169 | 96 | **265** | 197 | 91 | **288** |
| 6 | ලිංගික අතවරවලට ලක්වීම/ ස්ත්‍රී දූෂණ | 3 | 0 | **3** | 1 | 0 | **1** | 4 | 3 | **7** |
| 7 | මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම | 124 | 1 | **125** | 137 | 0 | **137** | 143 | 0 | **143** |
| 8 | දෙමාපියන් ඇතුළු ඥාතීන්ගේ මරණ නිසා සිත් තැවුලට පත්වීම | 34 | 9 | **43** | 35 | 20 | **55** | 37 | 7 | **44** |
| 9 | චංචල හෝ නිශ්චල දේපල අහිමිවීම | 3 | 4 | **7** | 4 | 1 | **5** | 2 | 1 | **3** |
| 10 | විභාගයෙන් අසමත්වීම | 3 | 6 | **9** | 6 | 3 | **9** | 2 | 3 | **5** |
| 11 | දරුවන් නොසැළකීම | 10 | 4 | **14** | 14 | 6 | **20** | 14 | 0 | **14** |
| 12 | ලිංගික දුබලතා | 2 | 2 | **4** | 2 | 0 | **2** | 4 | 1 | **5** |
| 13 | මානසික ආබාධ | 178 | 66 | **244** | 246 | 84 | **330** | 258 | 79 | **337** |
| 14 | නිදන්ගත රෝග හා ශාරීරික අපහසුතා | 318 | 63 | **381** | 321 | 58 | **379** | 359 | 60 | **419** |
| 15 | අනෙකුත් හේතූන් | 877 | 192 | **1069** | 935 | 213 | **1148** | 905 | 185 | **1090** |
| **එකතුව** | | **2339** | **686** | **3025** | **2586** | **677** | **3263** | **2619** | **662** | **3281** |

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යාලේඛන ඒකකය

❖ **දත්ත විශ්ලේෂණය**

ශ්‍රී ලංකාවේ සියදිවි හානිකරගැනීම් ගත්විට ඊට බලපානු ලබන සමාජයේ අවධානයට බඳුන් වියයුතු කැපීපෙනෙන හේතු ගණනාවක් ඉහත වගුව මගින් හඳුනාගත හැකිය. ඉන් ප්‍රධාන හේතු කිහිපයක් මෙහිදී විශ්ලේෂණයට බඳුන් වේ.

වගුවට අනුව 2018 වසරේ වැඩිම ප්‍රමාණයක් සියදිවි හානිකර ගැනීමට හේතුව ලෙස පවුල් ආරවුල් හඳුනාගත හැකිය. පවුලක් තුළ සිදුවන අඩදබර සාමාන්‍ය සංසිද්ධියක් ලෙස සමාජය විසින් සලකනු ලබන බවක් පෙනෙන්නට තිබුණ ද මුළ දී නිසි විසඳුමක් නොලබන සුළු පවුල් ආරවුලක් වුවද ඛේදජනක අවසානයක් කරා ගමන්කිරීමට ඉඩ ඇති බවට හොඳම නිදසුනක් ලෙස 2018 වසරේ සියදිවි හානිකරගැනීම් 591 ක සංඛ්‍යාව දැක්විය හැකිය. වගුවට අනුව වසර තුනෙහිම වැඩිම පිරිසක් දිවිහානිකරගත් හේතුව ලෙස මෙම පවුල් ආරවුල් දැක්විය හැකිය. 2016 වසරේ 603 දෙනෙකු පවුල් ආරවුල් මත සියදිවි හානිකරගෙන ඇති අතර 2017 වසරේ එය 625 දක්වා 4% කින් ඉහළගොස් ඇත. 2018 වසරේ මේ හේතුවෙන් සියදිවි හානිකරගත් ප්‍රමාණය 591 ක දක්වා 2017 වසරට සාපේක්ෂව 5% කින් අඩුවී ඇත.

පවුල් ආරවුල් නිසා දිවි හානිකරගන්නා සංඛ්‍යාවෙන් බහුතරය පිරිමින් බව දත්ත අනුව පෙනී යයි. 2016 වසරේ දිවිහානිකරගත් පිරිසෙන් 74% ක් පිරිමින් වූ අතර 2017 වසරේ එම ප්‍රමාණය 76% කි. 2018 වසරේ පවුල් ආරවුල් හේතුවෙන් සියදිවි හානිකරගත් සංඛ්‍යාවෙන් 75% ක් පිරිමින් වීම ඒ සඳහා නිදසුන් ලෙස දැක්විය හැකිය.

වගුවට අනුව 2018 වසරේ වැඩිම පිරිසක් සියදිවි හානිකරගැනීමට මුල් වූ දෙවන සහ තුන්වන හේතු පිළිබඳව අවධානය යොමු කිරීමේ දී පෙනී යන්නේ ශාරීරික මෙන්ම මානසික හේතූන් නිසා ද සැළකිය යුතු පිරිසක් සියදිවි හානිකරගන්නා බවයි. මෙහිදී මානසික රෝග හේතුවෙන් 337 ක් ද ශාරීරික ආබාධ සහ නිධන්ගත රෝග හේතුවෙන් 419 ක් ද 2018 වසරේ සියදිවි හානිකරගෙන ඇත.

ශාරීරික රෝගාබාධ හේතුවෙන් දිවිහානිකරගත් ප්‍රමාණය සැළකිල්ලට භාජනය කිරීමේ දී 2016 වසරේ 381 ක් දිවිහානිකරගෙන ඇති අතර ඉන් 83% ක් පුරුෂයින් වේ. 2017 වසරේ මේ හේතුවෙන් මියගිය සංඛ්‍යාව 379 ක් වූ අතර 2016 වසරට සාපේක්ෂව එම මරණවල සුළු අඩුවීමක් පෙන්නුම් කර ඇත. 2017 වසරේ මියගිය සංඛ්‍යාවෙන් 85% ක් පුරුෂයින් වේ. නිදන්ගත හා ශාරීරික රෝගාබාධ හේතුවෙන් 2018 වසරේ සියදිවි හානිකරගත් සංඛ්‍යාව 419 ක් වූ අතර ඉන් 86% ක් පුරුෂ පාර්ශ්වය වේ. 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ මෙබඳු සියදිවි හානිකරගැනීම්වල 10% ක ඉහළයාමක් දක්නට ඇත.

මානසික ආබාධ හේතුවෙන් සියදිවි හැනිකරගැනීම් පිළිබඳ අවධානය යොමු කිරීමේ දී 2016 වසරේ 244 දෙනෙකු දිවිහානිකරගෙන ඇති අතර ඉන් 73% ක් පිරිමි පුද්ගලයින් වේ. 2016 වසරට සාපේක්ෂව 2017 වසරේ මානසික ආබාධ හේතුවෙන් සියදිවි හානිකරගත් සංඛ්‍යාව 330 කි. එය 2016 වසරට සාපේක්ෂව 35% ක වැඩිවීමකි. මෙම මරණවලින් 74% ක් පිරිමි පුද්ගලයින් වේ. 2018 වසරේ මානසික ආබාධ හේතුවෙන් දිවිනසාගත් සංඛ්‍යාව 337 ක් වූ අතර 2017 වසරට සාපේක්ෂව එය 2% ක වැඩිවීමකි. මෙම දිවිනසාගත් සංඛ්‍යාවෙන් 76% ක් පිරිමි පුද්ගලයින් වේ. 2018 වසරේ සමස්ථ සියදිවිනසාගැනීම්වලින් 23% ක් මෙම ශාරීරික සහ මානසික ආබාධ නිසා දිවිනසාගෙන ඇති බව වගුවෙහි දත්තවලට අනුව හඳුනාගත හැකිය.

ප්‍රේම සම්බන්ධතා බිඳවැටීම ද සියදිවි හානිකරගැනීම සඳහා බලපා ඇති ප්‍රධාන හේතුවක් ලෙස සැළකිය හැකි අතර 2016 වසරේ 272 ක් මේ හේතුව නිසා සියදිවි හානිකරගෙන ඇත. ඉන් 56% ක් පිරිමි පුද්ලයින් වූ අතර 2017 වසරේ ප්‍රේම සබඳතා නිසා දිවිහානිකරගත් ප්‍රමාණය 265 ක් ලෙස 2016 වසරට වඩා 2% ක අඩුවීමක් පෙන්නුම් කර ඇත. 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ මෙබඳු සියදිවි හානිකරගැනීම්288 දක්වා 9% කින් ඉහළ ගොස් ඇති බව හඳුනාගත හැකිය. දිවිනසාගත් වැඩිම පිරිස පිරිමි පුද්ගලයින් වූ අතර 2017 වසරේ 64% ක් ද 2018 වසරේ 68% ක් ද ලෙස ප්‍රේම සබඳතා නිසා පිරිමින් සියදිවි හානිකරගෙන ඇත.

දුප්පත්කම සහ ණයවීම වැනි ආර්ථික ගැටළු මත ද පසුගිය වසර කිහිපය තුළ සැළකිය යුතු සංඛ්‍යාවක් සියදිවි හානිකරගෙන තිබේ. 2016 වරේ ආර්ථික ගැටළුව නිසා දිවිනසාගත් සංඛ්යාව 151 ක් වූ අතර ඉන් 82% ක් පුරුෂයින් වේ. 2017 වසරේ මෙබඳු සියදිවි හානිකරගැනීම් 195 ක් සිදුව ඇති අතර එය 2016 වසරට සාපේක්ෂව 29% ක ඉහළයාමකි. 2017 වසරේ ආර්ථික ගැටළු නිසා දිවිනසාගත් පුද්ගලයින්ගෙන් 85% ක් පිරිමි පුද්ගලයින් වේ. 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ ආර්ථික ගැටළු නිසා දිවිනසාගත් ප්‍රමාණය 22% කින් එනම් 238 දක්වා ඉහළගොස් ඇත. මෙහිදී ද දිවිනසාගත් පුද්ගලයින්ගෙන් 84% ක් පුරුෂ පාර්ශ්වය වේ.

විෂ මත්ද්‍රව්‍ය භාවිතය ද සියදිවි හානිකරගැනීමට බලපාන ප්‍රධාන හේතුවක් වී ඇති බව වගුවෙහි දත්ත මගින් අනාවරණය කරගත හැකිය. මතට ඇබ්බැහිවීම නිසා 2016 වසරේ 125 දෙනෙකු සියදිවි හානිකරගෙන ඇති අතර 2017 වසරේ 137 ක් දිවි හානිකරගෙන ඇත. 2016 වසරට සාපේක්ෂව 2017 වසරේ මත්ද්‍රව්‍යයට ඇබ්බැහිවීම නිසා දිවිනසාගැනීම් 10% කින් වර්ධනය වී ඇති අතර 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ මෙබඳු දිවිනසාගැනීම් 143 ක් වාර්තා වූ අතර ප්‍රතිශතයක් ලෙස එය 6% ක වැඩිවීමකි. 2016 වසරේ එක් කාන්තාවක් මත්ද්‍රව්‍යයට ඇබ්බැහි වීමෙන් දිවිනසාගෙන ඇති අතර ඒ හැරුණු කොට වගුවෙහි සඳහන් වසර තුනෙහිම මෙ හේතුවෙන් සියදිවි හානිකරගත් පුද්ගලයින් සියලු දෙනාම පිරිමින් වේ.

## 5.3 සියදිවි හානිකරගත් පුද්ගලයින්ගේ රැකියා ස්වභාවය

සියදිවි හානිකරගත් පුද්ගලයින්ගේ රැකියා ස්වභාවය ද ඔවුන් මේ සඳහා යොමුවීම කෙරෙහි යම් බලපෑමක් එල්ල කළ හැකි සාධකයක් ලෙස සැළකේ. ඒ අනුව කාණ්ඩ 15 ක වර්ගීකරණයක් යටතේ පහත වගු අංක 11 මගින් ඒ සම්බන්ධයෙන් දත්ත ඉදිරිපත් කර ඇත.

වගු අංක 11 **2016 – 2018 දක්වා සියදිවි හානිකරගත් පුද්ගලයින් ගේ රැකියා ස්වභාවය ඇතුළත් වගුව**

| අනු අංකය | රැකියාවේ ස්වභාවය | 2016 | | | 2017 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | පුරුෂ | ස්ත්‍රී | එකතුව | පුරුෂ | ස්ත්‍රී | එකතුව | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
| 1 | වෘත්තීමය, කාර්මික සහ අදාළ ක්ෂේත්‍රයන්හි සේවකයෝ (වෛද්‍යවරු, ඉංජිනේරුවරු, ගුරුවරු, ඡායාරූප ශිල්පීන් ආදි) | 42 | 5 | **47** | 65 | 5 | **70** | 54 | 5 | **59** |
| 2 | පරිපාලන, විධායක කළමනාකරණ ක්ෂේත්‍රයේ සේවකයෝ | 11 | 3 | **14** | 10 | 1 | **11** | 10 | 2 | **12** |
| 3 | ලිපිකරුවෝ සහ සම්බන්ධිත ගනවලට අයත් සේවකයෝ ( ලඝු ලේඛකයෝ, යතුරු ලේඛකයෝ, තැපැල් හා | 23 | 3 | **26** | 29 | 2 | **31** | 21 | 2 | **23** |
| 4 | වෙළඳ සේවකයෝ | 68 | 15 | **83** | 102 | 9 | **111** | 99 | 19 | **118** |
| 5 | සේවා අංශවල සේවකයෝ (අරක්කැමියෝ, ඇඳුම් මසන්නන්, කරණවැමියන් ඇතුළු) | 37 | 12 | **49** | 47 | 14 | **61** | 53 | 23 | **76** |
| 6 | කෘෂිකාර්මික/ සත්ත්ව පාලක/ ධීවර කර්මාන්තය/ දඩයම්කිරීම සහ වන සංරක්ෂණයට අදාළ සේවකයෝ | 391 | 25 | **416** | 478 | 31 | **509** | 484 | 27 | **511** |
| 7 | නිෂ්පාදන ක්‍රියාමාර්ග අදාළ සේවකයෝ, ශිල්පීහු හා අදාළ සේවකයෝ ප්‍රවාහන යන්ත්‍රෝපකරණ | 184 | 15 | **199** | 138 | 13 | **151** | 148 | 10 | **158** |
| 8 | ත්‍රිවිධ හමුදා සේවකයෝ | 33 | 0 | **33** | 31 | 1 | **32** | 24 | 0 | **24** |
| 9 | පොලීසිය | 9 | 0 | **9** | 5 | 0 | **5** | 8 | 0 | **8** |
| 10 | ආරක්ෂක සේවකයෝ | 11 | 1 | **12** | 16 | 2 | **18** | 7 | 0 | **7** |
| 11 | විශ්‍රාමිකයෝ | 34 | 4 | **38** | 45 | 1 | **46** | 69 | 1 | **70** |
| 12 | ශිෂ්‍යයෝ | 38 | 82 | **120** | 68 | 69 | **137** | 60 | 74 | **134** |
| 13 | දේශපාලකයෝ | 0 | 0 | **0** | 0 | 0 | **0** | 0 | 1 | **1** |
| 14 | රැකියා විරහිත අය | 741 | 376 | **1117** | 797 | 419 | **1216** | 749 | 406 | **1155** |
| 15 | රැකියා අනුව වර්ග නොකරන ලද | 717 | 145 | **862** | 755 | 110 | **865** | 833 | 92 | **925** |
| | **එකතුව** | **2339** | **686** | **3025** | **2586** | **677** | **3263** | **2619** | **662** | **3281** |

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යා ලේඛන ඒකකය

### ❖ දත්ත විශ්ලේෂණය

පසුගිය වසර කිහිපය තුළ ලංකාවේ සියදිවි හානිකරගැනීම් අධ්‍යයනය කිරිමේ දී මරණයට පත්වූ පුද්ගලයින්ගේ රැකියා ස්වභාවය ඒ සඳහා යම් බලපෑමක් එල්ල කළහැකි සාධකයක් ලෙස දැක්විය හැකිය. විශේෂයෙන්ම රැකියා වියුක්තිය සියදිවි නසාගැනීම සඳහා පෙළඹවීමක් ඇතිකළ හැකි කාරණයක් ලෙසට අවධානයට ලක්කළ යුතු බව වගුවේ දත්ත අනුව පෙනී යයි.

වගුවට අනුව පසුගිය වසර තුන සළකාබැලීමේ දී විරැකියාවෙන් පෙළෙන අයගේ සියදිවි හානිකරගැනීම් ඉහළ තලයක පවතින බව නිරීක්ෂණය වේ. ඒ අනුව 2016 වසරේ 1117 ක් ද 2017 වසරේ 1216 ක් ද 2018 වසරේ 1155 ක් ද ලෙස එම සංඛ්‍යාව දැක්විය හැකිය. ප්‍රතිශතාත්මකව ගත්කල 2016 වසරට වඩා 2017 වසරේ විරැකියාවෙන් පෙළෙන පුද්ගලයින්ගේ සියදිවි නසාගැනීම් 9% කින් ඉහළගොස් ඇති අතර 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ විරැකියාවෙන් පෙළෙන්නන්ගේ සියදිවි හානිකරගැනීම් 5% කින් පහළගොස් ඇත.2018 වසරේ සමස්ථ සියදිවි හානිකරගැනීම්වලින් 35% ක් විරැකියාවෙන් පෙළෙන අයගේ සියදිවි හානිකරගැනීම් බව හඳුනාගත හැකිය. 2016 වසරේ සමස්ථ දිවිනසාගැනීම්වලින් 37% ක් විරැකියාවෙන් පෙළෙනවුන්ගේ සියදිවි නසාගැනීම් වු අතර 2( මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යාලේඛන ඒකකය

අනෙකුත් රැකියාවලට අයත් තැනැත්තන්ගේ සියදිවි හානිකරගැනීම් හා සසඳන කල විරැකියාවෙන් පෙළෙන්නන්ගේ සියදිවි හානිකරගැනීම්වල කාන්තා දිවිනසාගැනීම් ඉහළ අගයක් ගෙන ඇති බව හඳුනාගත හැකිය.

උදාහරණ ලෙස 2018 වසරේ රැකියා වියුක්ත පිරිමින් 749 ක් දිවිහානිකරගෙන ඇති අතර කාන්තාවන් 406 දෙනෙකු දිවිහානිකරගෙන ඇත. 2016 වසරේ රැකියා වියුක්ත පිරිමි පුද්ගලයින් 741 ක් දිවිනසාගන්නා විට කාන්තාවන් 376 ක් දිවිනසාගෙන ඇත. 2017 වසරේ එම ප්‍රමාණය පිරිමින් 798 ට කාන්තාවන් 419 කි.

2018 වසරේ රැකියා නියුක්ත පුද්ගලයින් ගේ සියදිවි හානිකරගැනීම් ගත්විට ඉන් 40% ක් පහළ මට්ටමේ රැකියා නියුක්තිකයින්ගේ සියදිවි හානිකරගැනීම් බව හෙළිවේ. කෘෂිකර්ම, සත්ත්ව පාලන, මත්ස්‍ය කර්මාන්ත ආශ්‍රිත සේවකයින්, කම්කරුවන්, යන්ත්‍ර ක්‍රියාකරුවන්, වෙළඳ නියෝජිතයින් ආදි ක්ෂේත්‍රවල රැකියා නියුක්තිකයින් මීට අයත් වේ.

විශ්‍රාමිකයින්ගේ සියදිවි හානිකරගැනීම් සලකාබැලූ විට පසුගිය වසර තුන තුළ වර්ධනයක් දැකිය හැකිය. 2016 වසරේ 38 ක් වූ විශ්‍රාමිකයින්ගේ සියදිවි හානිකරගැනීම් සංඛ්‍යාව 2017 වසරේ 46 ක් දක්වා 21% කින් ද 2018 වසරේ එය 70 ක් දක්වා 52% කින් ද ඉහළ ගොස් ඇත. 2016 වසරේ මෙම සියදිවි හානිකරගත් පුද්ගලයින්ගෙන් 89% ක් පිරිමි පුද්ගලයින් වූ අතර 2017 සහ 2018 වසරවල එම ප්‍රතිශතය 98% ක් වේ.

ශිෂ්‍ය ප්‍රජාවගේ සියදිවි හානිකරගැනීම් විශ්ලේෂණය කිරීමේදී දක්නට ලැබෙන විශේෂිතම කාරණය වන්නේ අනෙකුත් සියලුම සියදිවි හානිකරගැනීම්වලට වෙනස්ව මෙහිදී කාන්තාවන්ගේ දිවිනසාගැනීම් පුරුෂයින්ගේ සියදිවි හානිකරගැනීම් ඉක්මවා ගොස් ඇති බවයි. 2016 වසරේ ශිෂ්‍යයින්ගේ දිවි හානිකරගැනීම් 38 ක් වාර්තා වූ අතර ශිෂ්‍යාවන්ගේ දිවි හානිකරගැනීම් සංඛ්‍යාව 82 ක් විය. එය ප්‍රතිශතයක් ලෙස 68% කි. 2017 වසරේ ශිෂ්‍යයන් 68 ක් ද ශිෂ්‍යාවන් 69 ක් දිවි හානිකරගෙන ඇති අතර 2018 වසරේ ශිෂ්‍යයන් 60 කට ශිෂ්‍යාවන් 74 ක් දිවි හානිකරගෙන තිබේ. ප්‍රතිශතයක් ලෙස එය 55% කි. ඉහත වසර තුනෙහි ශිෂ්‍ය ප්‍රජාවගේ සියදිවි හානිකරගැනීම් සළකාබැලීමේ දී 2016 වසරේ 120 දෙනෙකු දිවිනසාගෙන ඇති අතර 2017 වසරේ එම සංඛ්‍යාව 137 දක්වා 14% කින් ඉහළගොස් ඇත. 2018 වසරේ එම සංඛ්‍යාව 134 දක්වා 2% කින් 2017 වසරට සාපේක්ෂව පහළගොස් ඇත.

වගුවෙහි අනු අංක 01 සහ 02 යටතේ ගැනෙන විධායක ශ්‍රේණියේ සහ අනෙකුත් ඉහළ මට්ටම්වල (වෛද්‍ය, ඉංජිනේරු ආදී) රැකියා නියුක්තිකයින්ගේ සියදිවි හානිකරගැනීම් ගත්විට 2016 වසරේ මෙම කොටස් දෙකෙහිම සියදිවි නසාගැනීම් 61 ක් වාර්තා වී ඇති අතර 2017 වසරේ එම ප්‍රමාණය 81 ක් දක්වා 33% කින් ඉහළගොස් ඇත. 2018 වසරේ මේ ක්ෂේත්‍රයේ සියදිවිනසාගැනීම් ප්‍රමාණය 2017 වසරට සාපේක්ෂව 71 ක් දක්වා 12% කින් පහළගොස් ඇත. මෙම විධායක සහ අනෙකුත් ඉහළ රැකියා නියුක්තිකයින්ගේ සියදිවි හානිකරගැනීම් ප්‍රතිශතයක් ලෙස 2018 වසරේ සමස්ථ සියදිවි නසාගැනීම්වලින් 2% ක් ලෙස දැක්විය හැකිය.

## 5.4 වයස හා ස්ත්‍රී / පුරුෂභාවය අනුව සියදිවි හානිකරගැනීම්

ශ්‍රී ලංකා පොලීසිය වෙත වාර්තා වන සියදිවි හානිකරගැනීම්, මියගිය පුද්ගලයින්ගේ වයස හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව ද වර්ගීකරණයට ලක්කෙරේ. ඒ අනුව ස්ත්‍රී පුරුෂ වශයෙන් මෙන්ම වයස් ඛාණ්ඩ 13 ක් යටතේ ද වගු අංක 12 මගින් දත්ත ඉදිරිපත් කර ඇත.

වගු අංක 12 **2016 – 2018 දක්වා වයස හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව සියදිවි නසාගැනීම් වගුව**

| අනු අංකය | වයස් කාණ්ඩ | 2016 | | | 2017 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | පුරුෂ | ස්ත්‍රී | එකතුව | පුරුෂ | ස්ත්‍රී | එකතුව | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
| 1 | අවුරුදු 08 සහ 16 අතර | 27 | 52 | **79** | 49 | 41 | **90** | 30 | 46 | **76** |
| 2 | අවුරුදු 17 සහ 20 අතර | 107 | 112 | **219** | 118 | 87 | **205** | 115 | 98 | **213** |
| 3 | අවුරුදු 21 සහ 25 අතර | 207 | 86 | **293** | 198 | 79 | **277** | 221 | 109 | **330** |
| 4 | අවුරුදු 26 සහ 30 අතර | 153 | 83 | **236** | 214 | 86 | **300** | 209 | 83 | **292** |
| 5 | අවුරුදු 31 සහ 35 අතර | 185 | 62 | **247** | 220 | 65 | **285** | 193 | 52 | **245** |
| 6 | අවුරුදු 36 සහ 40 අතර | 176 | 48 | **224** | 200 | 56 | **256** | 223 | 44 | **267** |
| 7 | අවුරුදු 41 සහ 45 අතර | 195 | 33 | **228** | 220 | 44 | **264** | 216 | 36 | **252** |
| 8 | අවුරුදු 46 සහ 50 අතර | 211 | 30 | **241** | 232 | 32 | **264** | 239 | 24 | **263** |

| අනු අංකය | වයස් කාණ්ඩ | 2016 | | | 2017 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | පුරුෂ | ස්ත්‍රී | එකතුව | පුරුෂ | ස්ත්‍රී | එකතුව | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
| 9 | අවුරුදු 51 සහ 55 අතර | 242 | 43 | **285** | 233 | 45 | **278** | 226 | 41 | **267** |
| 10 | අවුරුදු 56 සහ 60 අතර | 216 | 23 | **239** | 250 | 37 | **287** | 257 | 29 | **286** |
| 11 | අවුරුදු 61 සහ 65 අතර | 174 | 27 | **201** | 222 | 29 | **251** | 228 | 23 | **251** |
| 12 | අවුරුදු 66 සහ 70 අතර | 161 | 36 | **197** | 160 | 21 | **181** | 185 | 28 | **213** |
| 13 | අවුරුදු 70 ට ඉහළ | 285 | 51 | **336** | 270 | 55 | **325** | 277 | 49 | **326** |
| එකතුව | | **2339** | **686** | **3025** | **2586** | **677** | **3263** | **2619** | **662** | **3281** |

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යාලේඛන ඒකකය

❖ **දත්ත විශ්ලේෂණය**

වගුවෙහි අඩංගු දත්තවලට අනුව 2018 වසරේ සියදිවි හානිකරගත් පුද්ගලයින් වැඩිම පිරිසක් අයත් වන්නේ වයස 21 – 25 අතර වයස් ඛාණ්ඩයට වේ. එම සංඛ්‍යාව 330 කි. ප්‍රතිශතයක් ලෙස 2018 වසරේ සමස්ථ සියදිවි හානිකරගැනීම්වලින් මෙම වයස් ඛාණ්ඩයේ සියදිවි හානිකරගැනීම් 10% ක අගයක් ගෙන ඇත. 2018 වසරේ සියදිවි හානිකරගැනීම්වලින් දෙවන වැඩිම සංඛ්‍යාව වන 326 අයත් වන්නේ වයස අවුරුදු 70 ට වැඩි ඛාණ්ඩයටය. එය සමස්ථ සංඛ්‍යාවෙන් 10% ක අගයකි. 2016 සහ 2017 වසර දෙක ගත්විට වැඩිම පිරිසක් දිවිනසාගත් වයස් ඛාණ්ඩය වන්නේ ද වයස 70 ට වැඩි ඛාණ්ඩයයි.

ඉහත වසර තුනෙහි සියදිවි හානිකරගැනීම් දළ වශයෙන් ජීවිතේ විවිධ අවධීන්වලට වෙන්කර හඳුනාගතහැකි අතර 2016 වසරේ ළමා සහ නව යොවුන් වියට අයත් වයස අවුරුදු 08 – 16 ත් අතර 79 දෙනෙකු දිවිනසාගෙන ඇත. 2017 වසරේ එම වයස් ඛාණ්ඩයට අයත් සියදිවි හානිකරගැනීම් ප්‍රමාණය 90 දක්වා 14% කින් ඉහළගොස් ඇත. 2018 වසරේ එම වයස් ඛාණ්ඩයේ 76 දෙනෙකු දිවිනසාගෙන ඇති අතර එය 2017 වසරට සාපේක්ෂව 15% ක පහතවැටීමකි. 2018 වසරේ සමස්ථ සියදිවි හානිකරගැනීම්වලින් 2% ක් මෙම වයස් ඛාණ්ඩයට අයත් වේ.

මෙම 08 – 16 අතර වයස් ඛාණ්ඩයේ සියදිවි හානිකරගැනීම්වල විශේෂත්වය නම් පිරිමින් ඉක්මවා ස්ත්‍රීන්ගේ දිවි හානිකරගැනීම් ඉහළ ගොස් තිබීමයි. වගුවට අනුව 2016 – 2018 කාලසීමාව ගත්විට සියදිවි හානිකරගත් ඉහත වයස් ඛාණ්ඩයේ පිරිමින් සංඛ්‍යාව 106 ක් වනවිට ස්ත්‍රීන් සංඛ්‍යාව 139 කි. මෙම ඛාණ්ඩයට ශිෂ්‍ය ප්‍රජාව ද අයත් වන අතර ශිෂ්‍යයන් අතර සියදිවි හානිකරගැනීම්වල කාන්තා එනම් ශිෂ්‍යාවන්ගේ සියදිවි හානිකරගැනීම් ඉහළ අගයක් ගෙන ඇති අයුරු මීට පෙර ද දත්ත මගින් පැහැදිළි කර ඇත.

යොවුන් වියට අයත් වයස 17 – 20 අතර දිවි හානිකරගැනීම් ගත්විට 2016 වසරේ 219 ක් වාර්තා වූ අතර 2017 වසරේ එම ප්‍රමාණය 205 දක්වා 6% කින් 2016 වසරට සාපේක්ෂව අඩු වී ඇත. 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ මෙම වයස් ඛාණ්ඩයේ සියදිවි හානිකරගැනීම් 213 දක්වා 4% කින් ඉහළගොස් ඇති අතර මරණවලින් වැඩි ප්‍රතිශතයක් පිරිමි පාර්ශ්වය නියෝජනය කරයි. බොහෝ විට අධ්‍යාපනය ලැබීම, නව අත්හදාබැලීම් සිදුකිරීම, විරැකියාව, යොවුන් ප්‍රේම සබඳතා මෙම වයස් ඛාණ්ඩයට අයත් විශේෂිත ලක්ෂණ ලෙස සලකා බැලුව හොත් මෙම සියදිවි හානිකරගැනීම්වලට එම කරුණු අඩු වැඩි වශයෙන් බලපාන්නට ඇති බවට මෙම පරිච්ඡේදයේ සමස්ථ කරුණු විශ්ලේෂණය කිරීමෙන් බොහෝ දුරට නිගමනය කළ හැකිය.

අවුරුදු 21 – 35 ත් අතර වයස් ඛාණ්ඩයට අයත් තරුණ අවධියේ පුද්ගලයින් 776 දෙනෙකු 2016 වසරේ සියදිවි හානිකරගෙන ඇති අතර 2017 වසරේ එම වයස් ඛාණ්ඩයේ දිවිනසාගැනීම් 862 ක් දක්වා 11% කින් ඉහළගොස් ඇත. 2018 වසරේ 867 දක්වා 0.5% ක පමණ සුළු අගයකින් මෙම දිවිනසාගැනීම් 2017 වසරට සාපේක්ෂව තවදුරටත් ඉහළගොස් ඇත. රටේ ශ්‍රම බලකායට අයත් පිරිසක් මෙන්ම පවුලේ ආර්ථිකයට මූලික දායකත්වයක් දක්වන පිරිසක් ලෙස මෙම වයස් ඛාණ්ඩවලට අයත් සියදිවි නසාගැනීම්වල සමාජ බලපෑම පුළුල් ලෙස අධ්‍යයනය කළයුතුව ඇත.

වයස 36 – 60 ත් අතර වයස් ඛාණ්ඩයේ සියදිවි හානිකරගැනීම් ගත් විට 2016 වසරේ 1217 දෙනෙකු සියදිවි හානිකරගෙන ඇති අතර 2017 වසරේ එම ප්‍රමාණය 1349 දක්වා 11% කින් ඉහළ ගොස් ඇත. 2017 වසරට සාපේක්ෂව මෙම වයස් ඛාණ්ඩවල 2018 වසරේ දිවිනසාගැනීම් 1335 දක්වා 1% කින් පමණ පහළගොස් ඇත. රටේ ශ්‍රම බලකායෙන් බහුතරය මෙම වයස් ඛාණ්ඩවලට අයත්වන අතර එබඳු සියදිවි නසාගැනීම්වලින් රටේ සහ පවුලේ ආර්ථිකය කෙරෙහි ඇතිකරනු ලබන බලපෑම ද සුළු පටු නොවන බව වටහාගත හැකිය.

වයස අවු 61 ට වැඩි වයස් බාණ්ඩවල සියදිවි හානිකරගැනීම් සලකා බැලූ විට 2016 වසරේ 734 ක් වාර්තා වී ඇත. 2016 වසරට සාපේක්‍ෂව එම සියදිවි හානිකරගැනීම් 2017 වසරේ 757 දක්වා 3% කින් ඉහළගොස් ඇති අතර 2018 වසරේ 790 දක්වා 4% කින් 2017 වසරට සාපේක්‍ෂව තවදුරටත් ඉහළගොස් ඇත. ජීවිතේ සැඳැසමය ගෙවන පුද්ගලයින් වැඩි පිරිසක් මෙම කොටසට අයත් වේ. විශ්‍රාමික හෝ දූ දරුවන්ගෙන් යැපෙන අවධියක් ලෙස දැකිය හැකි අතර ඒ ආශ්‍රිත ගැටළුකාරීත්වයන් සෘජුව හෝ වක්‍රාකාරයෙන් මෙම දිවි හානිකරගැනීම්වලට තුඩුදිය හැකිය. වගුවට අනුව පසුගිය වසර තුන තුළ එනම් 2016, 2017 සහ 2018 වසර තුනෙහි සියදිවි හානිකරගැනීම් සළකාබැලූ විට වයස අවුරුදු 70 ට වැඩි පුද්ගලයින්ගේ සියදිවි හානිකරගැනීම් ඉහළ අගයක් ගෙන තිබීම සැළකිල්ලට ලක්කළ යුතුය. 2016 වසරේ 336 දෙනෙකු, 2017 වසරේ 325 දෙනෙකු සහ 2018 වසරේ 326 දෙනෙකු ලෙස එම සියදිවි හානිකරගැනීම් සිදුව ඇත. සමාජයක ජ්‍යෙෂ්ඨ පුරවැසියන් ලෙස මෙබඳු පුද්ගලයින්ගේ සියදිවි හානිකරගැනීම්වලට බලපාන හේතු පිළිබඳ ඉතා පුළුල් අධ්‍යයනයක අවශ්‍යතාවය බැහැර කළ නොහැක.

ස්ත්‍රී පුරුෂභාවය අනුව සියදිවි හානිකරගැනීම් සැලකුවිට 2016, 2017 සහ 2018 යන වසර තුනෙහිම සමස්ථ සියදිවි නසාගැනීම්වල පුරුෂයින්ගේ නියෝජනය පිළිවෙලින් 77% ක් 79% ක් සහ 80% ක් ලෙස වර්ධනයක් දැකිය හැකිය.සමස්ථ සියදිවි හානිකරගැනීම්වල ස්ත්‍රීන්ගේ දිවිනසාගැනීම් ගත්විට වයස 08 සිට 30 දක්වා වයස් බාණ්ඩ 04 ක දත්ත සැලකිල්ලට ලක්කිරීමේ දී සෙසු වයස් බාණ්ඩවලට සාපේක්‍ෂව කාන්තාවන්ගේ සියදිවි නසාගැනීම්වල ඉහළ අගයක් හඳුනාගත හැකිය. සමස්ථයක් ලෙස 2016, 2017 සහ 2018 වසර තුනෙහි කාන්තාවන් ගේ සියදිවි නසාගැනීම් 23% , 21% සහ 20% ක් ලෙස ක්‍රමානුකූල අඩුවීමක් හඳුනාගත හැකිය.

# 06. සුරාව හා නිද්‍රාජනක ද්‍රව්‍ය සම්බන්ධ වැරදි

ශ්‍රී ලංකා පොලීසිය වෙත වාර්තා වූ සුරාව හා නිද්‍රාජනක ද්‍රව්‍ය සම්බන්ධ වැරදි මෙම පරිච්ඡේදය යටතේ දක්වා ඇත. මූලිකවම ශ්‍රී ලංකා පොලීසියේ මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය සහ විශේෂ කාර්ය බලකාය විශාල වැටලීම් සංඛ්‍යාවක් සිදුකරනු ලබන අතර පොලිස් ස්ථාන මට්ටමින් ද සුරාව හා නිද්‍රාජනක ද්‍රව්‍ය වැරදි සම්බන්ධ වැටලීම් නිරතුරුව සිදුකරනු ලබයි.

පහත වගු මගින් 2016 සහ 2017 වසරවල සුරාව සහ නිද්‍රාජනක ද්‍රව්‍ය සම්බන්ධ අත්අඩංගුවට ගැනීම් සහ නඩු පැවරීම් සම්බන්ධ තොරතුරු සංසන්දනාත්මකව ඉදිරිපත් කර ඇත.

## 6.1 සුරාව සම්බන්ධ වැරදි

ක්ෂේත්‍ර 12 කට අයත් සුරාව සම්බන්ධ වැරදි පසුගිය වසර 03 කට අදාළව පහත වගු මගින් දක්වා ඇත.

වගු අංක 13

**2016 – 2018 දක්වා සුරා වැරදි සම්බන්ධ වගුව**

| අනු අංකය | වරද | 2016 | | | | 2017 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා කරන ලද සංඛ්‍යාව | නඩු පවරන ලද සංඛ්‍යාව | වැරදිකරුවන් වූ පුද්ගලයින් සංඛ්‍යාව | නඩු පැවරීමේ ප්‍රතිශතය | වාර්තා කරන ලද සංඛ්‍යාව | නඩු පවරන ලද සංඛ්‍යාව | වැරදිකරුවන් වූ පුද්ගලයින් සංඛ්‍යාව | නඩු පැවරීමේ ප්‍රතිශතය | වාර්තා කරන ලද සංඛ්‍යාව | නඩු පවරන ලද සංඛ්‍යාව | වැරදිකරුවන් වූ පුද්ගලයින් සංඛ්‍යාව | නඩු පැවරීමේ ප්‍රතිශතය |
| 1 | නීති විරෝධි මත්පැන් නිෂ්පාදනය කිරීම හෝ පෙරීම | 10198 | 8869 | 7486 | 87% | 10658 | 9705 | 8292 | 91% | 11316 | 10242 | 8259 | 91% |
| 2 | බලපත්‍රයක් නොමැතිව මහ රා නිෂ්පාදනය කිරීම | 72 | 70 | 65 | 97% | 166 | 159 | 142 | 96% | 57 | 52 | 47 | 91% |
| 3 | නීති විරෝධි ලෙස රජයේ අරක්කු නිෂ්පාදනය කිරීම | 19 | 19 | 19 | 100% | 56 | 46 | 43 | 82% | 133 | 106 | 87 | 80% |
| 4 | නීති විරෝධි ලෙස ස්ප්‍රිතු වර්ග නිෂ්පාදනය කිරීම හෝ පෙරීම | 414 | 259 | 243 | 63% | 285 | 270 | 231 | 95% | 2346 | 1745 | 1473 | 74% |
| 5 | නීති විරෝධි මත්පැන් විකිණීම/ ලහතබා ගැනීම | 91376 | 84718 | 75297 | 93% | 93870 | 88490 | 81495 | 94% | 100373 | 93526 | 82364 | 93% |
| 6 | නීති විරෝධි මහ රා විකිණීම / ලහතබා ගැනීම | 6192 | 5890 | 5504 | 95% | 3725 | 3520 | 3376 | 94% | 3801 | 3410 | 2991 | 90% |
| 7 | බලපත්‍රයක් නොමැතිව රජයේ අරක්කු විකිනීම හෝ ලීටර් 7.5 කට වඩා ලහතබා ගැනීම | 7268 | 7012 | 6544 | 96% | 4967 | 4723 | 4321 | 95% | 4050 | 3759 | 3337 | 93% |
| 8 | බලපත්‍රයක් නොමැතිව බියර් වර්ග හා අනෙකුත් මත්පැන් වර්ග විකිණීම/ විකිණීම සඳහා ලහතබා ගැනීම | 584 | 561 | 537 | 96% | 985 | 967 | 924 | 98% | 614 | 544 | 473 | 89% |
| 9 | නීති විරෝධි ලෙස නිෂ්පාදනය කළ ස්ප්‍රීතු වර්ග ලහතබා ගැනීම හා විකිණීම | 431 | 392 | 310 | 91% | 1345 | 1325 | 890 | 99% | 682 | 642 | 524 | 94% |
| 10 | නීති විරෝධි මත්පැන් හෝ බලපත්‍රයක් නොමැතිව මහ රා / අනෙකුත් ස්ත්‍රීතු වර්ග/ රජයේ අරක්කු ප්‍රවාහනය කිරීම | 276 | 254 | 225 | 92% | 280 | 269 | 196 | 96% | 378 | 349 | 247 | 92% |
| 11 | නීති විරෝධි මත්පැන් / ස්ත්‍රීතු වර්ග/ මහ රා නිෂ්පාදනයට ගන්නා උපකරණ ලහතබා ගැනීම | 605 | 549 | 508 | 91% | 670 | 651 | 543 | 97% | 659 | 630 | 472 | 96% |
| 12 | සුරාබදු ආඥාපනත යටතට වැටෙන අනෙකුත් වැරදි | 2670 | 2435 | 2282 | 91% | 3191 | 2912 | 2569 | 91% | 5404 | 4509 | 3774 | 83% |
| | **එකතුව** | **120105** | **111028** | **99020** | **92%** | **120198** | **113037** | **103022** | **94%** | **129813** | **119514** | **104048** | **92%** |

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යාලේඛන ඒකකය

### ❖ දත්ත විශ්ලේෂණය

වගුවට අනුව සුරා වැරදිවල දෙවනුවට වැඩියෙන්ම වාර්තා වන වරද ලෙස නීති විරෝධි මත්පැන් නිෂ්පාදනය හෝ පෙරීමේ වරද දැක්විය හැකිය. 2016 වසරේ මෙම වැරදි 10198 ක් වාර්තා වී ඇති අතර ඉන් 87% කට එරෙහිව නඩු පැවරීම් සිදුකර ඇත. 2017 වසරේ වාර්තා වූ වැරදි ප්‍රමාණය 10658 ක් වූ අතර එය 2016 වසරට සාපේක්ෂව 4% ක වැඩිවීමකි. 2018 වසරේ නීති විරෝධි මත්පැන් නිෂ්පාදන වැරදි 11316 ක් වාර්තා වී ඇති අතර 2017 වසරට සාපේක්ෂව එය 6% ක ඉහළයාමකි. 2018 වසරේ මෙම වරද සඳහා නඩු පැවරීම් ප්‍රතිශතය 90% කි.

වගුවට අනුව පොලීසිය වෙත වැඩිපුරම වාර්තා වන සුරාව සම්බන්ධ වරද වන්නේ නීති විරෝධි මත්පැන් විකිණීම හා ළහතබාගැනීමයි. 2016 වසරේ මෙම වැරදි 91376 ක් වාර්තා වූ අතර එයින් වැරදි 84718 කට එනම් 93% කට නඩු පැවරා ඇත. 2017 වසරේ මෙම වැරදි 93870 ක් වාර්තා වී ඇති අතර 2016 වසරට සාපේක්ෂව මෙම වරද 3% කින් ඉහළයාමක් ලෙස හඳුනාගත හැකිය. 2017 වසරේ නඩු පැවරීම් ප්‍රතිශතයක් ලෙස 94% කි. 2018 වසරේ මෙම වැරදි 100373 දක්වා 2017 වසරට සාපේක්ෂව තවදුරටත් 7% කින් ඉහළ ගොස් ඇති අතර නඩු පැවරීම් ප්‍රතිශතය 93% කි.

නීති විරෝධී මහ රා විකිණීම හා ළඟතබාගැනීම ගත්විට 2016 වසරේ වාර්තා වූ වැරදි ප්‍රමාණය 6192 කි. එයින් 5890 ක් එනම් 95% ක් සඳහා නඩු පවරා ඇත. මෙම වැරදි 3725 ක් 2017 වසරේ වාර්තා වී ඇති අතර 2016 වසරට සාපේක්ෂව එය 40% ක පහළයාමකි. 2017 වසරේ නඩු පැවරූ වැරදි සංඛ්‍යාව 3520 ක් වූ අතර ප්‍රතිශතයක් ලෙස 94% ක් වේ. 2018 වසරේ නීති විරෝධී මහරා විකිණීම හෝ ළඟතබාගැනීමේ වැරදි 3801 ක් වාර්තා වී ඇති අතර 2017 වසරට සාපේක්ෂව එය 2% ක වැඩිවීමකි. 2018 වසරේ නඩු පැවරීම් ප්‍රතිශතයක් ලෙස 90% කි.

බලපත්‍රයක් නොමැතිව රජයේ අරක්කු විකිණීම හෝ ළඟතබාගැනීම ගත්විට 2016 – 2018 කාලසීමාව තුළ මෙම වැරදිවල සැළකිය යුතු අඩුවීමක් දක්නට ලැබේ.මේ සම්බන්ධ වැරදි 7268 ක් 2016 වසරේ වාර්තා වී ඇති අතර එම වැරදි 4967 ක් දක්වා 2017 වසරේ 32% කින් අඩු වී ඇත. 2018 වසරේ වාර්තා වූ වැරදි ප්‍රමාණය 4050 ක් වූ අතර 2017 වසරට සාපේක්ෂව 18% ක පහළයාමක් ලෙස දැක්විය හැකිය. මෙම වැරදි සඳහා නඩුපැවරීම් ප්‍රතිශතය ගත්විට 2016 වසරේ 96% ක් ද 2017 වසරේ 95% ක්ද වූ අතර 2018 වසරේ නඩු පැවරීම් ප්‍රතිශතය 93% කි.

වගුවට අනුව 2016 වසරේ සිට 2018 වසර දක්වා සුරාව සම්බන්ධ සමස්ථ වැරදි වාර්තා වීම් සැළකිල්ලට ලක්කළ විට 2016 වසරේ සුරා වැරදි 120105 ක් වාර්තා වූ අතර 2017 වසරේ එම වැරදි 120198 දක්වා වැඩිවීමක් පෙන්නුම් කර ඇත. 2018 වසරේ වාර්තා වූ සමස්ථ සුරා වැරදි ප්‍රමාණය 129813 ක් වූ අතර 2017 වසරට සාපේක්ෂව එය 8% ක ඉහළයාමකි.

සමස්ථ සුරා වැරදි සඳහා නඩු පැවරීම් ප්‍රතිශතයක් ලෙස ගත්විට 2016 වසරේ නඩු පැවරීම් ප්‍රතිශතය 92% කි. 2017 වසරේ නඩුපැවරීම් ප්‍රතිශතය 94% ක් වූ අතර 2018 වසරේ වාර්තා වූ සුරා වැරදි සඳහා නඩු පැවරීම් ප්‍රතිශතය 92% කි.



2018.03.23 වන දින පොලිස් මත්ද්‍රව්‍යනාශක කාර්යාංශය මගින් අත්අඩංගුවට ගත් නීතිවිරෝධී මත්පැන් සම්බන්ධ ඡායාරූපයක්

## 6.2 නිද්‍රාජනක ද්‍රව්‍ය සම්බන්ධ වැරදි

පුද්ගල හා සමාජ යහපැවැත්මට බරපතල අනතුරක් ගෙනදෙන අපරාධ ලෙස මෙම නිද්‍රාජනක ද්‍රව්‍ය සම්බන්ධ අපරාධ හඳුනාගත හැකිය. වගු අංක 14 මගින් 2016, 2017 සහ 2018 වසරවල මේ ක්ෂේත්‍රයේ වැරදි සංසන්දනාත්මකව දක්වා ඇත. බරපතල අපරාධ ගණයට ද ගැනෙන වරදක් වන මෙම නිද්‍රාජනක ද්‍රව්‍ය සම්බන්ධ වැරදිවල විශේෂිතම ලක්ෂණය නම් දිගින් දිගටම මෙම අපරාධවල වර්ධනයක් දක්නට ලැබීමයි.

වගු අංක 14 **2016 – 2018 දක්වා නිද්‍රාජනක ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම් වගුව**

| වර්ගය | | 2016 | | | | | | | 2017 | | | | | | | 2018 | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා වූ | නඩු පවරන ලද | වැරදිකරුවන් වූ පුද්ගලයින් සංඛ්‍යාව | නඩු පැවරීමේ ප්‍රතිශතය | අත්අඩංගුවට ගත් ප්‍රමාණය(කි.ග්‍රෑම්/ග්‍රෑම්/මි.ග්‍රෑම්) | | | වාර්තා වූ | නඩු පවරන ලද | වැරදිකරුවන් වූ පුද්ගලයින් සංඛ්‍යාව | නඩු පැවරීමේ ප්‍රතිශතය | අත්අඩංගුවට ගත් ප්‍රමාණය(කි.ග්‍රෑම්/ග්‍රෑම්/මි.ග්‍රෑම්) | | | වාර්තා වූ | නඩු පවරන ලද | වැරදිකරුවන් වූ පුද්ගලයින් සංඛ්‍යාව | නඩු පැවරීමේ ප්‍රතිශතය | අත්අඩංගුවට ගත් ප්‍රමාණය(කි.ග්‍රෑම්/ග්‍රෑම්/මි.ග්‍රෑම්) | | |
| | | | | | | කි.ග්‍රෑම් | ග්‍රෑම් | මි.ග්‍රෑම් | | | | | කි.ග්‍රෑම් | ග්‍රෑම් | මි.ග්‍රෑම් | | | | | කි.ග්‍රෑම් | ග්‍රෑම් | මි.ග්‍රෑම් |
| 1 | ගංජා | 54349 | 53426 | 51932 | 98% | 36818 | 698 | 506 | 67039 | 65534 | 61441 | 98% | 19720 | 216 | 987 | 71505 | 69886 | 63603 | 98% | 8884 | 457 | 162 |
| 2 | අබිං | 3 | 3 | 3 | 100% | 15 | 399 | 970 | 27 | 24 | 24 | 89% | 0 | 242 | 335 | 3 | 1 | 1 | 33% | 0 | 8 | 380 |
| 3 | හෂීස් | 39 | 37 | 35 | 95% | 27 | 443 | 650 | 79 | 74 | 71 | 94% | 39 | 42 | 554 | 199 | 189 | 161 | 95% | 82 | 291 | 597 |
| 4 | හෙරොයින් | 28327 | 27306 | 25074 | 96% | 205 | 140 | 430 | 36989 | 35440 | 31911 | 96% | 124 | 829 | 51 | 47355 | 44346 | 36356 | 94% | 721 | 363 | 175 |
| 5 | මෝෆීන් | 4 | 4 | 1 | 100% | 0 | 74 | 730 | 1 | 1 | 1 | 100% | 0 | 0 | 250 | 254 | 187 | 165 | 74% | 0 | 194 | 784 |
| 6 | කොකේන් | 37 | 14 | 39 | 38% | 1302 | 735 | 42 | 48 | 46 | 46 | 96% | 224 | 181 | 75 | 74 | 62 | 45 | 84% | 9 | 859 | 780 |
| 7 | වෙනත් | 5593 | 5540 | 5250 | 99% | 506 | 523 | 334 | 3761 | 3473 | 3176 | 92% | 939 | 638 | 415 | 5550 | 5381 | 4770 | 97% | 556 | 389 | 26 |
| එකතුව | | **88352** | **86330** | **82334** | **98%** | **38876** | **15** | **662** | **107944** | **104592** | **96670** | **97%** | **21048** | **150** | **667** | **124940** | **120052** | **105101** | **96%** | **1254** | **563** | **904** |

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යාලේඛන ඒකකය

## ❖ දත්ත විශ්ලේෂණය

වගුවට අනුව එක් එක් නිද්‍රාජනක ද්‍රව්‍ය පිළිබඳ වැරදි පසුගිය වසර තුනක දත්ත ඔස්සේ විශ්ලේෂණය කිරීමේ දී පෙනී යන්නේ එම වැරදිවල ඉහළයාමක් 2016, 2017 හා 2018 වසරවල හඳුනාගතහැකි බවයි. උදාහරණ ලෙස 2016 වසරේ ගංජා සම්බන්ධ වැරදි 54349 ක් වාර්තා වූ අතර 2017 වසරේ එම ප්‍රමාණය 67056 දක්වා 23% කින් ඉහළගොස් ඇත. 2017 වසර හා සංසන්දනය කරන විට 2018 වසරේ වාර්තා වූ ගංජා පිළිබඳ වැරදි ප්‍රමාණය 71505 ක් වූ අතර එය ප්‍රතිශතයක් ලෙස 7% වැඩිවීමකි. ගංජා සම්බන්ධ වැරදි සඳහා නඩු පැවරීම් ප්‍රතිශතයක් ලෙස ගත්විට 2016, 2017 සහ 2018 වසරවල 98% ක් ලෙස දැක්වේ.

හෙරොයින් සම්බන්ධ වැරදි සළකාබැලීමේ දී 2016 වසරේ වාර්තා වූ වැරදි ප්‍රමාණය 28327 කි. එය 2017 වසරේ 36989 දක්වා 30% කින් වර්ධනය වී ඇත. 2018 වසරේ හෙරොයින් සම්බන්ධ වැරදි වාර්තා වීම් 47355 ක් වූ අතර එය 2017 වසරට සාපේක්ෂව 28% ක වැඩිවීමකි. හෙරොයින් සම්බන්ධ වැරදි සඳහා නඩු පැවරීම් ගත්විට 2016 සහ 2017 වසරවල නඩු පැවරීම් ප්‍රතිශතය 96% ක් වූ අතර 2018 වසරේ එය 94% ක් දක්වා අඩු වී ඇත.

ඔපියම් සම්බන්ධ වැරදි 03 ක් 2016 වසරේ වාර්තා වූ අතර 2017 වසරේ වැරදි 27 ක් දක්වා ඉහළගොස් ඇත. කෙසේ වුවද 2018 වසරේ වාර්තා වී ඇත්තේ වැරදි 03 කි. ඔපියම් සම්බන්ධ වැරදිවල නඩු පැවරීම් ගත්විට 2016 වසරේ 100% ක නඩු පැවරීම් ප්‍රතිශතයක් දැකිය හැකි අතර 2017 වසරේ නඩු පැවරීම් ප්‍රතිශතය 89% කි. 2018 වසරේ වාර්තා වූ වැරදි තුනෙන් එකකට නඩු පවරා ඇති අතර එය 33% ක ප්‍රතිශතයකි.

අප රටතුළ කලක් ඉතා අවම මට්ටමින් වාර්තා වූ හෂීස්, මෝෆීන් සහ කොකේන් සම්බන්ධ වැරදිවල සැළකිය යුතු වැඩිවීමක් වගුවෙහි සඳහන් වසර තුනක දත්ත ඔස්සේ හඳුනාගත හැකිය. උදාහරණ ලෙස හෂීස් සම්බන්ධ වැරදි 39 ක් 2016 වසරේ වාර්තා වූ අතර එය 2017 වසර වන විට 79 ක් දක්වා 102% කින් ඉහළගොස් ඇත. 2018 වසරේ හෂීස් සම්බන්ධ වැරදි 199 ක් වාර්තා වී ඇති අතර 2017 වසරට සාපේක්ෂව එය 152% ක වැඩිවීමකි. හෂීස් සම්බන්ධ වැරදි සඳහා නඩු පැවරීම් ගත්විට 2016 වසරේ නඩු පැවරීම් ප්‍රතිශතය 95% ක් විය. 2017 එම ප්‍රතිශතය 94 ක් වූ අතර 2018 වසරේ නඩු පැවරීම් ප්‍රතිශතය 95% කි.

මෝෆීන් සම්බන්ධ වැරදි ගත් විට වගුවට අනුව 2016 වසරේ වාර්තා වූ ප්‍රමාණය 04 කි. 2017 වසරේ එම වැරදි 01 දක්වා 75% කින් අඩු වී ඇති අතර 2018 වසරේ නැවතත් මෝෆීන් සම්බන්ධ වැරදි 254 දක්වා ඉතා විශාල ලෙස ඉහළගොස් ඇත.

මෝෆීන් සම්බන්ධ වැරදි සඳහා නඩු පැවරීම් ප්‍රතිශතය 2016 සහ 2017 වසරවල 100% ක් වූ අතර 2018 වසරේ 74% ක් දක්වා නඩුපැවරීම් 2016 සහ 2017 වසරවලට සාපේක්ෂව පහළගොස් ඇත.

කොකේන් සම්බන්ධ වැරදි 37 ක් 2016 වසරේ වාර්තා වූ අතර 2017 වසර වන විට එය 48 ක් දක්වා 30% කින් ඉහළගොස් ඇත. 2018 වසරේ වාර්තා වූ වැරදි ප්‍රමාණය 74 ක් වූ අතර එය 2017 වසරට සාපේක්ෂව 54% ක ඉහළයාමක් ලෙස හඳුනාගත හැකිය. කොකේන් වැරදි සඳහා නඩුපැවරීම් ගත්විට 2016 වසරේ 38%

ක ප්‍රතිශතයක් දක්නට ලැබේ. 2017 වසරේ එම ප්‍රතිශතය 96% ක් වූ අතර 2018 වසරේ කොකේන් සම්බන්ධ වැරදි සඳහා නඩු පැවරීම් ප්‍රතිශතය 84% කි.

වගුවට අනුව පසුගිය වසර තුනෙහි සමස්ථ නිද්‍රාජනක වැරදි වාර්තාවීම් සැළකිල්ලට ගත්කල සමස්ථ වැරදිවල ඉහළයාම හඳුනාගත හැකිය. ඒ අනුව 2016 වසරේ වැරදි 88352 ක් වාර්තා වී ඇති අතර 2017 වසර වන විට වැරදි 107944 දක්වා 22% කින් ඉහළගොස් ඇත. 2018 වසරේ වාර්තා වූ නිද්‍රාජනක ද්‍රව්‍ය සම්බන්ධ වැරදි ප්‍රමාණය 124940 ක් වූ අතර ප්‍රතිශතයක් ලෙස එය 2017 වසරට සාපේක්‍ෂව 16% ක ඉහළයාමකි.

නිද්‍රාජනක වැරදි සඳහා අත්අඩංගුවට ගත් පුද්ගලයින් ප්‍රමාණය ද වගුවෙහි සඳහන් වසර තුනෙහි ඉහළයාමක් දක්නට ඇත. ඒ අනුව 2016 වසරේ අත්අඩංගුවට පත් සැකකරුවන් ප්‍රමාණය 82334 ක් වූ අතර 2017 වසරේ අත්අඩංගුවට පත් සැකකරුවන් ප්‍රමාණය 96670 ක් දක්වා 17% කින් ඉහළගොස් ඇත. 2018 වසරේ සැකකරුවන් 108581 ක් නිද්‍රාජනක වැරදි සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන ඇති අතර එය 2017 වසරට සාපේක්‍ෂව 12% ක ඉහළයාමකි.

සමස්ථ නිද්‍රාජනක වැරදි සඳහා නඩු පැවරීම් සළකා බැලූවිට 2016 වසරේ නඩුපැවරීම් ප්‍රතිශතයක් ලෙස 98% කි. 2017 වසරේ සමස්ථ නඩු පැවරීම් ප්‍රතිශතය 97% ක් වූ අතර 2018 වසරේ සමස්ථ නිද්‍රාජනක වැරදි සඳහා නඩු පැවරීම් ප්‍රතිශතය 96% කි.



2018.03.23 දින මත්ද්‍රව්‍යනාශක කාර්යාංශය මගින් අත්අඩංගුවට ගත් මත්ද්‍රව්‍යයන්හි ඡායාරූපයක්

### 6.3 විශේෂ කාර්ය බලකාය විසින් සිදුකළ සුරාව සහ නිද්‍රාජනක ද්‍රව්‍ය වැටලීම්

සුරාව හා නිද්‍රජනක ද්‍රව්‍ය වැටලීම් සහ අත්අඩංගුවට ගැනීම් සිදුකිරීමේදී පොලිස් විශේෂ කාර්ය බලකාය ද විශේෂිත කාර්යභාරයක් ඉටුකරනු ලැබ ඇත.

ඒ අනුව 2018 වසරේ විශේෂ කාර්ය බලකාය මගින් සිදුකරන ලද නීතිවිරෝධී මත්ද්‍රව්‍ය සහ සුරාව සම්බන්ධ වැටලීම් සහ අත්අඩංගුවට ගැනීම් පිළිබඳ තොරතුරු පහත වගු අංක 15 සහ 16 මගින් ඉදිරිපත් කර ඇත.

වගු අංක 15 **2018 වසරේ විශේෂ කාර්ය බලකාය සිදුකළ සුරා වැටලීම් වගුව**

| වරද | වැටලීම් ගණන | සැකකරුවන් ගණන | අත්අඩංගුවට ගත් ප්‍රමාණය (ලී/මි.ලී.) | වටිනාකම රු. |
|---|---|---|---|---|
| නිති විරෝධී මත්පැන් | 1,238 | 1,238 | නි.වි.ම. ලීටර 24,952<br>මි.ලී. 40 | 11,652,602.68 |
| බලපත්‍ර නොමැතිව රජයේ අරක්කු විකිණීම | 69 | 74 | අරක්කු බෝතල් 1,036<br>බියර් ටින් 1,463 | 1,322,280.00 |
| විදේශිය මත්පැන් | 21 | 22 | ලීටර 5,449<br>බියර් ටින් 368 | 10,138,635.75 |
| **එකතුව** | **1328** | **1334** | **-** | **23,113,518.43** |

මූලාශ්‍රය - පොලිස් විශේෂ කාර්ය බලකාය

වගු අංක 16 **2018 වසරේ විශේෂ කාර්ය බලකාය සිදුකළ නිද්‍රා ජනක ද්‍රව්‍ය වැටලීම් වගුව**

| වරද | වැටලීම් ගණන | සැකකරුවන් ගණන | අත්අඩංගුවට ගත් ප්‍රමාණය (කි.ග්‍රෑම්/ග්‍රෑම්/මි.ග්‍රෑම්) | වටිනාකම රු. |
|---|---|---|---|---|
| හෙරෝයින් | 926 | 951 | කි.ග්‍රෑ. 275 ග්‍රෑම් 263 මි.ග්‍රෑම් 172 | 2,752,631,720.00 |
| ගංජා | 224 | 225 | කි.ග්‍රෑ. 213 ග්‍රෑම් 244 මි.ග්‍රෑම් 956 | 29,496,394.42 |
| කේරළ ගංජා | 310 | 315 | කි.ග්‍රෑ. 1056 ග්‍රෑම් 569 මි.ග්‍රෑම් 406 | 137,352,747.78 |
| ගංජා වගාව | 353 | 71 | පැළ 1,613,104<br>අක්කර 111 ½ | - |
| විදේශීය දුම්වැටි | 96 | 100 | 422,073 | 21,164,630.00 |
| මානසික රෝග සඳහා දෙන පෙති<br>(psychotropic) | 49 | 50 | පෙති 24,521<br>කරල් 06 | 4,366,605.00 |
| කොකේන් | 5 | 5 | කි.ග්‍රෑ. 5 ග්‍රෑම් 336 මි.ග්‍රෑම් 439 | - |
| කුෂ් | 4 | 4 | ග්‍රෑම් 23 මි.ග්‍රෑම් 760 | - |
| අයිස් | 14 | 14 | කි.ග්‍රෑ. 01 ග්‍රෑම් 014 මි.ග්‍රෑම් 578 | - |
| හෂිෂ් | 7 | 8 | කි.ග්‍රෑ. 05 ග්‍රෑම් 827 මි.ග්‍රෑම් 630 | - |
| වෙනත් (මාවා, අළු, හැෂ්, අබින්, | 42 | 43 | - | 0 |
| එකතුව | 2,030 | 1,786 | - | 2,945,012,097.2 |

මූලාශ්‍රය - පොලිස් විශේෂ කාර්ය බලකාය

# 07 දූෂණ හා ව්‍යවස්ථාපිත වැරදි

මෙම පරිච්ඡේදය යටතේ ගැනෙන දූෂණ වැරදිවලට අමතරව වෙනත් වැරදි බොහොමයක් සඳහා ශ්‍රී ලංකා පොලීසිය තුළ දූෂණ වැරදි යන නම ව්‍යවහාර වේ. උදාහරණ ලෙස සුරාව සහ නිද්‍රාජනක ද්‍රව්‍ය පිළිබඳ වැරදි ද මෙම දූෂණ වැරදි ගණයට ගැනේ. පොදුවේ වෙන් වෙන් මාතෘකා යටතේ පුළුල් ලෙස විශ්ලේෂණය කළ හැකිවීම ඇතැම් දූෂණ වැරදි ඊට අදාළ නමින්ම ඉදිරිපත් කිරීමේ අරමුණ වී තිබේ. මීට අමතරව විශේෂ ව්‍යවස්ථාපිත පනත් මගින් දක්වා ඇති වැරදි ද මෙම පරිච්ඡේදය මගින් ඉදිරිපත් කරනු ලැබේ.

## 7.1 දූෂණ වැරදි

සමාජයක් තුළින් අපේක්ෂිත සදාචාරය සහ යහපැවැත්ම කෙරෙහි අහිතකර ලෙස බලපාන වැරදි ලෙස මෙම දූෂණ වැරදි හැඳින්විය හැකිය. කරුණු හයක් යටතේ පොලීසිය වෙත මෙම දූෂණ වැරදි වාර්තා වී ඇති අතර පහත වගු අංක 17 මගින් 2016 වසරේ සිට 2018 වසර දක්වා සංසන්දනාත්මකව මෙම දූෂණ වැරදි දක්වා ඇත.

වගු අංක 17 **2016 – 2018 දක්වා දූෂණ වැටලීම් සම්බන්ධ වගුව**

| අනු අංකය | වරද | 2016 | | | | | 2017 | | | | | 2018 | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා වූ | නඩු පවරන ලද සංඛ්‍යාව | නඩු පැවරීම ප්‍රතිශතය | නඩු පවරන ලද පුද්ගලයින් සංඛ්‍යාව | | වාර්තා වූ | නඩු පවරන ලද සංඛ්‍යාව | නඩු පැවරීම ප්‍රතිශතය | නඩු පවරන ලද පුද්ගලයින් සංඛ්‍යාව | | වාර්තා වූ | නඩු පවරන ලද සංඛ්‍යාව | නඩු පැවරීම ප්‍රතිශතය | නඩු පවරන ලද පුද්ගලයින් සංඛ්‍යාව | |
| | | | | | පුරුෂ | ස්ත්‍රී | | | | පුරුෂ | ස්ත්‍රී | | | | පුරුෂ | ස්ත්‍රී |
| 1 | වෛශ්‍යා වෘත්තිය | 628 | 627 | 100% | 10 | 662 | 522 | 516 | 99% | 183 | 495 | 441 | 414 | 94% | 15 | 456 |
| 2 | ගණිකා නිවාස | 118 | 114 | 97% | 79 | 281 | 262 | 255 | 97% | 181 | 606 | 278 | 261 | 94% | 141 | 725 |
| 3 | පෙළඹවීම් (වයස 18 ට අඩු ළමයෙක් ලිංගික අපයෝජනය සඳහා) | 14 | 9 | 64% | 3 | 6 | 0 | 0 | | 0 | 0 | 4 | 4 | 100% | 6 | 5 |
| 4 | සමලිංගික සම්බන්ධතා | 17 | 17 | 100% | 33 | 0 | 4 | 3 | 75% | 6 | 0 | 5 | 5 | 100% | 9 | 0 |
| 5 | සෙළුව පෙන්වීම, කාමුක ලෙස එබිකම් කිරීම සහ හිරිහැරවීම සහ හිරිඔතප් බිඳීම | 130 | 111 | 85% | 100 | 0 | 61 | 51 | 84% | 36 | 0 | 89 | 55 | 62% | 67 | 0 |
| 6 | අසභ්‍ය කාඩ්පත්, ඡායාරූප හා පත්‍රිකා විකිණීම | 348 | 339 | 97% | 333 | 3 | 206 | 200 | 97% | 205 | 0 | 137 | 129 | 94% | 118 | 7 |
| | **එකතුව** | **1255** | **1217** | **97%** | **558** | **952** | **1055** | **1025** | **97%** | **611** | **1101** | **954** | **868** | **91%** | **356** | **1193** |

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යාලේඛන ඒකකය

❖ **දත්ත විශ්ලේෂණය**

වගුවට අනුව පසුගිය 2016, 2017 හා 2018 යන වසරවල සමස්ථ දූෂණ වැරදිවල සැළකිය යුතු අඩුවීමක් පෙන්නුම්කර ඇත. ඒ අනුව වෛශ්‍යා වෘත්තියෙහි යෙදීමේ වැරදි 2016 වසරෙහි 628 ක් වාර්තා වී තිබූ අතර 2017 වසරේ එය 522 දක්වා 17% කින් පහළ ගොස් ඇත. 2018 වසර වන විට වැරදි 441 දක්වා 15% කින් තවදුරටත් අඩු වී ඇති අයුරු දත්ත මගින් පෙන්නුම් කර ඇත. වෛශ්‍යා වෘත්තිය වරදට නඩු පැවරීම් ප්‍රතිශතය 2016 වසරේ 100% ක් වූ අතර 2017 වසරේ එය 99% ක් විය. 2018 වසරේ වෛශ්‍යා වෘත්තිය සඳහා නඩුපැවරීම් 94% දක්වා අඩුවී ඇත.

ළමයින් ලිංගික අපයෝජනය සඳහා පෙළඹවීමේ වරද ගත්විට 2016 වසරේ වාර්තා වූ වැරදි ප්‍රමාණය 14 කි. 2017 වසරේ කිසිදු වරදක් වාර්තා නොවූ අතර 2018 වසරේ වැරදි 04 ක් වාර්තා වී ඇති අතර 2016 වසරට සාපේක්ෂව 2018 වසරේ මෙම වැරදි 71% කින් අඩු වී ඇත. ළමයින් ලිංගික අපයෝජනයට පෙළඹවීමේ වැරදි සඳහා 2016 වසරේ නඩුපැවරීම් ප්‍රතිශතයක් ලෙස 64% කි. 2018 වසරේ නඩුපැවරීම් ප්‍රතිශතය 100% ක් දක්වා වර්ධනය වී ඇත.

අසභ්‍ය කාඩ්පත්, පත්‍රිකා, ඡායාරූප විකිණීමේ වැරදි 348 ක් 2016 වසරෙහි වාර්තා වූ අතර එය 206 දක්වා 2017 වසරෙහි 41% කින් පහළ ගොස් තිබුණි. 2018 වසරේ එම වැරදි 137 දක්වා 33% කින් තවදුරටත් පහත වැටී ඇත.

මෙම වැරදි සඳහා නඩු පැවරීමේ ප්‍රතිශතය සැලකූ විට 2016 සහ 2017 වසරවල නඩුපැවරීම් 97% ක ප්‍රතිශතයක් පැවති අතර 2018 වසරේ එය 94% දක්වා අඩුවීමක් පෙන්නුම් කෙරේ.

කාමුක එබ්බැලීම, සෙළුව පෙන්වීම හා හිරි ඔතප් බිඳීම සම්බන්ධ වැරදි 2016 වසරේ වාර්තා වූ ප්‍රමාණය 130 ක් වූ අතර 2017 වසරේ 61 දක්වා එම වැරදි 53% කින් පහළ ගොස් තිබුණි. 2018 වසරේ එම වැරදි 89 ක් වාර්තා වූ අතර 2017 වසරට සාපේක්ෂව එය 46% ක ඉහළයාමකි. මේ සම්බන්ධ නඩුපැවරීම් ගත්විට 2016 වසරේ 85% ක ප්‍රතිශතයක් වූ අතර 2017 වසරේ මෙම වැරදි සඳහා නඩුපැවරීම් ප්‍රතිශතය 84% කි. 2018 වසරේ නඩුපැවරීම් ප්‍රතිශතයක් ලෙස 62% දක්වා අඩු වී ඇත.

සමලිංගික සබඳතා වැරදි 17 ක් 2016 වසරේ වාර්තා වී ඇති අතර 2017 වසරේ සමලිංගික වැරදි 04 දක්වා 76% කින් අඩු වී ඇත. 2018 වසරේ වැරදි 05 ක් වාර්තා වූ අතර 2017 වසරට සාපේක්ෂව ප්‍රතිශතයක් ලෙස 25% ක වැඩිවීමක් ලෙස දැක්විය හැකිය. සමලිංගික සබඳතා සඳහා නඩුපැවරීම් ගත්විට 2016 වසරේ 100% ක ප්‍රතිශතයක් පෙන්නුම් කරන අතර 2017 වසරේ 75% ක් දක්වා එම ප්‍රතිශතය අඩු වී ඇත. 2018 වසරේ නඩුපැවරීම් ප්‍රතිශතය 100% දක්වා වර්ධනය වී ඇත.

ගණිකා නිවාස පවත්වාගෙනයාම සම්බන්ධ වැරදිවල වැඩිවීමක් පසුගිය වසර 03 තුළ හඳුනාගත හැකිය. වගුවට අනුව 2016 වසරේ වාර්තා වූ වැරදි ප්‍රමාණය 118 ක් වූ අතර 2017 වසරේ 262 දක්වා 122% කින් මෙම වැරදි ඉහළ ගොස් ඇත. එමෙන්ම 2018 වසරේ ගණිකා නිවාස පවත්වාගෙන යාමේ වැරදි 278 ක් වාර්තා වී ඇති අතර එය 2017 වසරට වඩා 6% ක ඉහළයාමකි. නඩුපැවරීම් සම්බන්ධ දත්තවලට අනුව 2016 වසරේ ගණිකා නිවාස පවත්වාගැනීමේ වැරදිවලින් 97% කට නඩු පවරා ඇති අතර 2017 වසරේ ද 97% ක නඩුපැවරීම් ප්‍රතිශතයක් අත්කරගෙන ඇත. 2018 වසරේ නඩුපැවරීම් ප්‍රතිශතයක් ලෙස 94% ක අගයක් පෙන්නුම් කර ඇත.

වගුවෙහි ඇතුළත් සමස්ථ දූෂණ වැරදිවල වාර්තා වීම 2016 වසරේ 1255 ක් වූ අතර 2017 වසරේ 1055 දක්වා 16% කින් දූෂණ වැරදි පහළගොස් ඇත. 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ මෙම වැරදි 954 දක්වා තවදුරටත් 9% කින් පහළගොස් ඇත.

දූෂණ වැරදි සම්බන්ධයෙන් සැකකරුවන් අත්අඩංගුවට ගැනීම් සළකාබැලූ විට වගුවට අනුව 2016 වසරේ ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයේම සැකකරුවන් 1510 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇති අතර 2017 වසරේ අත්අඩංගුවට ගත් ප්‍රමාණය 1712 දක්වා 13% කින් ඉහළගොස් ඇත. 2018 වසරේ අත්අඩංගුවට පත්වූ ප්‍රමාණය 1549 ක් වූ අතර එය 2017 වසරට සාපේක්ෂව 9% ක අඩුවීමකි. මෙම අත්අඩංගුවට ගත් පුද්ගලයින් අතර වැඩි පිරිස කාන්තාවන් වීම ද විශේෂ ලක්ෂණයකි. 2016 වසරේ අත්අඩංගුවට පත් පුද්ගලයින් 1510 කින් 952 ක් එනම් 63% ක් කාන්තාවන් වූ අතර 2017 වසරේ අත්අඩංගුවට පත් පුද්ගලයින්ගෙන් 64% ක් කාන්තාවන් ලෙස හඳුනාගත හැකිය. 2018 වසරේ දූෂණ වැරදි සඳහා අත්අඩංගුවට පත් පුද්ගලයින්ගෙන් 77% ක් කාන්තාවන් බව වගුවට අනුව පැහැදිලි වේ.

### 7.2 ව්‍යවස්ථාපිත වැරදි

විවිධ අණපනත් මගින් දක්වා ඇති වැරදි ඛාණ්ඩ 31 ක් යටතේ වර්ගීකරණය කර මෙම අනුඡේදය යටතේ දක්වා ඇත. 2018.12.31 දින දක්වා ශ්‍රී ලංකා පොලීසිය වෙත වාර්තා වූ මෙම ව්‍යවස්ථාපිත වැරදි 2016 සහ 2017 වසරවල වාර්තා වූ ව්‍යවස්ථාපිත වැරදි සමඟ සංසන්දනාත්මකව වගු අංක 18 මගින් ඉදිරිපත් කර ඉන් වශේෂිත වැරදි කිහිපයක් පිළිබඳ දත්ත විශ්ලේෂණාත්මකව දක්වා ඇත.

වගු අංක 18

**2016 – 2018 දක්වා ව්‍යවස්ථාපිත පනත් යටතේ සිදුකරනු ලබන වැරදි වගුව**

| අනු අංකය | වරද | 2016 | | | | 2017 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා වූ | විමර්ශනය වෙමින් පවතින | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා වූ | විමර්ශනය වෙමින් පවතින | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා වූ | විමර්ශනය වෙමින් පවතින | විසඳූ | විසඳීමේ ප්‍රතිශතය |
| 1 | 1984 අංක 15 විදුලිබල පනත - හොරෙන් විදුලිය ලබාගැනීම | 1504 | 46 | 1458 | 97% | 952 | 36 | 916 | 96% | 912 | 22 | 890 | 98% |
| 2 | අයාල ආඥාපනත යටතේ කරනු ලබන වැරදි | 2575 | 5 | 2570 | 100% | 2711 | 143 | 2568 | 95% | 1140 | 117 | 1023 | 90% |
| 3 | සත්ත්ව වධහිංසා පනත යටතේ කරනු ලබන වැරදි | 986 | 45 | 941 | 95% | 934 | 52 | 882 | 94% | 772 | 38 | 734 | 95% |
| 4 | බලපත්‍ර නොමැතිව ඉන්ධන ලබාගැනීම හෝ විකිණීම | 236 | 12 | 224 | 95% | 173 | 4 | 169 | 98% | 227 | 21 | 206 | 91% |
| 5 | පුරාවස්තු සොරකම් කිරීම හෝ විනාශ කිරීම හෝ ළඟ තබාගැනීම | 175 | 29 | 146 | 83% | 208 | 41 | 167 | 80% | 252 | 47 | 205 | 81% |
| 6 | සූදු ආඥාපනත යටතේ කරන ලද වැරදි | 1711 | 40 | 1671 | 98% | 1685 | 43 | 1642 | 97% | 1587 | 83 | 1504 | 95% |
| 7 | රේගු ආඥාපනත යටතේ කරනු ලබන වැරදි | 86 | 3 | 83 | 97% | 150 | 4 | 146 | 97% | 35 | 2 | 33 | 94% |
| 8 | තේ හා රබර් ආඥාපනත යටතේ කරනු ලබන වැරදි | 54 | 3 | 51 | 94% | 66 | 2 | 64 | 97% | 27 | 2 | 25 | 93% |
| 9 | 1981 අංක 87 හා 1988 අංක 64 දරණ පනතින් සංශෝධනය වූ වෙරළ සංරක්ෂණ පනත යටතේ කරන ලද වැරදි | 155 | 6 | 149 | 96% | 264 | 18 | 246 | 93% | 142 | 6 | 136 | 96% |
| 10 | ව්‍යාජ ලෙස සී.ඩී/ වී.සී.ඩී/ ඩී.වී.ඩී තැටි නීති විරෝධි ලෙස සකස් කිරීම | 145 | 7 | 138 | 95% | 137 | 5 | 132 | 96% | 80 | 2 | 78 | 98% |
| 11 | 1968 අංක 56 දරන පාරිසරික පනතේ 23 (අ), 23 (ඒ) 123 (අ) 1, 23 (ක) 1, 23 (ජ) 1, 23 (අඅ) 23 (ඉඉ) වගන්ති යටතේ කරන ලද වැරදි | 4733 | 310 | 4423 | 93% | 5663 | 211 | 5452 | 96% | 3849 | 294 | 3555 | 92% |
| 12 | තහනම් පිහිය ලඟතබා ගැනීම | 306 | 7 | 299 | 98% | 272 | 11 | 261 | 96% | 238 | 17 | 221 | 93% |
| 13 | බලපත්‍රයක් නොමැතිව පුපුරණ ද්‍රව්‍ය ලඟතබා ගැනීම/ ප්‍රවාහනය කිරීම/ විකිණීම | 29 | 0 | 29 | 100% | 192 | 4 | 188 | 98% | 23 | 1 | 22 | 96% |
| 14 | බලපත්‍රයක් නොමැතිව පුපුරණ ද්‍රව්‍ය ලඟතබා ගැනීම/ ප්‍රවාහනය කිරීම/ විකිණීම | 90 | 6 | 84 | 93% | 132 | 10 | 122 | 92% | 109 | 12 | 97 | 89% |
| 15 | බලපත්‍රයක් නොමැතිව පතොරම් ලඟතබා ගැනීම/ ප්‍රවාහනය කිරීම/ විකිණීම | 213 | 4 | 209 | 98% | 111 | 8 | 103 | 93% | 148 | 13 | 135 | 91% |
| 16 | බීමත්ව කරන ලද වැරදි - 1979 අංක 41 දරන පනත | 14776 | 410 | 14366 | 97% | 13481 | 495 | 12986 | 96% | 10248 | 590 | 9658 | 94% |
| 17 | බලපත්‍රයක් නොමැතිව තුවක්කු නිෂ්පාදනය කිරීම/ ලඟතබා ගැනීම/ ප්‍රවාහනය කිරීම/ විකිණීම | 916 | 53 | 863 | 94% | 1171 | 82 | 1089 | 93% | 1307 | 93 | 1214 | 93% |
| 18 | ධීවර ආඥාපනත යටතේ කරන ලද වැරදි | 840 | 19 | 821 | 98% | 526 | 30 | 496 | 94% | 388 | 32 | 356 | 92% |
| 19 | ඩයිනමයිට්/ පුපුරණ ද්‍රව්‍ය දමා මසුන් ඇල්ලීම | 34 | 2 | 32 | 94% | 22 | 3 | 19 | 86% | 25 | 3 | 22 | 88% |
| 20 | ලයිට්කෝස් ක්‍රමය භාවිතාකර මසුන් ඇල්ලීම | 2 | 0 | 2 | 100% | 5 | 1 | 4 | 80% | 5 | 0 | 5 | 100% |
| 21 | 1970 අංක 01 දරන සංශෝධිත වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්‍ෂා කිරිමේ පනත යටතේ වැරදි | 819 | 65 | 754 | 92% | 848 | 63 | 785 | 93% | 577 | 65 | 512 | 89% |
| 22 | ආරක්ෂිත සතුන් දඩයම් කිරීම | 117 | 1 | 116 | 99% | 73 | 3 | 70 | 96% | 78 | 7 | 71 | 91% |
| 23 | බලපත්‍රයක් නොමැතිව සත්ත්ව කොටස් ලඟතබා ගැනීම | 168 | 9 | 159 | 95% | 178 | 24 | 154 | 87% | 170 | 9 | 161 | 95% |
| 24 | දඩමස් ලඟතබා ගැනීම | 472 | 17 | 455 | 96% | 620 | 28 | 592 | 95% | 510 | 35 | 475 | 93% |
| 25 | 1966 අංක 13 දරන වන ආඥාපනත යටතේ කරන ලද වැරදි | 1000 | 164 | 836 | 84% | 715 | 60 | 655 | 92% | 459 | 75 | 384 | 84% |
| 26 | රක්ෂිත වනය විනාශ කිරීම, හානි කිරීම හෝ ගස්කැපීම | 594 | 66 | 528 | 89% | 515 | 74 | 441 | 86% | 435 | 109 | 326 | 75% |
| 27 | නීති විරෝධි ලෙස වැලි / පස් ගොඩදැමීම හෝ ප්‍රවාහනය | 9947 | 291 | 9656 | 97% | 13906 | 350 | 13556 | 97% | 13693 | 434 | 13259 | 97% |
| 28 | නීති විරෝධි ලෙස දැව ප්‍රවාහනය කිරීම | 1584 | 159 | 1425 | 90% | 1558 | 148 | 1410 | 91% | 1335 | 203 | 1132 | 85% |
| 29 | මැණික් හා ස්වර්ණාභරණ ආඥාපනත යටතේ කරන ලද වැරදි | 199 | 35 | 164 | 82% | 177 | 0 | 177 | 100% | 205 | 18 | 187 | 91% |
| 30 | නීති විරෝධි මැණික් ගැරීම | 935 | 99 | 836 | 89% | 710 | 111 | 599 | 84% | 597 | 48 | 549 | 92% |
| 31 | වෙනත් | 770 | 81 | 689 | 89% | 858 | 92 | 766 | 89% | 1034 | 107 | 927 | 90% |
| **එකතුව** | | **46171** | **1994** | **44177** | **96%** | **49013** | **2156** | **46857** | **96%** | **40607** | **2505** | **38102** | **94%** |

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යාලේඛන ඒකකය

❖ දත්ත විශ්ලේෂණය

වගුවෙහි දත්ත විශ්ලේෂණාත්මකව විමසාබැලීමේ දී පෙනී යන්නේ පසුගිය වසර තුනක කාලය තුළ ව්‍යවස්ථාපිත වැරදි විවිධ අඩුවැඩිවීම් ඔස්සේ වාර්තා වී ඇති ආකාරයයි.

වගුවට අනුව විදුලිබල පනත මගින් තහනම් කර ඇති විදුලිය හොරෙන් ලබාගැනීමේ වැරදි ගත්විට 2016 වසරේ මෙම වැරදි 1504 ක් වාර්තා වී ඇති අතර 2017 වසරේ දී එම වැරදි 952 දක්වා 37% කින් අඩුවී ඇත. එමෙන්ම 2018 වසරේ විදුලිබලය හොරෙන් ලබාගැනීම් 912 ක් වාර්තා වී ඇති අතරඑය 2017 වසරට සාපේක්ෂව 4% කින් අඩු වීමකි. විදුලිය හොරෙන් ලබාගැනීමේ වැරදි සඳහා විසඳුම් ලබාදී ඇති ප්‍රමාණය 2016 වසරේ 97% ක් වූ අතර 2017 වසරේ 96% ක ප්‍රතිශතයකි. 2018 වසරේ එම ප්‍රතිශතය 97% දක්වා වර්ධනය වී ඇත.

වගුවට අනුව අයාල ආඥාපනත යටතේ සිදුකරන ලද වැරදිවල ද අඩුවීමක් 2018 වසරේ පෙන්නුම් කෙරේ. 2016 වසරේ මෙම වැරදි 2575 ක් වාර්තා වී ඇති අතර 2017 වසරේ එය 2711දක්වා 5% කින් වර්ධනය වී ඇත. අයාල ආඥාපනත යටතේ ගැනෙන වැරදි 1140 ක් 2018 වසරේ වාර්තා වී ඇති අතර 2017 වසරට සාපේක්ෂව එය 58% ක පහළයාමකි.

මෙම අයාල ආඥා පනතේ වැරදි සඳහා නඩුපැවරීම මගින් විසඳුම් ලබා දී ඇති ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස ගත්කල 2016 වසරේ 99% ක් ද 2017 වසරේ 95% ක් ද 2018 වසරේ 90% ක් ද ලෙස දැක්විය හැකිය.

සත්ත්ව හිංසා පනත යටතේ දැක්වෙන වැරදි සැළකිල්ලට ලක්කිරීමේ දී පසුගිය වසර තුන තුළම එම වැරදිවල ද පහළයාමක් දැකිය හැක. වගුවට අනුව 2016 වසරේ 986 ක් ලෙස වාර්තා වූ මෙම වැරදි 2017 වසරේ 934 ක් දක්වා 5% කින් පහත වැටී ඇත. 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ තවදුරටත් 772 දක්වා මෙම වැරදි 17% කින් පහළ ගොස් ඇත. නඩුපැවරීම් ප්‍රතිශතය ගත්විට 2016 වසරේ 95% ක් වූ අතර 2017 වසරේ 94% කි. 2018 වසරේ සත්ත්ව හිංසාව සම්බන්ධ වැරදි සඳහා නඩුපැවරීම් ප්‍රතිශතයක් ලෙස 95% කි.

පුරාවස්තු පිළිබඳ සංශෝධිත ආඥා පනත යටතේ ගැනෙන වැරදිවල යම් ඉහළයාමක් වගුවෙහි දත්ත මගින් හඳුනාගත හැකිය. 2016 වසරේ වාර්තා වී ඇති වැරදි ප්‍රමාණය 175 ක්වූ අතර එය 208 දක්වා 2017 වසරේ 19% කින් ඉහළගොස් ඇත. 2018 වසරේ මෙම පුරාවස්තු සම්බන්ධ වැරදි 252 දක්වා 21% කින් තවදුරටත් ඉහළගොස් ඇත. පුරාවස්තු වැරදි සඳහා නඩු පැවරීම් සිදුකර ඇති ආකාරය ගත්විට 2016 වසරේ 81% ක ප්‍රතිශතයකින් නඩුපවරා ඇති අතර 2017 වසරේ නඩුපැවරීම් ප්‍රතිශතය 80% කි. 2018 වසරේ ද නඩුපැවරීම් ප්‍රතිශතය 81% කි.

වගුවට අනුව සුදු ආඥාපනත යටතේ ගැනෙන වැරදිවල ද 2016 – 2018 කාලසීමාව තුළ අඩුවීමක් දක්නට ඇත. 2016 වසරේ මෙම වැරදි 1711 ක් වාර්තා වී ඇති අතර 2017 වසරේ එම වැරදි 1685 දක්වා 1% කින් අඩුවී ඇත. 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ සුදු ආඥාපනතේ දැක්වෙන වැරදි 1587 දක්වා 6% කින් අඩු වී ඇත. සුදු ආඥාපනත යටතේ ගැනෙන වැරදි සඳහා විසඳුම් ලබාදීම 2016 වසරේ 98% ක ප්‍රතිශතයක් වූ අතර 2017 වසරේ 97% කි. 2018 වසරේ නඩුපැවරීම් ප්‍රතිශතය 95% දක්වා අඩුවීමක් හඳුනාගත හැකිය.

වගුවට අනුව රේගු ආඥාපනත යටතේ ගැනෙන වැරදිවල ද සැළකිය යුතු අඩුවීමක් පසුගිය වසර කිහිපය තුළ හඳුනාගත හැකිය. ඒ අනුව 2016 වසරේ රේගු ආඥාපනත යටතේ ගැනෙන වැරදි 86 ක් වාර්තා වූ අතර 2017 වසරේ එම වැරදි 150 දක්වා 74% කින් ඉහළ ගොස් ඇත. 2018 වසරේ වාර්තා වී ඇති රේගු වැරදි ප්‍රමාණය 35 කි. එය 2017 වසරට සාපේක්ෂව 77% ක අඩුවීමක් ලෙස හඳුනාගත හැකිය. නඩුපැවරීම් මගින් රේගු වැරදි සඳහා විසඳුම් ලබාදීමේ ප්‍රතිශතය 2016 වසරේ 96% ක් වූ අතර 2017 වසරේ 97% දක්වා නඩුපැවරීම් ඉහළගොස් ඇත. 2018 වසරෙහි රේගු ආඥාපනත යටතේ ගැනෙන වැරදිවල විසඳීම් ප්‍රතිශතය 94% කි.

වෙරළ ආශ්‍රිත මිනිස් ක්‍රියාකාරකම් තුළින් නිර්මාණය වන වෙරළාශ්‍රිත පාරිසරික විනාශය බරපතල පාරිසරික අර්බුදයක් ලෙස හඳුනාගත හැකිය.

වෙරළ සංරක්ෂණ පනත මගින් මෙම ක්‍රියාකාරකම් තහනම් කර තිබුණ ද පසුගිය කාලසීමාව තුළ පනත උල්ලංඝනය කිරීම් බහුලව සිදු වූ අතර 2016 වසරේ මෙබඳු වැරදි 155 ක් වාර්තා විය. 2016 වසරට සාපේක්ෂව 2017 වසරේ මෙම වැරදි 264 දක්වා 70% කින් ඉහළගොස් තිබුණි. එසේ වුවද 2018 වසරේ මෙම වැරදිවල විශාල අඩුවීමක් වගුවට අනුව හඳුනාගත හැකි අතර වාර්තා වූ වැරදි ප්‍රමාණය 142 කි. ඒ අනුව 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ වෙරළ සංරක්ෂණ පනත උල්ලංඝනය කිරීම් 46% කින් අඩුවීමක් වගුවට අනුව හඳුනාගත හැකිය. වෙරළ සංරක්ෂණ පනත උල්ලංඝනය කිරීම් සඳහා නඩුපැවරීම් මගින් විසඳුම් ලබා දී ඇති ආකාරය අධ්‍යයනය කිරීමේ දී ඉහළ මට්ටමක ප්‍රතිශතයක් වාර්තා කර ඇත. ඒ අනුව 2016 වසරේ 96% ක් ද 2017 වසරේ 93% ක් ද වූ නඩුපැවරීම් ප්‍රතිශතය 2018 වසරේ නැවත 96% ක් දක්වා වර්ධනය වී ඇත.

බහුල ලෙස වාර්තා වන පරිසර ආඥාපනත උල්ලංඝනය කිරීම් ද සැළකිය යුතු අඩුවීමක් 2018 වසරේ දැකිය හැකිය. වගුවට අනුව පරිසර වැරදි 4733 ක් 2016 වසරේ වාර්තා වූ අතර එම ප්‍රමාණය 5663 දක්වා 20% කින් 2017 වසරේ ඉහළගොස් ඇත. 2018 වසරේ මෙම වැරදි 3849 දක්වා 32% කින් සැළකිය යුතු අඩුවීමක් 2017 වසරට සාපේක්ෂව පෙන්නුම් කර ඇත. කාලසීමාව තුළ පරිසර වැරදි සඳහා නඩු පැවරීම් ප්‍රතිශතයක් ලෙස ගත්කල 2016 වසරේ 93% ක්ද 2017 වසරේ 96% ක්ද වූ අතර 2018 වසරේ නඩුපැවරීම් ප්‍රතිශතය 92% කි.

වගුවෙහි දත්තවලට අනුව බීමත්ව කරනු ලබන වැරදිවල ද පැහැදිළි අඩුවීමක් 2018 වසරේ වාර්තා කර ඇත. බීමත්ව කරනු ලබන වැරදි මගින් මහජන හිරිහැරය, දේපල හානි සහ පොදුවේ සාමය කඩවීම් සිදුවන අතර 2016 වසරේ එබඳු වැරදි 14776 ක් වැනි විශාල සංඛ්‍යාවක් වාර්තා විය. 2017 වසරේ එම වැරදි 13481 දක්වා 9% ක අඩුවීමක් පෙන්නුම් කළ අතර 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ මෙම වැරදි 10248 දක්වා 24% ක අඩුවීමක් හඳුනාගත හැකිය. බීමත්ව කරනු ලබන වැරදිවල විසඳීම් ප්‍රතිශතය ගත්විට 2016 වසරේ 97% ක් සඳහා නඩුපැවරීම් සිදුකර ඇති අතර2017 වසරේ එම ප්‍රතිශතය 96% කි.2018 වසරේ නඩුපැවරීම් ප්‍රතිශතය 94% ක් ලෙස දැක්වේ.

සමාජය තුළ සිදුවන දරුණු ගණයේ අපරාධ සැළකිල්ලට ලක්කළ විට එබඳු බොහෝ අපරාධ සඳහා ගිනි අවි භාවිතය බහුල ලෙස දක්නට ලැබේ. වගුවෙහි දත්ත අනුව බලපත්‍ර නොමැතිව ගිනි අවි නිෂ්පාදනය, ළඟතබා ගැනීම සහ ප්‍රවාහනය නැමැති වරදෙහි ඉහළයාමක් පසුගිය කාලවකවානුව තුළ දක්නට ලැබේ. උදාහරණ ලෙස 2016 වසරේ මෙබඳු වැරදි 916 ක් වාර්තා වූ අතර 2017 වසරේ එම වැරදි 1171 ක් දක්වා 28% කින් ඉහළගොස් ඇත. 2018 වසරේ තවදුරටත් මෙම වැරදි 1307 දක්වා 12% ක වර්ධනයක් 2017 වසරට සාපේක්ෂව පෙන්නුම් කර ඇත.

මෙබඳු බලපත්‍ර නොමැති ගිනිඅවි සහ සැකකරුවන් අත්අඩංගුවට ගැනීම් සහ නඩු පැවරීම් සම්බන්ධයෙන් අවධානය යොමුකිරීමේ දී වගුවට අනුව 2016 වසරේ නඩුපැවරීම් ප්‍රතිශතය 94% ක් විය. 2017 සහ 2018 වසරවල එම ප්‍රතිශතය 93% ක මට්ටමේ පවතී.

වගුවට අනුව ධීවර ආඥා පනත යටතේ ගැනෙන වැරදිවල ද පහළයාමක් පසුගිය වසර කිහිපය තුළ දැකිය හැකිය. 2016 වසරේ ධීවර ආඥාපනත යටතේ ගැනෙන වැරදි 840 ක් වාර්තා වූ අතර ඊට සාපේක්ෂව 2017 වසරේ එම වැරදි 526 දක්වා 37% කින් අඩු වී ඇත. 2018 වසරේ ධීවර ආඥාපනත යටතේ ගැනෙන වැරදි 388 දක්වා අඩුවීමක් 2017 වසරට සාපේක්ෂව පෙන්නුම් කර ඇති අතර ප්‍රතිශතයක් ලෙස එය 26% ක පහළයාමක් ලෙස හඳුනාගත හැකිය. 2016 වසරේ මෙම වැරදිවල නඩුපැවරීමේ ප්‍රතිශතය 98% ක් වූ අතර 2017 වසරේ 94% ක්ද 2018 වසරේ 92% ක්ද විය.

වනසත්ත්ව හා තුරුලතා ආරක්ෂණ ආඥාපනතෙහි දැක්වෙන වැරදි සම්බන්ධයෙන් වගුවෙහි දත්ත සළකාබැලූ විට එම වැරදිවල ද සැළකිය යුතු අඩුවීමක් 2018 වසරෙහි පෙන්නුම් කර ඇත. 2016 වසරෙහි වාර්තා වූ වැරදි 819 ට සාපේක්ෂව 2017 වසරේ වැරදි 848 ක් වාර්තා වී ඇති අතර එය 2016 වසරට සාපේක්ෂව 3% ක වැඩිවීමකි. 2018 වසරේ මෙම ආඥාපනතට ගැනෙන වැරදි 577 ක් වාර්තා වී ඇති අතර එය 2017 වසරට සාපේක්ෂව 32% ක අඩුවීමකි. වගුවට අනුව වනසත්ත්ව හා තුරුලතා ආරක්ෂණ ආඥාපනත යටතේ ගැනෙන වැරදි සඳහා පසුගිය වසර තුනෙහි නඩුපැවරීම් සළකාබැලූ විට 2016 සහ 2017 වසරවල නඩුපැවරීම් ප්‍රතිශතයක් ලෙස 92% කි. 2018 වසරේ නඩුපැවරීම් 89% ක් දක්වා අඩුවී ඇත.

වගුවෙහි දත්තවලට අනුව සංරක්ෂණය කරන ලද සතුන් දඩයම් කිරීමේ වැරදි 2016 වසරෙහි 117ක් වාර්තා වී ඇති අතර 2017 වසරෙහි වාර්තා වූ වැරදි ප්‍රමාණය 73 කි. එය 2016 වසරට සාපේක්ෂව 38% ක අඩුවීමකි. 2018 වසරේ මෙම වැරදි 78 ක් වාර්තා වූ අතර 2017 වසරට සාපේක්ෂව එය 7% ක ඉහළයාමක් ලෙස දැක්විය හැකිය. සංරක්ෂිත වන සතුන් දඩයම් කිරීමේ වැරදි සම්බන්ධයෙන් නඩුපැවරීම් 2016 වසරේ 99% ඉක්මවා ඇති අතර 2017 වසරේ නඩුපැවරීම් ප්‍රතිශතය 96% කි. 2018 වසරේ එම ප්‍රතිශතය 91% දක්වා පහත වැටීමක් දක්නට ඇත.

කැලෑ ආඥාපනත යටතේ ගැනෙන වැරදිවල ද පහළයාමක් 2018 වසරේ හඳුනාගත හැකිය. වගුවට අනුව 2016 වසරේ මෙම වැරදි 1000 ක් වාර්තා වී ඇති අතර ඊට සාපේක්ෂව 2017 වසරේ වැරදි 715 දක්වා 28% කින් ද 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ මෙම වැරදි 459 දක්වා 36% කින් ද අඩුවීමක් වගුව මගින් හඳුනාගත හැකිය. මෙම වැරදි සම්බන්ධයෙන් විසඳීමේ ප්‍රතිශතය ගත්විට 2016 වසරේ නඩුපැවරීම් ප්‍රමාණය 84% ක් වූ අතර 2017 වසරේ 92% ක් දක්වා ඉහළගොස් ඇත. 2018 වසරේ නඩුපැවරීම් ප්‍රතිශතය 84% ක් දක්වා නැවත පහළගොස් ඇත.

සංරක්ෂිත කැලෑ විනාශකිරීම් හෝ හානිකිරීම් පිළිබඳ වැරදි ගත්විට 2016 වසරේ එබඳු වැරදි 594 ක් වාර්තා වී ඇති අතර ඊට සාපේක්ෂව 2017 වසරේ එම වැරදි ප්‍රමාණය 515 දක්වා 13% කින් පහළගොස් ඇත. 2018 වසරේ මෙම වැරදි තවදුරටත් 435 දක්වා 2017 වසරට සාපේක්ෂව 15% කින් අඩු වී ඇත. සංරක්ෂිත කැලෑ විනාශකිරීම් සම්බන්ධයෙන් සිදුකළ නඩුපැවරීම් සළකාබැලූ විට 2016 වසරේ එම ප්‍රතිශතය 89% කි. 2017 වසරේ නඩුපැවරීම් ප්‍රතිශතය 86% ක් වූ අතර 2018 වසරේ එම ප්‍රතිශතය 75% දක්වා අඩු වී ඇත.

ප්‍රබල පාරිසරික ගැටළු මතුකරන වැරදි ලෙස සැළකෙන අනවසර වැලි ගොඩදැමීම් සහ ප්‍රවාහනය සම්බන්ධයෙන් වගුවෙහි ඇතුළත් දත්තවලට අනුව 2016 වසරට සාපේක්ෂව 2017 සහ 2018 වසරවල මේ සම්බන්ධ වැරදිවල සැළකිය යුතු අඩුවීමක් දක්නට නොමැති බව පෙනීයයි. 2016 වසරේ අනවසර වැලි ගොඩදැමීම් සහ ප්‍රවාහනය සම්බන්ධ වැරදි 9947 ක් වාර්තා වූ අතර ඊට සාපේක්ෂව 2017 වසරේ එම ප්‍රමාණය13906 ක් දක්වා 40% කින් ඉහළ ගොස් තිබුණි. 2018 වසරේ වාර්තා වූ අනවසර වැලි ගොඩදැමීම් වැරදි ප්‍රමාණය 13693 කි. එහිදී 1% ක පමණ අඩුවීමක් 2017 වසරට සාපේක්ෂව හඳුනාගතහැකි වුවද 2016 වසරට සාපේක්ෂව 2018 වසරේ මෙම වැරදිවල ඉහළයාම ප්‍රතිශතයක් ලෙස 38% කි. මෙම වැරදි සම්බන්ධ නඩුපැවරීම් ප්‍රතිශතය ඉහත වසර තුනෙහිදීම 97% ක මට්ටමේ පවතී.

අනවසර දැව ප්‍රවාහනය සම්බන්ධ වැරදිවල ද අඩුවීමක් පසුගිය වසර කිහිපය තුළ සිදුව ඇත. වගුවට අනුව 2016 වසරේ මෙබඳු වැරදි 1584 ක් වාර්තා වී ඇති අතර 2017 වසරේ 1558 දක්වා මෙම වැරදිවල 2% ක අඩුවීමක් විද්‍යාමාන වේ. 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ අනවසර දැව ප්‍රවාහන වැරදි 1335 දක්වා 14% ක අඩුවීමක් හඳුනාගත හැකිය. මෙම වැරදි සඳහා නඩු පැවරීම් ප්‍රතිශතය 2016 වසරේ 90% ක් වූ අතර 2017 වසරේ 91% කි. 2018 වසරේ නඩු පැවරීම් ප්‍රතිශතයක් ලෙස 85% කි.

අනවසර මැණික් ගැරීම් 2016 වසරේ වාර්තා වූ ප්‍රමාණය 935 ක් වූ අතර ඊට සාපේක්ෂව 2017 වසරේ මෙබඳු වැරදි 710 ක් වාර්තා විය. එය 2016 වසරට සාපේක්ෂව 24% ක පහළයාමකි. 2018 වසරේ අනවසර මැණික් ගැරීම් සිද්ධි 597 ක් වාර්තා වූ අතර එය 2017 වසරට සාපේක්ෂව 16% ක අඩුවීමක් ලෙස දැක්විය හැකිය. මෙම වරද සඳහා නඩුපැවරීම් ප්‍රතිශතය 2016 වසරේ 89% ක් වූ අතර 2017 වසරේ 84% කි. 2018 වසරේ නඩු පැවරීම් 92% ක් දක්වා ඉහළගොස් ඇත.

පොදුවේ ගත්කල 2017 වසරට සාපේක්ෂව සමස්ථ ව්‍යවස්ථාපිත වැරදිවල 17% ක පමණ අඩුවීමක් 2018 වසරේ හඳුනාගත හැකිය. මීට අමතරව පරිසර විනාශයට අදාළ පනත් මගින් දක්වා ඇති වැරදිවල පැහැදිළි අඩුවීමක් 2018 වසරේ දක්නට ලැබේ.

සමස්ථ ව්‍යවස්ථාපිත වැරදි සඳහා නඩුපැවරීම් මගින් විසඳුම් ලබාදී ඇති ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස ගත්කල 2016 සහ 2017 වසරවල 96% ක මට්ටමේ පවතින අතර 2018 වසරේ නඩුපැවරීම් ප්‍රතිශතය 94% කි.

# 08. රිය අනතුරු

රිය අනතුරු අවම කර මහජන ජීවිත හා දේපළ සුරක්ෂිත කිරීම සඳහා ශ්‍රී ලංකා පොලීසිය විශාල කාර්යභාරයක් ඉටුකරනු ලබයි. දෛනිකව රථවාහන රාජකාරි සඳහා විශාල නිලධාරීන් පිරිසක් යොදවමින් රථවාහන පාලනය තුළින් රිය අනතුරු අවම කිරීම පොලීසියේ ප්‍රධාන කාර්යයක් බවට පත්ව තිබේ.

මාර්ග පද්ධතියේ ගුණාත්මකභාවය, පවතින අධික වාහන සංඛ්‍යාව සහ එම වාහන මාර්ග පද්ධතියට ඔරොත්තුදීමේ හැකියාව, රථවාහන නීති ක්‍රියාත්මකවීමේ ස්වභාවය මෙන්ම රියදුරන් හා පදිකයන් මාර්ග භාවිතය පිළිබඳ දක්වන සැළකිල්ල යන සාධක අඩුවැඩි වශයෙන් දෛනිකව සිදුවන රියඅනතුරු සඳහා බලපෑ හැකිය.කවර හේතු බලපෑව ද රථවාහන මෙහෙයවීම මගින් රියඅනතුරු වැළැක්වීම සම්පූර්ණයෙන්ම පොලීසිය සතු කාර්යයක් බවට අදවන විට සමාජය තුළ පත්ව තිබේ.

කෙසේ වුවද සෑම වසරකම විශාල රියඅනතුරු සංඛ්‍යාවක් ශ්‍රී ලංකා පොලීසිය වෙත වාර්තා වන අතර 2018 වසරේ වාර්තා වු රිය අනතුරු පිළිබඳ දත්ත 2016 හා 2017 වසර සමඟ සංසන්දනාත්මකව පහත වගුව මගින් ඉදිරිපත් කර ඇත.

වගු අංක 19 **2016 – 2018 රිය අනතුරු වගුව**

| රිය අනතුරු | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| වර්ෂය | මාරක අනතුරු | බරපතල අනතුරු | සුළු තුවාල | අලාභ අනතුරු | මුළු අනතුරු | වාහන සංඛ්‍යාව | වාහන 1000 කට අනතුරු සංඛ්‍යාව |
| 2016 | 2837 | 8932 | 14050 | 13380 | 39199 | 6795469 | 5.8 |
| 2017 | 2962 | 8666 | 13102 | 12866 | 37596 | 7247122 | 5.2 |
| 2018 | 2953 | 8475 | 12264 | 12064 | 35756 | 7727921 | 4.7 |

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යාලේඛන ඒකකය

**සැ:යු:-** වගු අංක 19 හි සඳහන් ඇතැම් සංඛ්‍යා දත්ත පසුව වෙනසකට භාජනය වියහැකිය.

❖ **දත්ත විශ්ලේෂණය**

ඉහත වගු අංක 19 ට අනුව 2016 වසර හා සැසඳූ කල ( 2017 වසරේ මාරක රියඅනතුරු හැර) 2017 සහ 2018 වසරවල සෑම වර්ගයකම රියඅනතුරුවල පහළයාමක් දක්නට ඇත. 2016 වසරේ මාරක රියඅනතුරු 2837 ක් වාර්තා වු අතර 2017 වසර වනවිට එය 2962 ක් දක්වා 4% කින් ඉහළගොස් ඇත. 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ මාරක රියඅනතුරු 2953 ක් දක්වා රියඅනතුරු 9 ක අඩුවීමක් හඳුනාගත හැකිය.

බරපතල තුවාල රියඅනතුරු සංසන්දනාත්මකව විමසීමේ දී 2016 වසරේ එබඳු රියඅනතුරු 8932 ක් වාර්තා වී ඇත. ඊට සාපේක්ෂව 2017 වසරේ වාර්තා වු බරපතල තුවාල රියඅනතුරු ප්‍රමාණය 8666 ක් වු අතර ප්‍රතිශතයක් ලෙස 2016 වසරට වඩා 3% ක අඩුවීමකි. 2018 වසරේ වාර්තා වු බරපතල තුවාල රියඅනතුරු ප්‍රමාණය 8475 ක් වු අතර ප්‍රතිශතාත්මකව එය 2017 වසරට වඩා 2% ක අඩුවීමක් ලෙස සැළකිය හැකිය.

සුළු තුවාල රියඅනතුරු සිදු වී ඇති අයුරු සංසන්දනය කළ විට ද 2016 වසරට සාපේක්ෂව 2017 සහ 2018 වසරවල අඩුවීමක් පෙන්නුම් කර ඇත. 2016 වසරේ වාර්තා වු සුළු තුවාල රියඅනතුරු ප්‍රමාණය 14050 ක් වු අතර ඊට සාපේක්ෂව 2017 වසරේ රියඅනතුරු 13102 ක් දක්වා 7% කින් අඩුවී ඇත. 2017 වසර හා සැසඳූ කල 2018 වසරේ සුළු තුවාල රියඅනතුරු 12264 ක් වාර්තා වී ඇති අතර එය 6% ක අඩුවීමකි.

අලාභ රියඅනතුරු පසුගිය වසර තුනෙහි ක්‍රමානුකූල අඩුවීමක් පෙන්නුම් කර ඇත. 2016 වසරේ අලාභ රියඅනතුරු 13380 ක් වාර්තා වු අතර එය 12866 දක්වා 2017 වසරේ 4% කින් පහළගොස් ඇත. 2018 වසරේ අලාභ රියඅනතුරු 12064 ක් වාර්තා වු අතර එය 2017 වසරට සාපේක්ෂව 6% ක අඩුවීමකි.

සමස්ථ රිය අනතුරු ප්‍රමාණයේ අඩුවීමක් ද 2017 සහ 2018 වසරවල හඳුනාගත හැකිය. එනම් 2016 වසරේ 39199 ක් වු සමස්ථ රියඅනතුරු ප්‍රමාණය ඊට සාපේක්ෂව 2017 වසරේ 37596 ක් දක්වා 4% කින් අඩු වී ඇත.

2018 වසරේ වාර්තා වූ සමස්ථ රිය අනතුරු ප්‍රමාණය 35756 ක් වූ අතර 2017 වසරට සාපේක්ෂව එය 5% ක අඩුවීමකි.

2016 වසරට සාපේක්ෂව රියඅනතුරුවල යම් අඩුවීමක් පසුගිය 2017 සහ 2018 වසර දෙකෙහි හඳුනාගත හැකි වුවද මෙරට රථවාහන සංඛ්‍යාත්මකව ඉහළයාම 2018 වසරේ ද සාමාන්‍ය පරිදි සිදුව ඇති අයුරු වගුව මගින් හඳුනාගත හැකිය. 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ රථවාහන ප්‍රමාණය 7% කින් ඉහළ ගොස් ඇති අතර ඒ අනුව වාහන 1000 කට රියඅනතුරු සංඛ්‍යාව 2017 වසරේ පැවති 5.2 සිට 2018 වසරේ 4.7 දක්වා පහත වැටී ඇත.

## 8.1 වයස් බාණ්ඩ අනුව රිය අනතුරු මරණ

රියඅනතුරු මගින් සිදුවන මරණ පිළිබඳ අවධානය යොමු කිරීමේදී එම මරණයටපත් පුද්ගලයාගේ හෝ පුද්ගලයින්ගේ වයස් මට්ටම් පිළිබඳ සොයාබැලීම වැදගත් වේ. මන්ද වයස් මට්ටම් පිළිබඳ අධ්‍යයනය මගින් එම තැනැත්තාගේ මරණය පවුලට මෙන්ම රටට ද බලපාන ආකාරය හඳුනාගත හැකි බැවිනි. වගු අංක 20 මගින් 2017 සහ 2018 වසරවල රියඅනතුරු මරණ වයස් බාණ්ඩ අනුව දක්වා ඇත.

වගු අංක 20 **2017 – 2018 මියගිය පුද්ගලයින් වයස් අනුව දැක්වෙන වගුව**

| වයස් බාණ්ඩය (අවුරුදු) | 2017 | 2018 |
|---|---|---|
| 5 ට අඩු | 37 | 43 |
| 6- 10 අතර | 35 | 25 |
| 11 - 15 අතර | 29 | 41 |
| 16 - 20 අතර | 212 | 186 |
| 21 - 25 අතර | 315 | 290 |
| 26 - 30 අතර | 286 | 244 |
| 31 - 35 අතර | 258 | 215 |
| 36 - 40 අතර | 198 | 222 |
| 41 - 45 අතර | 244 | 192 |
| 46 - 50 අතර | 222 | 221 |
| 51 - 55 අතර | 260 | 254 |
| 56 - 60 අතර | 248 | 256 |
| 61 - 65 අතර | 223 | 288 |
| 66 - 70 අතර | 189 | 236 |
| 71 ට වැඩි | 355 | 368 |
| **එකතුව** | **3111** | **3081** |

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යාලේඛන ඒකකය

❖ **දත්ත විශ්ලේෂණය**

වගු අංක 20 ට අනුව රිය අනතුරු හේතුවෙන් මියගිය පුද්ගලයින්ගේ ප්‍රමාණයේ අඩුවීමක් 2017 වසර හා සැසඳූ කල 2018 වසරේ දක්නට ලැබේ. 2017 වසරේ 3111 ක් වූ රිය අනතුරු මරණ සංඛ්‍යාව 2018 වසරේ 3081 දක්වා 01% කින් පහළ ගොස් ඇත.

වගු අංක 20 මගින් ඉදිරිපත් කර ඇති දත්තවලට අනුව මියගිය වයස් බාණ්ඩ පිළිබඳ අවධානය යොමු කළ විට පෙනී යන්නේ බොහෝ වයස් බාණ්ඩවල රිය අනතුරු හේතුවෙන් සිදුව ඇති මරණ 2017 වසරට

සාපේක්ෂව 2018 වසරේ අඩු වී ඇති බවයි. විශේෂයෙන්ම රටේ ශ්‍රම බලකායට අයත් වයස් බාණ්ඩ පිළිබඳ අවධානය යොමු කිරීමේ දී එම පහත වැටීම වැදගත් කරුණක් ලෙස සඳහන් කළ හැකිය.

ඒ අනුව වයස 21 – 25 අතර රිය අනතුරු මරණ 2017 වසරේ 315 ක් සිදුව ඇති අතර 2018 වසරේ 290 දක්වා 8% කින් ද වයස 26 – 30 අතර මරණ සංඛ්‍යාව 2017 වසරේ 286 සිට 2018 වසරේ 244 දක්වා 15% කින් ද 31 – 35 අතර වයස් බාණ්ඩවලට අයත් මරණ 17% කින් ද වයස 41 – 45 අතර මරණ 21% කින් ද වයස 51 – 55 අතර මරණ 2% කින් ද 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ අඩු වී ඇත.

වගුවෙහි දත්තවලට අනුව දක්නට ඇති අනෙක් විශේෂ ලක්ෂණය වන්නේ වයස අවු 55 ට වැඩි රිය අනතුරු මරණවල ඉහළයාමක් 2018 වසරේ හඳුනාගත හැකිවීමයි. ඒ අනුව වයස 56 – 60 අතර රිය අනතුරු මරණ 2017 වසරේ 248 සිට 2018 වසරේ 256 දක්වා 3% කින් ද වයස 61 – 65 අතර මරණ 29% කින් ද වයස 66 – 70 අතර රිය අනතුරු මරණ 25% කින් ද වයස 70 ට වැඩි රියඅනතුරු මරණ 4% කින් ද 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ ඉහළගොස් ඇත.

## 8.2 වයස් බාණ්ඩ අනුව රිය අනතුරු තුවාල

රියඅනතුරක දී තුවාල ලබන පුද්ගලයින් වයස් බාණ්ඩ අනුව වර්ගකිරීම තුළින් රියඅනතුරක් මගින් පුද්ගලයාට පවුලට සහ සමාජයට ඇති කරනු ලබන බලපෑම වටහාගත හැකිය. පසුගිය 2017 සහ 2018 වසරවල වාර්තා වූ රියඅනතුරු හේතුවෙන් තුවාල ලැබූවන් පිළිබඳ දත්ත වයස් බාණ්ඩ අනුව පහත වගු අංක 21 මගින් දක්වා ඇත.

වගු අංක 21 **2017 – 2018 තුවාල වූ පුද්ගලයින් වයස් අනුව දැක්වෙන වගුව**

| **වයස් බාණ්ඩය (අවුරුදු)** | **2017** | **2018** |
|---|---|---|
| 5 ට අඩු | 481 | 414 |
| 6- 10 අතර | 771 | 798 |
| 11 - 15 අතර | 1188 | 1088 |
| 16 - 20 අතර | 2802 | 2780 |
| 21 - 25 අතර | 4045 | 3865 |
| 26 - 30 අතර | 3989 | 3473 |
| 31 - 35 අතර | 3370 | 3183 |
| 36 - 40 අතර | 3300 | 3034 |
| 41 - 45 අතර | 2745 | 2581 |
| 46 - 50 අතර | 2304 | 2166 |
| 51 - 55 අතර | 1905 | 1861 |
| 56 - 60 අතර | 1472 | 1501 |
| 61 - 65 අතර | 1131 | 1153 |
| 66 - 70 අතර | 727 | 780 |
| 71 ට වැඩි | 694 | 707 |
| **එකතුව** | **30924** | **29384** |

මූලාශ්‍රය- පොලිස් සංඛ්‍යා ලේඛන ඒකකය

❖ **දත්ත විශ්ලේෂණය**

රිය අනතුරු හේතුවෙන් තුවාල වූ පුද්ගලයන්ගේ සංඛ්‍යාව 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ 5% කින් අඩු වී ඇති බව වගු අංක 21 මගින් අනාවරණය වේ. 2017 වසරේ රිය අනතුරු හේතුවෙන් පුද්ගලයින් 30924 ක් තුවාල ලබා ඇති අතර 2018 වසරේ එම සංඛ්‍යාව 29384 ක් ලෙස 5% ක අඩුවීමක් පෙන්නුම් කර ඇත.

රිය අනතුරු තුවාල සිදුවීම් සළකාබැලීමේ දී ඇතැම් වයස් බාණ්ඩවල රිය අනතුරු තුවාල සිදුවීම්වල පහළ යාමක් 2017 වසරට සාපේක්ෂව දැකිය හැකිය. ඒ අනුව වයස 21 – 25 අතර රියඅනතුරු තුවාල සිදුවීම් 2017 වසරේ 4045 සිට 2018 වසරේ 3865 දක්වා 4% කින් ද වයස 26 – 30 අතර 13% කින් ද 31 – 35 අතර වයස් බාණ්ඩවල රිය අනතුරු තුවාල සිදුවීම් 5% කින් ද අඩු වී ඇති අතර වයස 36 – 40 අතර රිය අනතුරු තුවාල සිදුවීම් 8% කින් ද වයස 41 – 45 අතර රිය අනතුරු තුවාල 6% කින් ද වයස 46 – 50 අතර 6% කින් ද වයස 51 – 55 අතර 2% කින් ද රිය අනතුරු තුවාල සිදුවීම් 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ අඩුවීමක් දක්නට ඇත.

වගුවට අනුව වයස අවුරුදු 55 ට වැඩි බාණ්ඩවලට අයත් පුද්ගලයින්ට රියඅනතුරුවලින් තුවාල සිදුවීම්වල ඉහළයාමක් 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ දක්නට ඇත. ඒ අනුව වයස 56 – 60 අතර සහ 61 – 65 අතර තැනැත්තන්ට රියඅනතුරු හේතුවෙන් තුවාල සිදුවීම් 2017 වසරට සාපේක්ෂව 2% කින් 2018 වසරේ වැඩි වී ඇති අතර 66 – 70 අතර වයස් බාණ්ඩයේ රියඅනතුරු තුවාල සිදුවීම් 7 % කින් සහ වයස 70 ට වැඩි පුද්ගලයින්ගේ රියඅනතුරු තුවාල සිදුවීම් 2% කින් 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ ඉහළගොස් ඇත.

## 8.3 අධිවේගී මාර්ග ආශ්‍රිත රිය අනතුරු

අධිවේගී මාර්ග ආශ්‍රිතව ද වාර්ෂිකව සැළකිය යුතු රියඅනතුරු සංඛ්‍යාවක් සිදුවන බවට වාර්තා මගින් පැහැදිළි වේ. පසුගිය 2017 සහ 2018 වසරවල සිදු වූ අධිවේගී මාර්ග ආශ්‍රිත රියඅනතුරු පිළිබඳ සංඛ්‍යා දත්ත වගු අංක 22 මගින් සංසන්දනාත්මකව දක්වා ඇත.

වගු අංක 22 **2017 – 2018 අධිවේගී මාර්ග ආශ්‍රිත රිය අනතුරු වගුව**

| අනු අංකය | අනතුරු වර්ගය | වර්ෂය | |
|---|---|---|---|
| | | **2017** | **2018** |
| 1 | මාරක අනතුරු | 6 | 8 |
| 2 | බරපතල තුවාල අනතුරු | 7 | 8 |
| 3 | සුළු තුවාල අනතුරු | 79 | 93 |
| 4 | දේපළ අලාභ අනතුරු | 459 | 488 |
| **එකතුව** | | **551** | **597** |

මූලාශ්‍රය - අධිවේගී මාර්ග සංචාරක කොට්ඨාසය

❖ **දත්ත විශ්ලේෂණය**

වගු අංක 22 මගින් ඉදිරිපත් කර ඇති අධිවේගී මාර්ග ආශ්‍රිත රිය අනතුරු පිළිබඳ දත්තවලට අනුව 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ අධිවේගී මාර්ගයේ රිය අනතුරුවල ඉහළයාමක් දැකිය හැකිය.

ඒ අනුව 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ අධිවේගී මාර්ග ආශ්‍රිත මාරක රියඅනතුරු 33% කින් ද බරපතල තුවාල රියඅනතුරු 14% කින් ද සුළු තුවාල රියඅනතුරු 18% කින් ද අලාභ රියඅනතුරු 6% කින් ද වර්ධනය වී ඇත. සමස්ථ අධිවේගී මාර්ග ආශ්‍රිත රිය අනතුරුවල 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ ඉහළයාම 8% ක් ලෙස ඉහත වගුව මගින් හඳුනාගත හැකිය.

## 8.4 රිය අනතුරු අවම කිරීම සඳහා වූ ශ්‍රී ලංකා පොලීසියේ ක්‍රියාකාරිත්වය

රිය අනතුරු වැළැක්වීම සඳහා වරදකරුවන් අත්අඩංගුවට ගැනීම සහ ඔවුන්ට නඩුපැවරීම් මගින් දඩුවම් ලබාදීම ශ්‍රී ලංකා පොලීසිය විසින් නිරතුරුවම සිදුකළ ද විවිධ හේතු නිසා රිය අනතුරු අද වන විට සමාජ අර්බුදයක් ලෙස හඳුනා ගන්නට සිදුව ඇත.

ඒ අනුව ඉහත අයුරින් නීතිය ක්‍රියාත්මක කිරීමට අමතරව ශ්‍රී ලංකා පොලීසිය විවිධ සමාජ කණ්ඩායම් දැනුවත් කිරීම සඳහා දේශන සහ වැඩමුළු විශාල ලෙස පවත්වනු ලබයි. 2018 වසරේ දිවයින පුරා එබඳු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර එම වැඩසටහන් පිළිබඳ පහත වගු අංක 23 මගින් කරුණු දක්වා ඇත.

වගු අංක 23 **2018 වසරේ පාඨමාලා සහ දැනුවත්කිරීම් සම්බන්ධ වගුව**

| අනු අංකය | ක්‍රියාකාරකම | පැවැත් වූ සංඛ්‍යාව | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | පාසල් දේශන | 18093 | 2091036 |
| 2 | රියදුරු දේශන | 122462 | 761948 |
| 3 | පදිකයින් දැනුවත්කිරීම | 13740 | 199120 |
| 4 | වෙනත් දේශන (රාජ්‍ය නිලධාරීන්/ ත්‍රිවිධ හමුදා/ පොලිස් නිලධාරීන්/ පෞද්ගලික අංශයේ සේවකයන් සඳහා) | 541 | 13972 |
| 5 | රථවාහන සංදර්ශන සහ ප්‍රදර්ශන කුටි | 63 | 135500 |
| 6 | පොලිස් නිලධාරීන් සඳහා පාඨමාලා | 8 | 445 |
| එකතුව | | 154907 | 3202021 |

මූලාශ්‍රය -රථවාහන පාලනය හා මාර්ග ආරක්ෂක කොට්ඨාසය

❖ **දැනුවත් කිරීමේ වැඩසටහන්වල ඵලදායීත්වය**

රථවාහන පාලනය සහ මාර්ග ආරක්ෂාව සඳහා ශ්‍රී ලංකා පොලීසිය විශාල ශ්‍රමදායකත්වයක් දක්වනු ලබන අතර ඊට සමගාමීව රට පුරා ඉතා පුළුල් ලෙස රිය අනතුරු වළක්වාගැනීම පිළිබඳ සමාජයේ සියළුම පාර්ශ්වයන් ඇතුළත් වන පරිදි දැනුවත් කිරීම් සඳහා විවිධ ක්‍රියාකාරකම් සිදුකරනු ලබයි. මෙම ක්‍රියාකාරකම්වලට දේශන, දැනුවත් කිරීම්, ප්‍රදර්ශන සහ වැඩමුළු අයත්වේ. මේ සඳහා කැපකරනු ලබන මිනිස් පැය ප්‍රමාණය සහ අනෙකුත් සම්පත් භාවිතය සැළකිල්ලට ගත්කල එයින් සාර්ථක ප්‍රතිඵල ලැබී තිබේද යන්න පිළිබඳව විමසාබැලීම වැදගත් වේ.

වගු අංක 23 මගින් ඉදිරිපත් කර ඇති සංඛ්‍යා දත්ත අනුව 2018 වසරේ සිදුකර ඇති සමස්ථ දේශන, දැනුවත්කිරීම්, ප්‍රදර්ශන සහ පාඨමාලා ප්‍රමාණය 154907 කි. ඒ සඳහා වාර්ෂික පුද්ගල සහභාගීත්වය මිලියන 03 කට අධික වේ. පොලීසිය විසින් සාමාන්‍ය පරිදි මෙම දැනුවත් කිරීම් දීර්ඝ කාලයක සිට සිදුකරනු ලැබුව ද රියඅනතුරුවල සැළකිය යුතු අඩුවීමක් පසුගිය කාලවකවානුව තුළ සිදුව නැති බව පෙනීයයි. උදාහරණ ලෙස 2018 වසරට පෙර වසර තුනක මාරක රියඅනතුරු ඉහළයාම සැළකිල්ලට ගත්විට 2015 වසරේ මාරක රියඅනතුරු 2590 ක් වාර්තා වු අතර 2016 වසරේ මාරක රියඅනතුරු 2824 ක් දක්වා 9% කින් ඉහළගොස් ඇත. 2017 වසරේ මාරක රියඅනතුරු 2933 ක් වාර්තා වු අතර එය 2017 වසර හා සැසඳු කල 4% ක වැඩිවීමකි.

2018 වසරේ දත්තවලට අනුව මෙම දැනුවත්කිරීම් ඉහත දැක්වු අයුරින් වඩා පුළුල් ලෙස සිදුකර ඇති අතර ඒ සඳහා අතිවිශාල පිරිසක් සහභාගී කරගෙන තිබේ. උදාහරණ ලෙස රියදුරන් ලක්ෂ 08කට ආසන්න පිරිසක් සහභාගී කරගෙන ඇති අතර දැනුවත් කරන ලද පදිකයින් සංඛ්‍යාව ලක්ෂ 02 කට ආසන්න වේ. අනෙකුත් සියලු දැනුවත්කිරීම් සඳහා සහභාගීත්වය මිලියන 03 කට අධික වේ.

මෙම දැනුවත්කිරීම් හා සසඳන කල 2018 වසරේ සෑම ආකාරයකම රිය අනතුරුවල අඩුවීමක් දක්නට ලැබෙන අතර ඒ යටතේ මාරක රියඅනතුරු 2017 වසරේ 2962 සිට 2018 වසරේ 2953 දක්වා අඩු වී ඇත. 2018 වසරේ බරපතල තුවාල රියඅනතුරුවල පහළයාම ප්‍රතිශතයක් ලෙස 2% කි. සමස්ථ රියඅනතුරු 2017 වසරට වඩා 5% කින් 2018 වසරේ පහළ ගොස් ඇත.

❖ **සැළකිල්ලට ලක්විය යුතු කරුණු**

සමස්ථයක් ලෙස රිය අනතුරු මගින් සිදුකරනු ලබන ජීවිත හා දේපළ හානිය පවුලේ සහ පොදුවේ රටෙහි ආර්ථිකය කෙරෙහි අහිතකර බලපෑමක් එල්ල කරනු ලබයි. එබැවින් මේ සම්බන්ධයෙන් සෑම පාර්ශ්වයකම විශේෂ අවධානය යොමුකිරීම අත්‍යවශ්‍ය වේ. රියඅනතුරු අවම කරගැනීම පොලීසියට පමණක් කළහැකි දෙයක් නොවන අතර මහාමාර්ගය භාවිතා කරන සෑම පුද්ගලයෙකුටම ඒ සඳහා කාර්යභාරයක් හිමිවේ. පොලීසිය කොතෙක් නීතිය ක්‍රියාත්මක කළ ද විශාල ලෙස දැනුවත් කිරීම් සිදුකළ ද වාර්ෂික රිය අනතුරුවල සැළකිය යුතු අඩුවීමක් සිදු නොවීම පිළිබඳ සමස්ථ සමාජයේම අවධානය යොමු වියයුතුය. අපරාධ මැඩලමින් නීතිය හා සාමය සුරැකීම සඳහා වෙන්කළ යුතු පොලිස් නිලධාරියාගේ රාජකාරි කාලයෙන් වැඩි කොටසක් රිය අනතුරු මැඩ පැවැත්වීමට යෙදවීමට සිදුවීම මගින් පොලීසියේ ප්‍රමුඛ කාර්යභාරයට ද යම් බලපෑමක් එල්ල වන බව කිවයුතුය.

රිය අනතුරු වැඩිවීම පිළිබඳ පොලීසිය දෝෂ දර්ශනයට ලක්කිරීම හෝ පොලීසිය වෙත ඇඟිල්ල දිගුවීම මගින් මෙම සමාජ ගැටළුවට විසඳුම් සෙවීම කළ නොහැකි අතර ඒ සඳහා සමස්ථ සමාජයේම සාමූහික වැඩපිළිවෙලක් කෙරෙහි දැඩි අවධානය යොමු කළ යුතුව ඇත.

# 09. හදිසි මරණ

ශ්‍රී ලංකාවේ වාර්ෂිකව සිදුවන හදිසි මරණ පිළිබඳ අවධානය යොමු කිරීමේ දී ඉතා සැළකිය යුතු මරණ සංඛ්‍යාවක් වාර්තා වන බව පෙන්වා දියහැකිය. මෙම පරිච්ඡේදය තුළින් 2018 වසරේ සිදුවූ එබඳු හදිසි මරණ පිළිබඳව 2016 හා 2017 වසර සමඟ සංසන්දනාත්මකව කරුණු ඉදිරිපත් කර ඇත.

ශ්‍රී ලංකා පොලීසිය වෙත වාර්තා වන හදිසි මරණ රෝග/ ස්වාභාවික හේතු සහ ස්වාභාවික නොවන හේතු මත සිදුවන මරණ ලෙස වර්ග කළ හැකිය. පහත වගුව මගින් 2016 – 2018 දක්වා වසර තුන තුළ සිදුව ඇති හදිසි මරණ සංඛ්‍යාත්මකව පෙන්නුම් කර ඇත.

වගු අංක 24 **2016 – 2018 සමස්ථ හදිසි මරණ වගුව**

| හේතු | 2016 | 2017 | 2018 |
|---|---|---|---|
| රෝග/ස්වභාවික හේතු (ස්වභාවික විපත් ද ඇතුළුව) | 23472 | 26088 | 25856 |
| වෙනත් හේතු | 3336 | 3637 | 3134 |
| **එකතුව** | **26808** | **29725** | **28990** |

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යාලේඛන ඒකකය

❖ **දත්ත විශ්ලේෂණය**

ඉහත වගුවට අනුව පසුගිය වසර තුන තුළ හදිසි මරණ පිළිබඳ සංඛ්‍යා දත්ත විග්‍රහ කිරීමේ දී පෙනී යන්නේ රෝග/ ස්වාභාවික හේතු මත සිදුවන හදිසි මරණ 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ 1% කට ආසන්න අඩුවීමක් පෙන්නුම් කර ඇති බවයි. මෙම ඛාණ්ඩයට ස්වාභාවික ආපදා හේතුවෙන් සිදුවන මරණ ද ඇතුළත් වන අතර 2018 වසරේ ස්වාභාවික ආපදා හේතුවෙන් සිදුවූ මරණ පහළ අගයක පැවතීම ඉහත 2018 වසරේ ස්වාභාවික හේතු මත සිදුවූ හදිසි මරණවල අඩුවීම සඳහා බලපාන්නට ඇති බවට නිගමනය කළ හැකිය. මෙම පරිච්ඡේදය මගින් වැඩි අවධානයක් ස්වාභාවික නොවන හේතු මත සිදුවන හදිසි මරණ පිළිබඳව යොමු කර ඇත.

## 9.1 ස්වාභාවික නොවන හේතු මත සිදුවන මරණ

ශ්‍රී ලංකා පොලීසිය වෙත වාර්තා වන හදිසි මරණ, ඊට බලපෑ හේතු 22 ක් යටතේ වර්ග කරනු ලබයි. (සමස්ථ වර්ගීකරණය සහිත වගුව ඇමුණුම 01 යටතේ දක්වා ඇත.) ඒවා අතුරින් 18 ක් ස්වාභාවික නොවන හේතු මත සිදුවේ. එයිනුත් බහුලව සිදුවන විශේෂ අවධානයට පාත්‍ර වියයුතු ක්ෂේත්‍රවල හදිසි මරණ පහත වගුව මගින් විදහා දැක්වේ.

වගු අංක 25 **2016 – 2018 දක්වා ස්වාභාවික නොවන හේතු මත සිදුවන මරණ සම්බන්ධ වගුව**

| අනු අංකය | ස්වභාවය | 2016 | | | 2017 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ස්ත්‍රී | පුරුෂ | එකතුව | ස්ත්‍රී | පුරුෂ | එකතුව | ස්ත්‍රී | පුරුෂ | එකතුව |
| 1 | දියේ ගිලීමෙන් | 177 | 700 | 877 | 150 | 577 | 727 | 133 | 634 | **767** |
| 2 | සර්පයින් දෂ්ට කිරීමෙන් | 40 | 60 | 100 | 38 | 62 | 100 | 29 | 48 | **77** |
| 3 | වන සතුන් පහරදීමෙන් | 21 | 97 | 118 | 12 | 102 | 114 | 19 | 100 | **119** |
| 4 | ගොඩනැගිලිවලින් වැටීමෙන් | 15 | 169 | 184 | 29 | 187 | 216 | 27 | 153 | **180** |
| 5 | ගස්වලින් ඇදවැටීමෙන් | 15 | 179 | 194 | 8 | 182 | 190 | 8 | 200 | **208** |
| 6 | විදුලිසැර වැදීමෙන් | 18 | 117 | 135 | 16 | 117 | 133 | 15 | 98 | **113** |
| 7 | දුම්රිය අනතුරුවලින් | 27 | 164 | 191 | 25 | 173 | 198 | 36 | 165 | **201** |
| 8 | ගින්නට හසුවීමෙන් | 90 | 38 | 128 | 71 | 35 | 106 | 45 | 31 | **76** |
| **එකතුව** | | **403** | **1524** | **1927** | **349** | **1435** | **1784** | **312** | **1429** | **1741** |

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යා ලේඛන ඒකකය

❖ දත්ත විශ්ලේෂණය

වගුවට අනුව පසුගිය වසර තුන තුළ මෙම ස්වාභාවික නොවන හේතු මත සිදුවූ මරණවල යම් අඩුවීමක් දැකිය හැකිය. 2016 වසරට සාපේක්ෂව 2018 වසරේ 10% කින් මෙම මරණ අඩු වී ඇත. 2017 වසර හා සංසන්දනය කළ විට 2018 වසරේ මෙබඳු හදිසි මරණවල අඩුවීමේ ප්‍රතිශතය 2% කි.

වගුවට අනුව ස්වාභාවික නොවන හේතු මත සිදුවූ හදිසි මරණවලින් වැඩිම සංඛ්‍යාවක් දියේ ගිලීම් නිසා සිදුවූ මරණ වේ. 2016 වසරේ එබඳු මරණ 877 ක් වාර්තා වූ අතර 2017 වසරේ එය 727 දක්වා 17% කින් අඩුවී ඇත. 2018 වසරේ නැවතත් එම මරණ ප්‍රමාණය 767 දක්වා 5% කින් 2017 වසරට සාපේක්ෂව ඉහළ ගොස් ඇත.

වගු අංක 24 ට අනුව දියේ ගිලීමෙන් මියගිය පුද්ගලයින්ගෙන් 83% ක් එනම් 634 ක් පිරිමින් වන අතර මියගිය කාන්තාවන් සංඛ්‍යාව 133 කි. වයස අවුරුදු 8 – 40 අතර වැඩි පිරිසක් දියේ ගිලීමෙන් මියගොස් ඇති අතර එය සමස්ථ දියේ ගිලීමෙන් සිදුවූ මරණවලින් 53% කි. සෑම වයස් ඛාණ්ඩයකම සැළකිය යුතු සංඛ්‍යාවක් දියේ ගිලීම මගින් මරණයට පත්ව ඇති අතර එක් වයස් ඛාණ්ඩයක වැඩිම කාන්තාවන් පිරිසක් දියේ ගිලීම මගින් මියගොස් ඇත්තේ අවුරුදු 70 ට වැඩි වයස් ඛාණ්ඩයෙනි. ඒ අනුව වයස 70 ට වැඩි කාන්තාවන් 33 දෙනෙකු දියේ ගිලීමෙන් මියගොස් ඇත. එය දියේ ගිලීමෙන් සිදුවූ සමස්ථ කාන්තා මරණවලින් 25% කි.

දෙවන වැඩිම මරණ සංඛ්‍යාව වාර්තා වී ඇත්තේ ගස්වලින් වැටීමෙන් හෝ ගස්වලට යටවීමෙනි. 2016 වසරේ මේ ආකාරයෙන් පුද්ගලයින් 194 දෙනෙකු මියගොස් ඇති අතර 2017 වසරේ එම ප්‍රමාණය190 දක්වා 2016 වසරට සාපේක්ෂව 2% කින් පහළගොස් ඇත. 2018 වසරේ ගස්වලින් වැටීමෙන් සිදුවූ මරණ සංඛ්‍යාව 2017 වසරට සාපේක්ෂව 208 දක්වා 9% කින් ඉහළගොස් ඇත.

තෙවන විශාලම හදිසිමරණ සංඛ්‍යාව දුම්රිය අනතුරු මගින් සිදුව ඇත. වගුවට අනුව 2016 හා 2017 වසරවල පිළිවෙලින් 191 ක් හා 198 ක් වූ දුම්රිය අනතුරු මරණ සංඛ්‍යාව 2018 වසරේ 201 දක්වා සුළු ඉහළයාමක් දැකිය හැකිය. එහිදී දුම්රිය අනතුරු මගින් සිදුවූ සමස්ථ මරණවලින් 82% ක් පිරිමි පුද්ගලයින් වන අතර ඉන් බහුතරයක් වයස අවුරුදු 25 – 60 අතර පුද්ගලයින් බව ඇමුණුම 01 හදිසි මරණ වගුව මගින් පැහැදිළි වේ.

ගොඩනැගිලි ඉදිකිරීමේ දී පවත්වා ගතයුතු ආරක්ෂක ප්‍රමිතීන් නිසිපරිදි නොමැතිකම නිසා ගොඩනැගිලිවලින් වැටීමෙන් සිදුවන මරණ ද සැළකිය යුතු ප්‍රමාණයක් වගුවට අනුව හඳුනාගත හැකිය. 2016 වසරේ මෙබඳු මරණ 184 ක් වාර්තා වූ අතර එය 2017 වසරේ මෙම මරණ 216 ක් දක්වා 17% කින් ඉහළගොස් ඇත. 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ ගොඩනැගිලිවලින් ඇදවැටීමෙන් හෝ ගොඩනැගිලිවලට යටවීමෙන් සිදුවූ මරණ 180 ක් වාර්තා වී ඇති අතර එය 2017 වසරට සාපෙක්ෂව 17% ක පහළයාමක් ලෙස දැක්විය හැකිය. මෙම මරණවලින් 85% ක් පිරිමින් වන අතර වැඩිම මරණ සංඛ්‍යාවක් අවුරුදු 35 – 70 අතර වයස් ඛාණ්ඩවලට අයත් පුද්ගලයින් වේ.

අනාරක්ෂිත විදුලි පරිහරණය ද හදිසි මරණ සිදුවීමට බලපානු ලබන තවත් ප්‍රධාන හේතුවක් ලෙස වගුවට අනුව පෙන්වා දියහැකිය. 2016 වසරේ අනාරක්ෂිත විදුලි පරිහරණය නිසා විදුලිසැර වැදීමෙන් සිදුවූ මරණ සංඛ්‍යාව 135 කි. 2017 වසරේ එම මරණ ප්‍රමාණය 133 දක්වා සුළු අඩුවීමක් සිදුව ඇති අතර 2018 වසරේ වාර්තා වූ මරණ සංඛ්‍යාව 113 කි. එනම් 2017 වසරට සාපේක්ෂව 15% ක අඩුවීමකි. විදුලිසැර වැදීමෙන් 2018 වසරේ මරණයට පත්වූ පුද්ගලයින්ගෙන් 87% ක් පිරිමින් වේ.

වනසතුන් පහරදීමෙන් සිදුවන මරණද සැළකිය යුතු සංඛ්‍යාවක් පසුගිය වසර තුනෙහි වාර්තා වී ඇත. 2016 වසරේ මෙබඳු මරණ 118 ක් වාර්තා වී ඇති අතර ඊට සාපේක්ෂව 2017 වසරේ වනසතුන් පහරදීමෙන් සිදුවූ මරණ 114 දක්වා 3% කින් අඩු වී ඇත. 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ මෙබඳු මරණ 119 ක් වාර්තා වූ අතර ප්‍රතිශතයක් ලෙස එය 4% ක ඉහළයාමකි.

සර්පයින් දෂ්ඨ කිරීමෙන් සිදුවූ මරණ ගත්විට 2016 සහ 2017 වසරවල මරණ 100 බැගින් වාර්තා වී ඇති අතර 2018 වසරේ එම සංඛ්‍යාව 77 දක්වා 23% කින් පහළගොස් ඇත. සර්පයින් දෂ්ඨකිරීමෙන් සිදුවූ හදිසි මරණ පිළිබඳ වගුවෙහි දත්තවලට අනුව අනෙකුත් හදිසි මරණවලට සාපේක්ෂව ස්ත්‍රී හා පුරුෂ මරණවල විශාල පරතරයන් දක්නට නොමැති අතර වසර තුනෙහිම සර්පයින් දෂ්ඨකිරීම නිසා මියගිය කාන්තාවන්

සංඛ්‍යාව 107 කි. පුරුෂයින්ගේ සංඛ්‍යාව 170 කි. සර්පයින් දෂ්ඨ කිරීමෙන් 2018 වසරේ මියගිය පුද්ගලයින්ගෙන් 62% ක් පිරිමින් වේ.

ගින්නට හසුවීමෙන් සිදු වූ හදිසි මරණවල සැළකිය යුතු අඩුවීමක් වගුවෙහි දක්වා ඇති වසර තුනෙහි හඳුනාගත හැකිය. ඒ අනුව 2016 වසරෙහි ගින්නට හසුවීමෙන් මරණ 128 ක් සිදුව ඇති අතර ඊට සාපේක්ෂව 2017 වසරේ මරණ 106 දක්වා 17% කින් අඩුවී ඇත. 2018 වසරේ වාර්තා වූ මරණ සංඛ්‍යාව 76 ක් වූ අතර එය 2017 වසරට සාපේක්ෂව 28% ක අඩුවීමක් ලෙස හඳුනාගත හැකිය.

ඉහත සාකච්ඡා කළ අනෙකුත් හදිසි මරණවලින් වෙනස්ව ගින්නට හසුවීමෙන් සිදුව ඇති මරණවල දක්නට ලැබෙන විශේෂත්වය නම් මරණයට පත් වූ පුද්ගලයින් වැඩි පිරිසක් කාන්තාවන් වීමයි. ඒ අනුව 2016 වසරේ මේ ආකාරයෙන් මියගිය පුද්ගලයන්ගෙන් 70% ක් කාන්තාවන් වූ අතර 2017 වසරේ කාන්තා මරණ ප්‍රතිශතය 67% කි. 2018 වසරේ ගින්නට හසු වීමෙන් මියගිය පුද්ගලයින්ගෙන් 59% ක් කාන්තාවන් විය.

- ❖ **සැළකිල්ලට ලක්විය යුතු කරුණු**

සමස්ථයක් ලෙස වාර්ෂිකව සැළකියයුතු පිරිසක් හදිසි මරණවලට ලක්වන බව ඉහත දත්තවලට අනුව පෙනීයයි. එයින් ස්වාභාවික හේතු මත සිදුවන මරණ හැරුණු විට ස්වාභාවික නොවන හේතුමත ද සැළකියයුතු පිරිසක් වාර්ෂිකව මියයන බව වගු අංක 23 මගින් පැහැදිළි වේ. උදාහරණ ලෙස 2018 වසරේ මේ ආකාරයෙන් මියගිය ප්‍රමාණය 3134 කි. මෙහිදී අවධානයට ලක්කළ යුතු කරුණ නම් මෙම බොහෝ මරණ වළක්වා ගතහැකි වීමයි. උදාහරණ ලෙස වගු අංක 24 මගින් දක්වා ඇති ආකාරයේ හදිසි මරණ වළක්වා ගතහැකි අතර ඒ සඳහා ක්‍රමවත් වැඩපිළිවෙක අවශ්‍යතාවය පවතී. ඒ සඳහා සියලුම සමාජ කණ්ඩායම් දැනුවත් කළයුතු අතර සෑම කාර්යයක් සඳහාම නවීන ආරක්ෂිත ක්‍රමවේදයක් හඳුන්වා දියයුතුය. පාසල් මට්ටමේ සිට රාජ්‍ය හා පෞද්ගලික ආයතන මට්ටම දක්වා පුළුල් දැනුවත්කිරීම් සහ පසුවිපරම් කිරීම් සිදුකළ යුතු අතර පොලීසිය සහ අනෙකුත් ආරක්ෂික අංශවල ද සහයෝගයෙන් ක්‍රියාත්මක කළහැකි වැඩපිළිවෙලක් මේ සඳහා කඩිනමින් රාජ්‍ය අංශයේ මැදිහත්වීම මත ආරම්භ කිරීම මගින් මෙම අනවශ්‍ය ජීවිතහානි වළක්වා ගතහැකි වන අතර එය රටේ ආර්ථිකයට ද හිතකර වනු ඇත.

# 10. ස්වාභාවික විපත්

ශ්‍රී ලංකාව තුළ භූමියේ, මුහුදු සීමාවේ සහ උඩුගුවනේ දී සිදුවන ස්වාභාවික විපත් වර්ග අටකට බෙදා දක්වා ඇති අතර ඒවා සුලභව සිදුවන සහ සුලභ නොවන සිදුවීම් ලෙස ද හඳුනාගත හැකිය. පහත වගු අංක 25 මගින් පසුගිය වසර 03 ක එනම් 2016, 2017 සහ 2018 යන වසරවල ස්වාභාවික විපත් සංසන්දනාත්මකව විග්‍රහයට බඳුන්කර ඇත.

වගු අංක 26 **2016 – 2018 දක්වා ස්වභාවික විපත් මගින් මියයාම් හා අතුරුදහන්වීම් වගුව**

| අනු අංකය | විපත් වර්ගය | 2016 | | | | | | 2017 | | | | | | 2018 | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | මිය යන ලද පුද්ගලයින් සංඛ්‍යාව | | අතුරුදහන් වූ සංඛ්‍යාව | | අවතැන් වූ සංඛ්‍යාව | | මිය යන ලද පුද්ගලයින් සංඛ්‍යාව | | අතුරුදහන් වූ සංඛ්‍යාව | | අවතැන් වූ සංඛ්‍යාව | | මිය යන ලද පුද්ගලයින් සංඛ්‍යාව | | අතුරුදහන් වූ සංඛ්‍යාව | | අවතැන් වූ සංඛ්‍යාව | |
| | | පු | ස් | පු | ස් | පු | ස් | පු | ස් | පු | ස් | පු | ස් | පු | ස් | පු | ස් | පු | ස් |
| 1 | සුනාමි | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 2 | ජලගැලීම් | 13 | 0 | 0 | 0 | 36815 | 31491 | 55 | 74 | 18 | 15 | 131888 | 128690 | 2 | 7 | 0 | 0 | 30595 | 21638 |
| 3 | භූමි කම්පා | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 4 | නායයෑම් | 36 | 19 | 44 | 59 | 2591 | 2686 | 28 | 38 | 29 | 16 | 642 | 564 | 0 | 2 | 0 | 0 | 155 | 133 |
| 5 | සුළි සුළං | 0 | 0 | 0 | 0 | 14 | 7 | 0 | 1 | 1 | 0 | 46 | 48 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 6 | වෙනත් ස්වභාවික විපත් | 6 | 2 | 1 | 0 | 3 | 0 | 25 | 21 | 0 | 1 | 618 | 415 | 4 | 16 | 0 | 0 | 25190 | 15795 |
| එකතුව | | **55** | **21** | **45** | **59** | **39423** | **34184** | **108** | **134** | **48** | **32** | **133194** | **129717** | **6** | **25** | **0** | **0** | **55940** | **37566** |

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යාලේඛන ඒකකය

❖ **දත්ත විශ්ලේෂණය**

වගුවෙහි ඇතුළත් දත්ත විශ්ලේෂණයේ දී පැහැදිළි වන කරුණක් වන්නේ 2016, 2017 වසරවලට සාපේක්ෂව 2018 වසරේ ස්වාභාවික විපත්වලින් සිදුව ඇති මරණ සහ අවතැන්වීම් පැහැදිළි ලෙස අඩුවී ඇති බවයි.

අප රටේ බහුලව සිදුවන ස්වාභාවික විපත් වන ගංවතුර සහ නායයෑම් ගත්විට 2016 සහ 2017 වසර දෙකට සාපේක්ෂව 2018 වසරේ පැහැදිළි වෙනසක් හඳුනාගත හැකිය. එනම් නායයෑම් නිසා 2016 වසරේ 55 දෙනෙකු මියගොස් ඇති අතර 2017 වසරේ මියගිය ප්‍රමාණය 66 කි. එය 2016 වසරට සාපේක්ෂව 20% ක වැඩිවීමකි. 2018 වසරේ නායයෑම් මගින් මියගිය සංඛ්‍යාව 02 ක් වූ අතර ප්‍රතිශතයක් ලෙස එය 96% ක අඩුවීමකි.

ජලගැලීම් විපත් නිසා 2016 වසරේ 13 දෙනෙකු මියගිය අතර 2017 වසරේ ජලගැලීම් නිසා මියගිය සංඛ්‍යාව 129 ක් විය. 2018 වසරේ ජලගැලීම් නිසා මියගිය සංඛ්‍යාව 09 ක් දක්වා අඩු වී ඇත.

ජලගැලීම් නිසා අවතැන් වූ සංඛ්‍යාව ගත්විට 2016 වසරේ පුද්ගලයනින් 68306 දෙනෙකු අවතැන් වූ අතර 2017 වසරේ ජලගැලීම් නිසා අවතැන් වූ සංඛ්‍යාව 260578 දක්වා ඉහළගොස් ඇත. 2018 වසරේ ජලගැලීම් නිසා අවතැන් වූ පුද්ගලයින් ගණන 52233 කි.

වගුවෙහි වෙනත් ස්වාභාවික විපත් යනුවෙන් දක්වා ඇති ඛාණ්ඩයට අයත් වන ගොඩනැගිලි කඩාවැටීම්, බිත්ති කඩාවැටීම්, පස්කඳු කඩාවැටීම්, ඒවාට යටවී මියයාම් පිළිබඳ සලකාබැලීමේ දී 2016 වසරේ මෙබඳු විපත් මගින් මියගිය සංඛ්‍යාව 08 ක් විය. 2017 වර්ෂයේ 46 දෙනෙකු මෙබඳු වෙනත් ස්වාභාවික විපත් මගින් මියගොස් ඇති අතර 2018 වසරේ වෙනත් ස්වාභාවික විපත් මගින් මියගිය සංඛ්‍යාව 20 කි.

වගුවට අනුව ස්වාභාවික විපත් ලෙස දක්වා ඇති සුනාමි, භූමි කම්පා සහ සුළි සුළං ශ්‍රී ලංකාව තුළ දුලබ සිදුවීම් වන අතර 2018 වසරේ ඒ සම්බන්ධ සිදුවීම් වාර්තා වී නොමැත.

වගුවෙහි සඳහන් පරිදි ස්වාභාවික විපත් හේතුවෙන් අවතැන් වූ සමස්ථ සංඛ්‍යාව පිළිබඳ සළකාබැලීමේදී 2016 වසරේ පුද්ගලයින් 73607 ක් අවතැන් වූ අතර 2017 වසරේ අවතැන් වූ පුද්ගලයින් සංඛ්‍යාව 262911 දක්වා ඉහළගොස් ඇත. 2018 වසරේ ස්වාභාවික විපත් මගින් අවතැන් වූ සංඛ්‍යාව 93506 ක් වූ අතර එය 2017 වසරට සාපේක්ෂව 64% ක පහළයාමකි.

2017 වසරට සාපේක්ෂව හදිසි විපත්වලින් සිදුවූ හානි 2018 වසරේ පැහැදිලි අඩුවීමක් ඉහත දත්ත විශ්ලේෂණයට අනුව හඳුනාගත හැකිය. ඊට හේතු ලෙස සමාජ දැනුවත්භාවය මෙන්ම ආපදා අවස්ථාවලදී පොලිසිය සහ අනෙකුත් ආපදා කළමනාකරණ අංශවල සාමූහික ක්‍රියාකාරීත්වයෙහි වර්ධනය යන කරුණු පෙන්වා දියහැකිය.

# 11. විශේෂිත මහජන සේවාවන්

මහජන පැමිණිලි විසඳීම වඩාත් කාර්යක්‍ෂම හා ඵලදායි අයුරින් ක්‍රියාත්මක කිරීම සඳහා මහජන පැමිණිලි භාරගැනීමේ සහ විසඳීමේ සේවාවන් පළාත් මට්ටමින් සහ පොලිස් මූලස්ථානය ආශ්‍රිතව ක්‍රියාත්මක වේ. මේ තුළින් ජනතාවට සිය පැමිණිලි කෙළින්ම පොලිස්පතිවරයාට හෝ වෙනත් ඉහළ පොලිස් නිලධාරියෙකුට යොමු කොට සහනයක් ලබාගත හැකිය. මෙබඳු ව්‍යාපෘති හතරක් පහත වගුව මගින් දක්වා ඇති අතර ඒ සඳහා 2016, 2017 සහ 2018 යන වසරවල ලද පැමිණිලි සංසන්දනාත්මකව ඉදිරිපත් කර ඇත.

වගු අංක 27

2016 – 2018 දක්වා මහජන පැමිණිලි විසඳීම් සම්බන්ධ වගුව

| අනු අංකය | පැමිණිලි වර්ගය | 2016 | | | | 2017 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා වූ පැමිණිලි සංඛ්‍යාව | විසඳූ පැමිණිලි සංඛ්‍යාව | විමර්ශනය වෙමින් පවතින සංඛ්‍යාව | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා වූ පැමිණිලි සංඛ්‍යාව | විසඳූ පැමිණිලි සංඛ්‍යාව | විමර්ශනය වෙමින් පවතින සංඛ්‍යාව | විසඳීමේ ප්‍රතිශතය | වාර්තා වූ පැමිණිලි සංඛ්‍යාව | විසඳූ පැමිණිලි සංඛ්‍යාව | විමර්ශනය වෙමින් පවතින සංඛ්‍යාව | විසඳීමේ ප්‍රතිශතය |
| 1 | පොලිස්පති මහජන සහන දිනය | 1323 | 1288 | 35 | 97% | 1500 | 1459 | 41 | 97% | 1328 | 1047 | 281 | 79% |
| 2 | 119 | 1002283 | 997970 | 4313 | 100% | 1124828 | 1119627 | 5201 | 100% | 1123210 | 1118801 | 4409 | 100% |
| 3 | පොලිස්පතිට කියන්න | 1844 | 1841 | 3 | 100% | 2008 | 1990 | 20 | 99% | 2046 | 1644 | 402 | 80% |
| 4 | මහජන සහන මැදිරිය | 1785 | 1521 | 264 | 85% | 1566 | 1367 | 199 | 87% | 1171 | 598 | 573 | 51% |
| එකතුව | | **1007235** | **1002620** | **4615** | **100%** | **1129902** | **1124443** | **5461** | **100%** | **1127755** | **1122090** | **5665** | **99%** |

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යාලේඛන ඒකකය

❖ **දත්ත විශ්ලේෂණය**

වගුවට අනුව පොලිස්පති මහජන සහන දිනය සඳහා ලද පැමිණිලිවල 2016 වසරට සාපේක්‍ෂව 2017 වසරේ වැඩිවීමක් හඳුනාගත හැකිය. ඒ අනුව 2016 වසරේ ලද පැමිණිලි සංඛ්‍යාව 1323 ක් වූ අතර එය 1500 දක්වා 13% කින් 2017 වසරේ වර්ධනය වී ඇත. 2018 වසරේ පැමිණිලි ප්‍රමාණය 2017 වසරට සාපේක්‍ෂව 1328 දක්වා 11% කින් අඩු වී ඇත. විසඳුම් ලබාදීම ගත්විට 2018 වසරේ පොලිස්පති මහජන සහය දිනය වෙත යොමු කළ පැමිණිලිවලින් 79% ක් සඳහා විසඳුම් ලබා දී ඇත. 2017 වසරේ එම ප්‍රතිශතය 97% කි.

මෙම ව්‍යාපෘතිවලින් වැඩිම පැමිණිලි ප්‍රමාණයක් ලැබෙන සේවාව 119 පැමිණිලි සේවාව වේ. වගුවට අනුව මෙම සේවාව සඳහා 2016 වසරේ ලැබුණු පැමිණිලි සංඛ්‍යාව 1002283 කි. එය 2017 වසරේ 12% කින් වර්ධනය වෙමින් පැමිණලි 1124828 ක් වාර්තා විය. 2018 වසරේ 119 වෙත ලැබුණු පැමිණිලි සංඛ්‍යාව 1123210 ක් වූ අතර එය 2017 වසරට සාපේක්‍ෂව පහළයාමකි. මෙම පැමිණිලි සඳහා විසඳුම් ලබාදීමේ ප්‍රතිශතය ගත්විට වසර තුනෙහිදීම 99% ඉක්මවා ඇත.

පොලිස්පතිට කියන්න සේවාව සඳහා 2016 වසරේ පැමිණිලි 1844 ක් ලැබුණු අතර 2017 වසරේ පැමිණිලි 2018 දක්වා 9% කින් වැඩි වී ඇත. 2017 වසරට සාපේක්‍ෂව 2018 වසරේ ලැබුණු පැමිණිලි 2046 දක්වා 2% ක අඩුවීමක් පෙන්නුම් කර ඇත. මෙම පැමිණිලි විසඳීමේ ප්‍රතිශතය 2018 වසරේ 80% ක් වූ අතර එය 2017 වසරේ වාර්තා කළ 99% ක විසඳීමේ ප්‍රතිශතයට සාපේක්‍ෂව පහළයෑමකි.

**'පොලිස්පතිට කියන්න'** ව්‍යාපෘතියට ලැබුණු පැමිණිවල පෙර සඳහන් කළ පරිදි ඉහළයාමක් පෙන්වන අතර මහජන මහජන සහන මැදිරියට ලැබුණු පැමිණිලිවල පහළයාමක් හඳුනාගත හැකිය. 2016 වසරේ මහජන සහන මැදිරිය වෙත පැමිණිලි 1785 ක් ලැබුණු අතර 2017 වසර වන විට එය 1566 දක්වා 12% කින් අඩු වී ඇත. 2018 වන විට එම සංඛ්‍යාව 1171 දක්වා 25% කින් තවදුරටත් පහළ ගොස් ඇත.

මහජන සහන මැදිරිය වෙත ලැබුණු පැමිණිලිවල ද 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ විසඳීම් ප්‍රතිශතයෙහි අඩුවීමක් දැකිය හැක. 2016 සහ 2017 වසරවල පිළිවෙලින් 86% ක් සහ 87% ක් වූ විසඳීමේ ප්‍රතිශතය 2018 වසරේ 51% දක්වා පහළගොස් ඇත.

කෙසේ වුව ද සමස්ථයක් ලෙස මෙම ව්‍යාපෘති හතරම සඳහා ලැබුණු මුළු පැමිණිවල විසඳීම් ප්‍රතශතය 99% ඉක්මවා ඇත.

### 11.1 නිශ්කාෂණ සේවාව

ශ්‍රී ලංකා පොලීසිය විසින් ක්‍රියාත්මක කරනු ලබන විශේෂිත මහජන සේවාවක් ලෙස මෙම නිශ්කාෂණ සේවාව හඳුන්වාදිය හැකිය. මෙමගින් දේශීය සහ විදේශීය වශයෙන් අයදුම්කරුවන් වෙත පොලිස් වාර්තා නිකුත් කරනු ලබන අතර මෙම වාර්තා ඉතා විශ්වසනීය බවට දේශීය මෙන්ම විදේශීය වශයෙන්ද පිළිගැනීමට ලක් වේ. 2018 වසරේ නිශ්කාෂණ සේවාව ක්‍රියාත්මක වූ ආකාරය පිළිබඳ දත්ත පහත වගුව මගින් දක්වා ඇත.

වගු අංක 28 **2018 වසරේ නිශ්කාෂණ වාර්තා නිකුත් කිරීම සම්බන්ධ වගුව**

| | ලද අයදුම්පත් ප්‍රමාණය | නිකුත් කළ වාර්තා ප්‍රමාණය | ප්‍රතිශතය | නිකුත් කිරීමට ඇති වාර්තා ප්‍රමාණය | ලද ආදායම (රුපියල්) |
|---|---|---|---|---|---|
| දේශීය නිශ්කාෂණ වාර්තා | 39088 | 38992 | 100% | 96 | 39,132,500.00 |
| විදේශීය නිශ්කාෂණ වාර්තා | 11159 | 10272 | 92% | 887 | 16,738,500.00 |
| **එකතුව** | **50247** | **49264** | **98%** | **983** | **55,871,000.00** |

මූලාශ්‍රය - පොලිස් මූලස්ථානය නිශ්කාෂණ අංශය

❖ **දත්ත විශ්ලේෂණය**

වගුවට අනුව 2018 වසරේ ඉදිරිපත් කරන ලද දේශීය අයදුම්පත් 39088 කින් 38992 ක් එනම් 99% ක් සඳහා නිශ්කාෂණ වාර්තා නිකුත් කර ඇත. 2018 වසරේ තානාපති කාර්යාල සහ අන්තර්ජාලය මගින් විදේශීය නිශ්කාෂණ අයදුම්පත් 11159 ක් ලැබී ඇති අතර එයින් 10272 ක් සඳහා වාර්තා නිකුත් කර ඇත. මීට අමතරව 2017 වසරේ ලද අයදුම්පත් 1683 ක් සඳහා ද නිශ්කාෂණ වාර්තා 2018 වසරේ නිකුත් කර ඇති අතර ඒ අනුව 2018 වසරේ නිකුත් කර ඇති මුළු විදෙස් නිශ්කාෂණ වාර්තා ප්‍රමාණය 11955 කි.

වගුවට අනුව නිශ්කාෂණ වාර්තා ලබාදීමෙන් ශ්‍රී ලංකා පොලීසිය 2018 වසරේ රුපියල් මිලියන 55 කට අධික මුදලක් උපයාගෙන ඇත.

# 12. ප්‍රජා පොලිස් සේවය

වඩා ඵලදායි පොලිස් සේවයක් ලබාදීම සඳහා ප්‍රජා දායකත්වය සහ සහයෝගය ලබාගැනීම අදවන විට ලොවපුරා භාවිතයට ගැනෙන ක්‍රමවේදයකි. ශ්‍රී ලංකා පොලීසිය ද ඉහත සංකල්පයන් පාදක කරගනිමින් ඉතා සාර්ථකව ප්‍රජා පොලිස් ක්‍රමවේදය ක්‍රියාත්මක කරනු ලබයි. ඒ යටතේ 2018 වර්ෂයේ දී විවිධ කමිටු පැවැත්වීම්, දැනුවත්කිරීම් මෙන්ම විවිධ ක්‍රියාකාරකම් ද ඇතුළු බොහෝ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති අතර ඒ යටතේ පොලිස් කාර්යයන් සඳහා මහජන සහාය විවිධාකාරයෙන් ලබාගෙන ඇත. පහත දැක්වෙන වගු මගින් 2018 වසරේ මුළු දිවයිනම ආවරණය වන පරිදි ප්‍රජා පොලිස් සේවය ක්‍රියාත්මක වූ ආකාර පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර ඇත.

## 12.1 විවිධ කමිටු පැවැත්වීම

2018 වසර පුරා පවත්වන ලද උපදේශක සභා කමිටු, ප්‍රජා පොලිස් මව් කමිටු, ප්‍රජා පොලිස් කමිටු සහ එම කමිටුවල සහභාගීත්වය පිළිබඳ තොරතුරු පහත වගු අංක 27, 28 සහ 29 මගින් ඉදිරිපත් කර ඇත.

වගු අංක 29

**2018 වසරේ ප්‍රජා පොලිස් උපදේශක සභා පැවැත්වීම් වගුව**

| පළාත් අංකය | කොට්ඨාශ සංඛ්‍යාව | උපදේශක සභා පිහිටුවා ඇති පොලිස් ස්ථාන සංඛ්‍යාව | පැවැත්විය යුතු කමිටු සංඛ්‍යාව | පවත්වා ඇති කමිටු සංඛ්‍යාව | සහභාගී වූ සාමාජික සංඛ්‍යාව | ස්ථානාධිපති සහභාගී වීම | දිස්ත්‍රික් භාර පො.අ/ ස.පො.අ. සහභාගී වීම | කොට්ඨාශ භාර නිලධාරී සහභාගී වීම |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | 42 | 486 | 5820 | 5358 | 41585 | 5282 | 1815 | 339 |

මූලාශ්‍රය - ප්‍රජා පොලිස් කොට්ඨාසය

වගු අංක 30

**2018 වසරේ ප්‍රජා පොලිස් මව් කමිටු පැවැත්වීම් වගුව**

| පළාත් අංකය | කොට්ඨාශ සංඛ්‍යාව | මව් කමිටු පිහිටුවා ඇති පොලිස් ස්ථාන සංඛ්‍යාව | පැවැත්විය යුතු මව් කමිටු සංඛ්‍යාව | පවත්වා ඇති මව් කමිටු සංඛ්‍යාව | සහභාගී වූ සාමාජික සංඛ්‍යාව | ස්ථානාධිපති සහභාගී වීම | දිස්ත්‍රික් භාර පො.අ./ ස.පො.අ. සහභාගී වීම | කොට්ඨාශ භාර නිලධාරී සහභාගී වීම |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | 42 | 486 | 1944 | 2600 | 81430 | 3125 | 823 | 253 |

මූලාශ්‍රය - ප්‍රජා පොලිස් කොට්ඨාසය

වගු අංක 31 **2018 වසරේ ප්‍රජා පොලිස් කමිටු පැවැත්වීම් වගුව**

| අනු අංකය | කොට්ඨාශ සංඛ්‍යාව | ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව | පිහිටුවා ඇති ප්‍රජා පොලිස් කමිටු සංඛ්‍යාව | මාසය තුළ පැවැත්විය යුතු සංඛ්‍යාව | වර්ෂය තුළ පවත්වන ලද සංඛ්‍යාව | වර්ෂය තුළ නොපවත්වන ලද සංඛ්‍යාව | සහභාගී වූ කමිටු සාමාජිකයින් සංඛ්‍යාව | සහභාගී වූ වෙනත් පුද්ගලයින් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | 42 | 14092 | 14068 | 14068 | 158435 | 10381 | 2671218 | 1509800 |

මූලාශ්‍රය - ප්‍රජා පොලිස් කොට්ඨාසය

## 12.2 විවිධ දැනුවත් කිරීම් හා ක්‍රියාකාරකම් සිදුකිරීම

මේ යටතේ විවිධ ක්ෂේත්‍ර ඔස්සේ දැනුවත් කිරීම් සිදුකරනු ලබන අතර ළමා හිංසනය මත්ද්‍රව්‍ය උවදුර දුරලීම බෝවන රෝග පාලනය සහ විවිධ වෘත්තීය පුහුණු වැඩමුළු ද ක්‍රියාත්මක කර ඇත.

මීට අමතරව ජංගම පොලිස් ස්ථාන පිහිටුවීම සහ වාර්ෂිකව සිදුකරනු ලබන විවිධ සංස්කෘතික උත්සව සහ ක්‍රීඩා වැඩසටහන්, ආගමික සහජීවනය පිළිබඳ වැඩසටහන්, ශ්‍රමදාන ඇතුළු පරිසර පවිත්‍රතා වැඩසටහන් එක්දින පොලිස් ජංගම සේවා වැඩසටහන් ආදිය මගින් විශාල සේවයක් ප්‍රජාව වෙත ඉටුකර ඇති අතර එම තොරතුරු පහත වගු මගින් ඉදිරිපත් කර ඇත.

වගු අංක 32 **2018 වසරේ ළමා අපචාර හා ළමා හිංසන වැළැක්වීම සඳහා දැනුවත් කිරීම් හා ක්‍රියාකාරකම් වගුව**

| අනු අංකය | කොට්ඨාශ සංඛ්‍යාව | ළමුන් දැනුවත් කිරීම | | | | වැඩිහිටියන් දැනුවත් කිරීම | | | සහභාගී වූ පොලිස් නිලධාරීන් සංඛ්‍යාව | සහභාගී වූ සම්පත් දායකයින් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | පාසල් ළමුන් සඳහා දැනුවත් කිරීම් හා ක්‍රියාකාරකම් සංඛ්‍යාව | පෙර පාසල්, පරිවාස නිවාස, දහම් පාසල් වැනි ආයතනවල ළමුන් සඳහා දැනුවත් කිරීම් හා ක්‍රියාකාරකම් සංඛ්‍යාව | ග්‍රාම නිලධාරී වසම්වල ළමුන් සඳහා දැනුවත් කිරීම් හා ක්‍රියාකාරකම් සංඛ්‍යාව | සහභාගී වූ ළමුන් සංඛ්‍යාව | ග්‍රාම නිලධාරී වසම්වල වැඩිහිටියන් සඳහා දැනුවත් කිරීම් හා ක්‍රියාකාරකම් සංඛ්‍යාව | හඳුනා ගන්නා ලද කණ්ඩායම්වල වැඩිහිටියන් සඳහා දැනුවත් කිරීම් හා ක්‍රියාකාරකම් සංඛ්‍යාව ( වැඩිහිටියන්, විදේශ ගතවූ පවුල්, මත්පැන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ පවුල් ) | සහභාගී වූ වැඩිහිටියන් සංඛ්‍යාව | | |
| 1 | 42 | 22964 | 10199 | 27653 | 2465423 | 130538 | 20427 | 2639474 | 192396 | 29838 |

මූලාශ්‍රය - ප්‍රජා පොලිස් කොට්ඨාසය

වගු අංක 33

**2018 වසරේ ප්‍රජාව දැනුවත් කිරීම් හා ක්‍රියාකාරකම් වගුව**

| අනු අංකය | වැඩසටහන | ප්‍රමාණය |
|---|---|---|
| **1** | ප්‍රජාව දැනුවත් කිරීමේ දේහන (අපරාධ/ ළමා හිංසන/ කාන්තා හිංසන/ රථවාහන/ මත්ද්‍රව්‍ය ආදිය) | 157778 |
| **2** | ඩෙංගු ඇතුළු බෝවන රෝග පිළිබඳ දැනුවත් කිරීම් | 118497 |
| **3** | පාසල් දරුවන් දැනුවත් කිරීමේ දේශන (ළමා හිංසන/ ළමා අපචාර/ නායකත්ව ආදිය | 25119 |
| **4** | පාසල් හැරගිය දරුවන් (ඉලක්ක කණ්ඩායම් වෘත්තීය පුහුණු සඳහා යොමු කිරීමට පවත්වන ලද වැඩමුළු, දේශන ආදිය උදා:- ආධුනිකත්ව මණ්ඩලය/ කාර්මික විද්‍යාල) | 4399 |
| **5** | පාසල් වෑන් රථ රියදුරන්/ සහයකයින් දැනුවත් කිරීම | 13521 |
| **6** | බස් රථ/ ත්‍රීවිල් රථ/ ලොරි රථ හා අනෙකුත් වාහන රියදුරන්/ කොන්දොස්තරවරුන්/ මගීන් හා පාරිභෝගිකයන් දැනුවත් කිරීම | 31697 |
| **7** | මත්ද්‍රව්‍ය හා මත්පැන් උවදුර දුරුකිරීම සඳහා පවත්වන ලද දැනුවත් කිරීම් | 96416 |
| **8** | වෙනත් දැනුවත් කිරීම් | 32813 |
| | **එකතුව** | **480240** |
| **1** | පාසල් දරුවන් අතර කථික තරඟ/ චිත්‍ර තරඟ/ අනෙකුත් ක්‍රීඩා තරඟ පැවැත්වීම | 2391 |
| **2** | ප්‍රජා සහභාගිත්වයෙන් උත්සව පැවැත්වීම (අවුරුදු උත්සව/ ආගමික උත්සව/ ක්‍රිකට්, අත්පන්දු ආදි ක්‍රීඩා තරඟ පැවැත්වීම) | 12673 |
| **3** | ආගම් අතර සහජීවනය ඇති කිරීම සඳහා පවත්වන ලද වැඩසටහන් | 13746 |
| **4** | මංමාවත්/ ලඳුකැලෑ/ පාළු ස්ථාන ආදිය සුද්ද පවිත්‍ර කිරීමේ ශ්‍රමදාන (ඩෙංගු මර්දන/ පරිසර පවිත්‍රතා ආදිය පැවැත්වීම) | 28279 |
| **5** | ප්‍රජා සේවාවන් (මංමාවත සැකසීම්/ නිවාස තනාදීම් හා වෙනත්) | 7163 |
| **6** | ප්‍රජා පොලිස් කමිටු සාමාජිකයින් මගින් සාර්ථක තොරතුරු ලබාගැනීම | 14821 |
| **7** | පාසල් නොයන ළමුන් පාසල් යැවීමට දිරිගැන්වීම | 10732 |
| 8 | වෙනත් ක්‍රියාකාරකම් | 11605 |
| | **එකතුව** | **101410** |
| | **මුළු එකතුව** | **581650** |
| **සහභාගිත්වය** | පොලිස් නිලධාරීන් | 357103 |
| | ප්‍රජා පොලිස් කමිටු සාමාජිකයින් | 2145480 |
| | ප්‍රජාව | 5020034 |
| | **එකතුව** | **7522617** |

මූලාශ්‍රය - ප්‍රජා පොලිස් කොට්ඨාසය

### 12.3 පොලිස් ජංගම සේවාව පැවැත්වීම

2018 වසර පුරා පවත්වන ලද ජංගම පොලිස් ස්ථාන පැවැත්වීම හා එක්දින ජංගම සේවාවන් පැවැත්වීම සම්බන්ධ තොරතුරු පහත වගු අංක 33 සහ 34 මගින් ඉදිරිපත් කරඇත.

වගු අංක 34 **2018 වසරේ එක්දින පොලිස් ජංගම සේවාව මගින් පැවැත්වූ වැඩසටහන් වගුව**

| | | |
|---|---|---|
| **ප්‍රාදේශීය පොලිස් කොට්ඨාස සංඛ්‍යාව** | | **42** |
| **පවත්වා ඇති ජංගම සේවාවන් සංඛ්‍යාව** | | **1987** |
| අනු අංකය | නව පැමිණිලි සටහන් කළ සංඛ්‍යාව | 4170 |
| 1 | විභාග කරන ලද පැමිණිලි සංඛ්‍යාව | 3652 |
| 2 | සමථ මණ්ඩලයට යොමු කළ පැමිණිලි සංඛ්‍යාව | 1029 |
| 3 | නිකුත් කරන ලද පැමිණිලි පිටපත් සංඛ්‍යාව | 3901 |
| 4 | නිකුත් කරන ලද ක්ෂණික පැමිණිලි පිටපත් සංඛ්‍යාව | 6211 |
| 5 | උප්පැන්න/ මරණ/ විවාහ ලියාපදිංචි කිරීම් | 1920 |
| 6 | රථවාහන අංශය මගින් අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම | 1358 |
| 7 | අපරාධ/ විවිධ පැමිණිලි අංශ මගින් අපරාධ වැළැක්වීම සම්බන්ධයෙන් අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම | 880 |
| | ළමා හා කාන්තා කාර්යාංශ මගින් අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම | 944 |
| | දූෂණ මර්දන අංශය මගින් අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම | 1308 |
| 8 | පාසල් සිසුන් අතර කථික තරඟ පැවැත්වීම | 324 |
| 9 | තරුණයන් අතර ක්‍රීඩා තරඟ පැවැත්වීම | 692 |
| 10 | වෛද්‍ය සායන පැවැත්වීම | 1053 |
| | අක්ෂි සායන පැවැත්වීම | 458 |
| | මැලේරියා හා රුධිර සායන පැවැත්වීම | 228 |
| | ආයුර්වේද සායන පැවැත්වීම | 618 |
| 11 | කෘෂි උපදේශන හා පැල බෙදාදීම් සම්බන්ධ වැඩසටහන් | 3472 |
| 12 | වෙනත් සමාජ සේවාවන් ඉටුකිරීම | 2950 |
| 13 | වෙනත් දේශන | 4059 |
| | **වැඩසටහන්වල එකතුව** | **39227** |
| 14 | පොලිස් නිලධාරීන් | 32901 |
| 15 | හමුදා නිලධාරීන් හා රජයේ නිලධාරීන් | 3176 |
| 16 | රාජ්‍ය අංශ නිලධාරීන් | 38282 |
| 17 | මහ ජනතාව | 606569 |
| 18 | ආරාධිත අමුත්තන් ඇතුළු මහජනතාව | 28591 |
| **සහභාගීවීම් එකතුව** | | **709519** |

මූලාශ්‍රය - ප්‍රජා පොලිස් කොට්ඨාසය

වගු අංක 35 **2018 වසරේ ජංගම පොලිස් ස්ථාන ආශ්‍රිත ක්‍රියාකාරකම් වගුව**

| | | |
|---|---|---|
| **කොට්ඨාස සංඛ්‍යාව** | | 42 |
| **ජංගම පොලිස් ස්ථානයට අනුයුක්ත කළ නිලධාරීන්** | | **4665** |
| **පැවැත් වූ වැඩසටහන්** | ආගමික වැඩසටහන් | 3896 |
| | සංස්කෘතික වැඩසටහන් | 1763 |
| | සෞඛ්‍ය වැඩසටහන් | 3993 |
| | අධ්‍යාපනික වැඩසටහන් | 4483 |
| | ක්‍රීඩා වැඩසටහන් | 1624 |
| | ශ්‍රමදාන වැඩසටහන් | 6532 |
| | වෙනත් | 4288 |
| ලැබුණු පැමිණිලි සංඛ්‍යාව | | 6184 |
| නිකුත් කළ පැමිණිලි පිටපත් සංඛ්‍යාව | | 4162 |
| විභාග කළ පැමිණිලි පිටපත් සංඛ්‍යාව | | 6351 |
| ක්‍රියාකළ සිතාසි සංඛ්‍යාව | | 3218 |
| ක්‍රියාකළ වරෙන්තු සංඛ්‍යාව | | 1088 |
| සිදුකරන ලද දූෂණ මර්දන වැටලීම් සංඛ්‍යාව | | 3510 |
| වෙනත් | | 5611 |
| තක්සේරු කරන ලද මූල්‍යමය වටිනාකම :- **රුපියල්** | | **523135905** |

මූලාශ්‍රය - ප්‍රජා පොලිස් කොට්ඨාසය

## 12.4 නිවාස තැනීම හා අළුත්වැඩියාව

නිවසක් යනු මිනිසාගේ මූලික අවශ්‍යතාවයකි. එබැවින් නිවසක් නොමැති තැනැත්තෙකු වෙත නිවසක් තනාදීම උතුම් සමාජ සත්කාරයකි. ශ්‍රී ලංකා පොලීසිය ප්‍රජාවගේ සහයෝගයෙන් 2018 වසර තුළ නව නිවාස තැනීම් සහ නිවාස අළුත්වැඩියා කිරීම් රැසක් සිදුකර ඇති අතර එමගින් ප්‍රජාවට විශාල සේවාවක් සැපයීමට සමත්ව ඇත. සෑම වසරකම ශ්‍රී ලංකා පොලීසියේ මගපෙන්වීම යටතේ ප්‍රජා දායකත්වයෙන් මෙබඳු සමාජ සත්කාර ක්‍රියාත්මක කරනු ලබන අතර 2018 වසරේ මෙම සේවාව ක්‍රියාත්මක වූ අකාරය සම්බන්ධ තොරතුරු පහත වගු අංක 35 සහ 36 මගින් ඉදිරිපත් කරඇත.

වගු අංක 36 **2018 වසරේ දිළිඳු පවුල් සඳහා ඉදි කරන ලද නව නිවාස සම්බන්ධ වගුව**

| අනු අංකය | පළාත | කොට්ඨාස සංඛ්‍යාව | ආරම්භ කරන ලද නිවාස සංඛ්‍යාව | වැඩ අවසන් කර ඇති නිවාස සංඛ්‍යාව | ඉදිවෙමින් පවතින නිවාස සංඛ්‍යාව | වැය වූ දළ ඇස්තුමේන්තුගත මුදල (රුපියල්) |
|---|---|---|---|---|---|---|
| 1 | මධ්‍යම | 5 | 5 | 1 | 4 | 3,240,000.00 |
| 2 | සබරගමුව | 3 | 6 | 1 | 5 | 4,200,000.00 |
| 3 | ඌව | 3 | 27 | 7 | 20 | 28,503,526.00 |
| 4 | දකුණ | 4 | 23 | 9 | 14 | 21,342,500.00 |
| 5 | නැගෙනහිර | 4 | 7 | 7 | 6 | 4,713,267.10 |
| 6 | උතුර | 6 | 15 | 5 | 10 | 5,391,701.90 |
| 7 | උතුරු මැද | 2 | 12 | 4 | 8 | 8,459,080.00 |
| 8 | වයඹ | 5 | 33 | 13 | 20 | 43,682,813.00 |
| 9 | බස්නාහිර | 10 | 11 | 6 | 5 | 5,872,450.00 |
| **එකතුව** | | **42** | **139** | **53** | **92** | **125,405,338.00** |

මූලාශ්‍රය - ප්‍රජා පොලිස් කොට්ඨාසය

වගු අංක 37 **2018 වසරේ අළුත්වැඩියා කරන ලද දිළිඳු පවුල් නිවාස සම්බන්ධ වගුව**

| අනු අංකය | පළාත | කොට්ඨාස සංඛ්‍යාව | අළුත්වැඩියා ආරම්භ කරන ලද නිවාස සංඛ්‍යාව | අළුත්වැඩියා අවසන් කර ඇති නිවාස සංඛ්‍යාව | අළුත්වැඩියා වෙමින් පවතින නිවාස සංඛ්‍යාව | වැය වූ දළ ඇස්තුමේන්තුගත මුදල (රුපියල්) |
|---|---|---|---|---|---|---|
| 1 | මධ්‍යම | 5 | 4 | 4 | 0 | 133,200.00 |
| 2 | සබරගමුව | 3 | 6 | 1 | 5 | 10,245,400.00 |
| 3 | ඌව | 3 | 3 | 2 | 1 | 1,648,487.75 |
| 4 | දකුණ | 4 | 2 | 2 | 0 | 250,000.00 |
| 5 | නැගෙනහිර | 4 | 3 | 2 | 1 | 984,500.00 |
| 6 | උතුර | 6 | 0 | 0 | 0 | - |
| 7 | උතුරු මැද | 2 | 2 | 2 | 0 | 262,500.00 |
| 8 | වයඹ | 5 | 1 | 1 | 0 | 3,809,874.00 |
| 9 | බස්නාහිර | 10 | 12 | 10 | 2 | 5,278,750.00 |
| එකතුව | | **42** | **33** | **24** | **9** | **22,612,711.75** |

මූලාශ්‍රය - ප්‍රජා පොලිස් කොට්ඨාසය

❖ **දත්ත විශ්ලේෂණය මගින් ප්‍රජා පොලිස් ක්‍රියාවලියෙහි ඵලදායිත්වය මැන බැලීම**

ශ්‍රී ලංකා පොලීසිය ප්‍රජා සහභාගිත්වයෙන් 2018 වසරේ ක්‍රියාත්මක කරන ලද ප්‍රජා පොලිස් වැඩසටහන් යටතේ විවිධ දැනුවත් කිරීම්, කමිටු පැවැත්වීම් විශාල ප්‍රමාණයක් සිදුකර ඇති බව ඉහත වගු ආශ්‍රයෙන් හඳුනාගත හැකිය. සාරාංශ ගතකළ විට 2018 වසරේ විවිධ කමිටු 166393 ක් පවත්වා ඇති අතර එම කමිටු සඳහා සහභාගීත්වය පුද්ගලයින් 2794233 කි.

2018 වසරේ ළමයින් දැනුවත් කිරීම් ගත්විට අපරාධ, ළමා හිංසනය, කාන්තා හිංසනය, ළමා අපචාර, මත්ද්‍රව්‍ය අපරාධ වැනි පුළුල් විෂය ක්ෂේත්‍රයක් ආවරණය වන පරිදි ළමයින් දැනුවත් කර ඇති අතර එම සියළු දැනුවත් කිරීම් අවස්ථා සඳහා සහභාගී වූ ළමයින් ගණන 2465423 කි.

මීට අමතරව පොලිස් ජංගම සේවා වැඩසටහන් මගින් ප්‍රජා සත්කාරක ව්‍යාපෘතීන් රැසක් ක්‍රියාත්මක කර ඇති අතර ඒ සඳහා සහභාගී වූ පුද්ගලයන් ප්‍රමාණය 709519 කි.

ප්‍රජා පොලිස් ක්‍රියාවලිය සඳහා සෑම වසරකම ශ්‍රී ලංකා පොලීසිය විශාල නිලධාරීන් ප්‍රමාණයකගේ සේවය ලබා දේ. ග්‍රාමනිලධාරී වසම් 14092 ක් ආවරණය වන පරිදි 2018 වසරේ කමිටු 14068 ක් පිහිටුවා ඇත. මෙම සෑම කමිටුවක් භාරවම පොලිස් නිලධාරියෙකු කටයුතු කරනුලබන අතර ඔහු විසින් සමස්ථ ප්‍රජා පොලිස් ක්‍රියාවලිය වසම හා සම්බන්ධීකරණය කරනු ලබයි.

විශාල ප්‍රජා සහභාගීත්වයක් විශාල පොලිස් නිලධාරීන් ප්‍රමාණයක් සහ විශාල දැනුවත් කිරීම් ප්‍රමාණයක් වසරක දී සිදුවන අතර එම ක්‍රියාකාරීත්වයේ ඵලදායිත්වය මැනබැලීමේ ක්‍රමවේදයක් සැකසීම විශේෂයෙන් සැළකිල්ලට ලක්විය යුතු කාරණයකි.

2018 වසරේ බල අපරාධ, කාන්තාවන්ට හා ළමයින්ට එරෙහි බල අපරාධ, සුළු අපරාධ, විවිධ පැමිණිලි, මත්ද්‍රව්‍ය වැරදි සහ සුරාව සම්බන්ධ වැරදි වාර්තා වීම නිර්ණායක ලෙස ගෙන ඒ මගින් ප්‍රජා පොලිස් ක්‍රියාවලියෙහි ඵලදායිත්වය එක්තරා මට්ටමකින් මැන බැලිය හැකිවේ.

2018 වසරේ වාර්තා වූ බල අපරාධ ප්‍රමාණය 2017 වසරට සාපේක්ෂව 1%ක පමණ ඉහළයාමක් සිදු වුවද පසුගිය වසර කිහිපයක් අධ්‍යයනය කළ විට ඊට සාපේක්ෂව බල අපරාධවල පහළයාමක් දැකිය හැකිය.

එසේ වුවද ළමයින්ට එරෙහි බල අපරාධ 15% කින් 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ ඉහළ ගොස් ඇති අතර ළමයින්ට එරෙහි සුළු අපරාධවල ද ඉහළයාමක් දැකිය හැකිය.කාන්තාවන්ට එරෙහි බල අපරාධ 2017 වසරට සාපේක්ෂව 4% ක පහළයාමක් දැකියහැකි අතර කාන්තාවන්ට එරෙහි සුළු අපරාධවල ද පහළයාමක් දැකියහැකිය.

විවිධ පැමිණිලි ගත්විට පහරදීම් 2017 වසරට වඩා අඩුවීමක් දැකිය හැකි අතර පවුල් ආරවුල් 4% කින් ද ඉඩම් ආරවුල් 7% කින් ද පහළ ගොස් ඇත. එමෙන්ම දෙමව්පියන්ට හිරිහැරකිරීම හෝ නොසළකාහැරීම 7% කින් අඩුවී ඇත.

දූෂණ වැරදි 9% කින් අඩුවී ඇති අතර ව්‍යවස්ථාපිත වැරදි යටතේ එන පරිසරයට එරෙහි වැරදි සැළකිය යුතු මට්ටමකින් අඩු වී ඇත.මත්ද්‍රව්‍ය අපරාධ වාර්තාවීම් 2017 වසරට සාපේක්ෂව 16% කින් ඉහළගොස් ඇති අතර අත්අඩංගුවට ගත් පුද්ගලයින් සංඛ්‍යාව 9% කින් ඉහළගොස් ඇත.

❖ **සැළකිල්ලට ලක්වියයුතු කරුණු**

සමස්ථයක් ලෙස ප්‍රජාපොලිස් ක්‍රියාවලිය මගින් සිදුවන ක්‍රියාකාරකම්වල ඵලදායිත්වය ඉහත දක්වන ලද නිර්ණායක ඔස්සේ යම් මට්ටමකින් මැනබැලිය හැකිය. විශේෂයෙන්ම නොයෙක් වැඩසටහන් මගින් දරුවන් හා වැඩිහිටියන් දැනුවත්වීම අපරාධ අඩුවීම කෙරෙහි බලපෑමක් එල්ලකර ඇති බව පෙනේ. එමෙන්ම පොලීසිය වෙත තොරතුරු ගලාඒම තුළින් මත්ද්‍රව්‍ය වැරදි වැඩි වැඩියෙන් අනාවරණය වන අතර වැරදිකරුවන් අත්අඩංගුවට පත්වීම ද වේගවත් වී ඇත.

මේ ආකාරයෙන් ප්‍රජා පොලිස් ක්‍රියාවලියෙහි ඵලදායිත්වය යම් මට්ටමකින් මැනබැලිය හැකි වුවද ඒ සඳහා පුළුල් හා විධිමත් ක්‍රමවේදයක් අවශ්‍යව පවතී. එමගින් එහි සාධනීය සහ දුර්වලතාවයන් හඳුනාගෙන තවදුරටත් මෙම ක්‍රමය ප්‍රවර්ධනය කිරීම තුළින් අපරාධ අවමකර ගතහැකි අතර සමාජ ආරක්ෂාව වර්ධනය කළහැකිය. මෙම ක්‍රියාවලියෙහි නියුතු නිලධාරීන් නිසි ඇගයීමකට ලක්කිරීම ද කළයුතු අතර එමගින් ප්‍රජාපොලිස් ක්‍රියාවලිය කෙරෙහි පොලිස් නිලධාරියාගේ කැපවීම තවදුරටත් වැඩිදියුණු කළහැකි අතර සමස්ථයක් ලෙස ප්‍රජාපොලිස් සංකල්පයෙහි උපරිම ප්‍රතිඵල අත්කරගත හැකි වනු ඇත.

## 13. පරිසර ආරක්ෂණය

පරිසරයට එරෙහි වැරදි සඳහා නීතිය ක්‍රියාත්මක කිරීම සිදුකරන අතරම පරිසර ආරක්ෂණය සඳහා විවිධ වූ ව්‍යාපෘතීන් සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ඔස්සේ ශ්‍රී ලංකා පොලීසිය පරිසරය සුරැකීමේ වැදගත්කම මනාව අවබෝධ කරගෙන සිය කාර්යභාරය ඉටුකරනු ලබයි.

2018 වසරේ ද පෙර වසරවල මෙන්ම පරිසර ආරක්ෂණය සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර විශේෂයෙන්ම කලින්කලට මහජන ජීවිත සඳහා ප්‍රබල තර්ජනයක් එල්ල කරනු ලබන ඩෙංගු රෝගය පාලනය කිරීම සඳහා ද මුළු දිවයිනම ආවරණය වන පරිදි ඩෙංගු මර්දන සහ දැනුවත්කිරීම් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. 2018 වසරේ සමස්ථ පරිසර ආරක්ෂණ වැඩසටහන් සාරාංශගත කොට පහතින් දක්වා ඇත.

❖ **වෙරළ සංරක්ෂණ සහ ඇළමාර්ග පවිත්‍රතා වැඩසටහන්**

I. අන්තර් ජාතික වෙරළ පවිත්‍ර කිරීමේ දිනය සහ ජාත්‍යන්තර සමුද්‍ර සම්පත් සුරැකීමේ සතිය වෙනුවෙන් 2018.09.16 වන දින ගාල්ල දිස්ත්‍රික්කය කේන්ද්‍ර කරගනිමින් බඩල්ල වෙරළ තීරය පවිත්‍ර කිරීමේ වැඩසටහන
II. 2018.09.17 වන දින අම්පාර දිස්ත්‍රික්කය කේන්ද්‍ර කරගනිමින් කිරුක්කෝවිල් වෙරළ තීරය පවිත්‍ර කිරීමේ වැඩසටහන
III. 2018.09.18 වන දින අක්කරෙපත්තු වෙරළ පවිත්‍ර කිරීමේ වැඩසටහන
IV. 2018.09.21 වන දින කාර්තිවු වෙරළ තීරය පවිත්‍ර කිරීමේ වැඩසටහන
V. අන්තර් ජාතික වෙරළ පවිත්‍ර කිරීමේ දිනය සහ ජාත්‍යන්තර සමුද්‍ර සම්පත් සුරකීමේ සතිය වෙනුවෙන් 2018.09.21 වන දින වැල්ලවත්ත වෙරළ තීරය පවිත්‍ර කිරීමේ වැඩසටහන
VI. 2018.09.30 වන දින වත්තල වෙරළ තීරයේ සිට මීගමුව වෙරළ තීරය දක්වා පවිත්‍ර කිරීමේ වැඩසටහන
VII. 2018.10.06 වන දින බේස්ලයින් පාරේ සිට නාරාහේන්පිට කිරිමණ්ඩල මාවතේ පිහිටි ආර්ථික මධ්‍යස්ථානය දක්වා වූ ඇල මාර්ගය පිරිසිදු කිරීමේ වැඩසටහන
VIII. 2018.10.20 වන දින දෙහිවල ඇල පවිත්‍ර කිරීමේ වැඩසටහන

❖ **රුක්රෝපණ වැඩසටහන්**

2018.06.02 වන දින රුක්රෝපණ දිනයට සමගාමීව පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථාන පරිශ්‍රයේ රුක්රෝපණ වැඩසටහනක් පැවැත්වීම

❖ **කසළ වර්ගීකරණය පිළිබඳ ජනතාව දැනුවත් කිරීම**

I. 2018.06.02 වන දින කොම්පඤ්ඤවීදිය පොලිස් වසමේ කිව් මාර්ගයේ කසළ වර්ගීකරණය පිළිබඳ ජනතාව දැනුවත් කිරීම.
II. 2018.06.23 වන දින කොම්පඤ්ඤවීදිය පොලිස් වසමේ විතානගේ මාවතේ පිහිටා ඇති වතු නිවාස 572 ට ආසන්න සංඛ්‍යාවක් කසළ වර්ගීකරණය පිළිබඳව දැනුවත් කිරීම.
III. 2018.06.30 වන දින බොරැල්ල පොලිස් බල ප්‍රදේශයේ නිවාස 400 ක ජනතාව කසළ වර්ගීකරණය සම්බන්ධයෙන් දැනුවත් කිරීම.
IV. 2018.10.04 වන දින පොලිස් නිලධාරීන්, යුධ හමුදා නිලධාරීන්, මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් සහ මහජනතාවගේ සහභාගීත්වයෙන් පිරිසිදු නගරයක් බිහිකිරීම සම්බන්ධයෙන් කටුනායක ඇවරිවත්ත බස්නැවතුම් පරිශ්‍රයේ දී දැනුවත් කිරීම් සිදුකිරීම.

❖ **විශේෂ දැනුවත් කිරීමේ වැඩසටහන්**

I. 2018.06.17 වන දින මධ්‍යම පරිසර අධිකාරිය හා එක්ව පොළොන්නරුව පුලතිසිපුර විද්‍යාපීඨශ්‍රවණාගාරයේ දී පරිසර නීතිය පිළිබඳ පොලිස් නිලධාරීන් 300 ක් දැනුවත් කිරීම.

II. 2018.09.14 වන දින පරිසර ආරක්ෂණ කොට්ඨාසය, නාවික කොට්ඨාසය, පොලිස් ජීවිත රක්ෂක සංගමය සහ කොළඹ මහනගර සහා බල ප්‍රදේශයට අයත් පොලිස් ස්ථානවල නිලධාරීන් 200 ක පමණ පිරිසක් දැනුවත් කිරීම.

❖ **ඩෙංගු මර්දන වැඩසටහන්**

දිවයිනේ පළාත් මට්ටමින් විශේෂ ඩෙංගු මර්දන වැඩසටහන් රැසක් පවත්වා ඇති අතර පොලිස් කොට්ඨාස මට්ටමින් ජාතික මදුරු මර්දන සති ක්‍රියාත්මක කර ඇත. මේ යටතේ 2018 වසරේ නිවාස හා ආයතන විශාල ප්‍රමාණයක් පරීක්ෂා කොට දැනුවත්කිරීම් සහ නීතිමය ක්‍රියාමාර්ග ගැනීම් සිදුකර ඇත. පහත වගු අංක 37 මගින් සාරාංශගතව එම තොරතුරු දක්වා ඇත.

වගු අංක 38 2018 වසරේ ඩෙංගු මර්දන වැඩසටහන් වගුව

| ක්‍රියාත්මක කළ ප්‍රදේශය | කාලසීමාව | පොලිස් නිලධාරී සහභාගීත්වය | පරීක්ෂා කළ රාජ්‍ය/ පුද්ගලික ආයතන | පරීක්ෂා කළ නිවාස සංඛ්‍යාව | රතු නිවේදන නිකුත් කළ සංඛ්‍යාව | නඩු පැවරීම් | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | සෞඛ්‍ය අංශය මගින් | පොලිසිය මගින් |
| බස්නාහිර, උතුර, නැගෙනහිර, මධ්‍යම, සබරගමුව යන පළාත් ආවරණය වන පරිදි | 2018.01.01 2018.12.31 | 7543 | 30258 | 634899 | 24811 | 4730 | 790 |
| ප්‍රාදේශීය පොලිස් කොට්ඨාස 39 ක | 2018.04.03 2018.04.09 | 11601 | 28142 | 449967 | 20362 | 2933 | 400 |
| ප්‍රාදේශීය පොලිස් කොට්ඨාස 41 ක | 2018.09.26 2018.10.02 | 8482 | 25483 | 310757 | 19984 | 2132 | 476 |

මූලාශ්‍රය - පොලිස් පරිසර ආරක්ෂණ කොට්ඨාසය

# 14. මානව සම්පත් සංවර්ධනය

ශ්‍රී ලංකා පොලීසිය සතුව විශාල මානව සම්පතක් පවතී. එම මානව සම්පත දැනුම, කුසලතා හා ආකල්ප යන අංශවලින් සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා පොලීසිය විධිමත් වැඩපිළිවෙලක් ඔස්සේ කටයුතු කරනු ලැබේ. අභියෝගාත්මක සේවයක් ලෙස දැක්විය හැකි පොලිස් සේවය සඳහා ශාරීරික සහ මානසික යෝග්‍යතාවය බෙහෙවින් ඉවහල් වන බැවින් ඒ සියලු අංශවල සංවර්ධනය මූලික කරගත් මානව සම්පත් සංවර්ධන වැඩ පිළිවෙලක් ආයතනය තුළ ක්‍රියාත්මක කෙරේ. බඳවා ගැනීම්, උසස් කිරීම්, ස්ථානමාරු සහ පුහුණු කිරීම් ඔස්සේ පොලිස් කාර්ය මණ්ඩලය ඉතා ඵලදායි හා කාර්යක්ෂම ලෙස සේවයේ යෙදවීම මින් අපේක්ෂා කරනු ලැබේ. 2018 වසරේ ශ්‍රී ලංකා පොලීසියේ මානව සම්පත් සංවර්ධනය පහත පරිදි වේ.

## 14.1 ශ්‍රී ලංකා පොලීසියේ නිල ධූරාවලිය සහ කාර්ය මණ්ඩලය

ඉතා විධිමත් ලෙස සැකසුන නිල ධූරාවලියක් ශ්‍රී ලංකා පොලීසිය තුළ ක්‍රියාත්මක වේ. අනෙකුත් රාජ්‍ය ආයතන හා සසඳන කල ඉතා නිරවුල්ව සහ පැහැදිලිව හඳුනාගත හැකි ලෙස ඉහළම නිලයේ සිට පහළම නිලය දක්වා මෙම ධූරාවලිය සැකසී ඇත.

එමෙන්ම ශ්‍රී ලංකා පොලීසියේ විවිධ විශේෂඥ කාර්යයන් සඳහා බඳවා ගනු ලබන සහායක සේවයක් පවතින අතර විවිධ දීපව්‍යාප්ත සේවාවන්ට අයත් සහ දෙපාර්තුමේන්තු ගත සිවිල් කාර්ය මණ්ඩලයක් ද සේවයේ යෙදී සිටී. පහත වගු මගින් නිල ධූරාවලිය සහ කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු දක්වා ඇත.

❖ **නිල ධූරාවලිය**



## ❖ කාර්ය මණ්ඩලය (සාමාන්‍ය පොලිස් සේවය)

2018.12.31 දිනට ශ්‍රී ලංකා පොලීසියේ සාමාන්‍ය පොලිස් සේවයට අයත් කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

වගු අංක 39 **හට සංඛ්‍යා වගුව (සාමාන්‍ය පොලිස් සේවය)**

| නිලය | අනුමත නිලධරයන් සංඛ්‍යාව | අනුයුක්ත නිලධරයන් සංඛ්‍යාව | වැඩ බලන නිලධරයන් සංඛ්‍යාව | සේවය අතහැර ගොස් ඇති (පොදු නියෝග නොමැති නිලධරයන් සංඛ්‍යාව) | වැඩතහනම් නිලධරයන් සංඛ්‍යාව | සේවයේ යෙදී සිටින නිලධරයන් සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | පොරොත්තු ලේඛනගත කර ඇති උසස්වීම් සංඛ්‍යාව | සත්‍ය වශයෙන්ම ඇති පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|
| පොලිස්පති | **1** | **1** | | | | **1** | **0** | | 0 |
| ජ්‍යෙ.නි.පො.ප | 12 | 12 | | | 1 | 11 | 0 | | 0 |
| නි.පො.ප | 46 | 32 | 5 | | 1 | 31 | 14 | | 14 |
| ජ්‍යෙ.පො.අ | 169 | 37 | | 1 | 1 | 35 | 132 | 1 | 131 |
| කා.ජ්‍යෙ.පො.අ | 1 | 0 | | | | 0 | 1 | | 1 |
| පො.අ | 162 | 136 | | | 2 | 134 | 26 | 2 | 24 |
| කා.පො.අ | 20 | 9 | | | | 9 | 10 | | 10 |
| කා.ස.පො.අ | | 1 | | | | 1 | | | |
| ස.පො.අ | 314 | 253 | | | 1 | 252 | 61 | 18 | 43 |
| ප්‍ර.පො.ප | 780 | 586 | | 5 | 9 | 572 | 194 | 6 | 188 |
| කා.ප්‍ර.පො.ප | 66 | 15 | | | | 15 | 51 | | 51 |
| පො.ප | 2699 | 2414 | | 14 | 19 | 2381 | 285 | 35 | 250 |
| කා.පො.ප | 266 | 228 | | 2 | | 226 | 38 | | 38 |
| උ.පො.ප | 5312 | 4906 | | 28 | 33 | 4845 | 406 | 50 | 356 |
| කා.උ.පො.ප | 642 | 589 | | 4 | | 585 | 53 | 1 | 52 |
| උ.පො.ප (ප්‍රවාහන) | 125 | 125 | | | | 125 | 0 | | 0 |
| ම.සැ | 100 | 1 | | | 1 | 0 | 99 | | 99 |
| ම.සැ.රි | 50 | 2 | | | | 2 | 48 | | 48 |
| පො.සැ | 15315 | 14810 | | 119 | 150 | 14541 | 505 | 123 | 382 |
| කා.පො.සැ | 1800 | 1715 | | 5 | 2 | 1708 | 85 | 2 | 83 |
| පො.කො | 45055 | 41360 | | 2321 | 638 | 38401 | 3695 | | 3695 |
| කා.පො.කො | 8468 | 6275 | | 301 | 6 | 5968 | 2193 | | 2193 |
| පො.සැ.රි | 700 | 654 | | 1 | 4 | 649 | 46 | 15 | 31 |
| පො.කො.රි | 3500 | 2876 | | 105 | 16 | 2755 | 624 | | 624 |
| **එකතුව** | **85603** | **77037** | **5** | **2906** | **884** | **73247** | **8566** | **253** | **8313** |

මූලාශ්‍රය - මානව සම්පත් කළමනාකරණ කොට්ඨාසය

## ❖ කාර්ය මණ්ඩලය (පොලිස් සහායක සේවා)

2018.12.31 දිනට ශ්‍රී ලංකා පොලිසියේ සහායක සේවයට අයත් කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

වගු අංක **40** **භට සංඛ්‍යා වගුව (පොලිස් සහායක සේවය)**

<table>
<tr><th>නිලය</th><th>අනුමත නිලධරයන් සංඛ්‍යාව</th><th>අනුයුක්ත නිලධරයන් සංඛ්‍යාව</th><th>පුරප්පාඩු සංඛ්‍යාව</th></tr>
<tr><td>නි.පො.ප</td><td>2</td><td></td><td>2</td></tr>
<tr><td>ජ්‍යෙ.පො.අ</td><td rowspan="3">95</td><td></td><td rowspan="3">88</td></tr>
<tr><td>පො.අ</td><td>1</td></tr>
<tr><td>ස.පො.අ</td><td>6</td></tr>
<tr><td>ප්‍ර.පො.ප</td><td rowspan="3">422</td><td>4</td><td rowspan="3">316</td></tr>
<tr><td>පො.ප</td><td>25</td></tr>
<tr><td>උ.පො.ප</td><td>77</td></tr>
<tr><td>කා.ප්‍ර.පො.ප</td><td rowspan="3">102</td><td>0</td><td rowspan="3">53</td></tr>
<tr><td>කා.පො.ප</td><td>17</td></tr>
<tr><td>කා.උ.පො.ප</td><td>32</td></tr>
<tr><td>පො.සැ</td><td rowspan="2">6748</td><td>166</td><td rowspan="2">5818</td></tr>
<tr><td>පො.කො</td><td>764</td></tr>
<tr><td>කා.පො.සැ</td><td rowspan="2">246</td><td>37</td><td rowspan="2">60</td></tr>
<tr><td>කා.පො.ප</td><td>149</td></tr>
<tr><td>එකතුව</td><td>7615</td><td>1278</td><td>6337</td></tr>
</table>

මූලාශ්‍රය - මානව සම්පත් කළමනාකරණ කොට්ඨාසය

❖ **කාර්ය මණ්ඩලය (පොලිස් විශේෂ කාර්ය බලකාය)**

2018.12.31 දිනට ශ්‍රී ලංකා පොලීසියේ විශේෂ කාර්ය බලකායට අයත් කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

වගු අංක 41

**හට සංඛ්‍යා වගුව (පොලිස් විශේෂ කාර්ය බලකාය)**

| නිලය | අනුමත නිලධරයන් සංඛ්‍යාව | අනුයුක්ත නිලධරයන් සංඛ්‍යාව | සේවය අතහැර ගොස් ඇති (පොදු නියෝග නොමැති නිලධරයන් සංඛ්‍යාව) | බැඳිතබාගත් නිලධරයන් සංඛ්‍යාව | සේවයේ යෙදී සිටින නිලධරයන් සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | පොරොත්තු ලේඛනගත කර ඇති උසස්වීම් සංඛ්‍යාව | සත්‍ය වශයෙන්ම ඇති පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| ජ්‍යෝ.නි.පො.ප/නි.පො.ප | 1 | 1 | | | 0 | 1 | | 1 |
| ජ්‍යෝ.පො.අ | 8 | 1 | | | 1 | 3 | | 3 |
| පො.අ | 14 | 18 | | | 18 | | | |
| ස.පො.අ | 44 | 24 | | | 24 | 20 | | 20 |
| කා.ස.පො.අ | 1 | 0 | | | 0 | 1 | | 1 |
| ප්‍ර.පො.ප | 67 | 64 | | | 64 | 3 | | 3 |
| කා.ප්‍ර.පො.ප | 2 | 2 | | | 2 | 0 | | 0 |
| පො.ප | 270 | 225 | | 2 | 223 | 45 | | 45 |
| කා.පො.ප | 7 | 6 | | | 6 | 1 | | 1 |
| උ.පො.ප | 812 | 730 | 22 | 7 | 701 | 82 | | 82 |
| කා.උ.පො.ප | 13 | 9 | | | 9 | 4 | | 4 |
| උ.පො.ප (ප්‍රවාහන) | 4 | 2 | | | 2 | 2 | | 2 |
| ම.සැ | 37 | 1 | | | 1 | 36 | | 36 |
| ම.සැ.රි | 8 | 0 | | | 0 | 8 | | 8 |
| පො.සැ | 1625 | 1453 | 6 | 5 | 1442 | 172 | 8 | 164 |
| කා.පො.සැ | 27 | 26 | | | 26 | 1 | 1 | 0 |
| පො.කො | 6999 | 5444 | 453 | 60 | 4931 | 1555 | | 1555 |
| කා.පො.කො | 163 | 161 | 14 | | 147 | 2 | | 2 |
| පො.සැ.රි | 64 | 49 | | | 49 | 15 | | 15 |
| පො.කො.රි | 577 | 583 | 76 | 5 | 502 | -6 | | -6 |
| **එකතුව** | ***10743*** | ***8799*** | ***571*** | ***79*** | ***8148*** | ***1945*** | ***9*** | ***1936*** |

මූලාශ්‍රය - මානව සම්පත් කළමනාකරණ කොට්ඨාසය

2018.12.31 දිනට ශ්‍රී ලංකා පොලිස් සේවයේ දෙපාර්තමේන්තුගත සිවිල් කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

වගු අංක 42 **දෙපාර්තුමේන්තුගත නිලධාරීන් සම්බන්ධ වගුව**

| | තනතුර | අනුමත | තථ්‍ය | පුරප්පාඩු |
|---|---|---|---|---|
| 1 | අපරාධ විද්‍යාඥ | 1 | 1 | 0 |
| 2 | පර්යේෂණ නිලධාරි | 1 | 1 | 0 |
| 3 | සංවර්ධන සහකාර නිලධාරී | 117 | 104 | 13 |
| 4 | සිවිල් සහායක | 306 | 276 | 30 |
| 5 | ස්ථාන කම්කරු | 503 | 454 | 49 |
| 6 | අස්ගොව් | 55 | 47 | 8 |
| 7 | අලි බලන්නා | 2 | 0 | 2 |
| 8 | උපස්ථායක/ උපස්ථායිකා | 183 | 103 | 80 |
| 9 | අරක්කැමි/ භෝජනාගාර සේවක | 34 | 32 | 2 |
| 10 | අනියම් / තාවකාලික කම්කරු | 93 | 93 | |
| **එකතුව** | | **1295** | **1111** | **184** |

මූලාශ්‍රය -පොලිස් මූලස්ථාන සිවිල් පරිපාලන අංශය

❖ **කාර්ය මණ්ඩලය (විවිධ සේවාවන්ට අයත් සිවිල්)**

2018.12.31 දිනට ශ්‍රී ලංකා පොලීසියේ (දෙපාර්තුමේන්තු ගත නොවන) විවිධ සේවාවන්ට අයත් කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

වගු අංක 43 **සිවිල් කාර්යය මණ්ඩලය සම්බන්ධ වගුව**

| අනු අංකය | තනතුර සහ සේවය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | ශ්‍රී ලංකා පරිපාලන සේවය I - අධ්‍යක්ෂ (සිවිල් පරිපාලන) | 1 | 1 | 0 |
| 2 | ශ්‍රී ලංකා පරිපාලන සේවය III - සහකාර අධ්‍යක්ෂ (සිවිල් පරිපාලන) | 1 | 0 | 1 |
| 3 | ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය I - ප්‍රධාන ගණකාධිකාරි | 4 | 4 | 0 |
| 4 | ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය I - ප්‍රධාන අභ්‍යන්තර විගණක | 1 | 1 | 0 |
| 5 | ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය III - සහකාර අධ්‍යක්ෂ | 1 | 0 | 1 |
| 6 | ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය III - ගණකාධිකාරි | 56 | 32 | 24 |
| 7 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය - ඉංජිනේරු | 1 | 1 | 0 |
| 8 | ශ්‍රී ලංකා වෛද්‍ය සේවය - වෛද්‍ය නිලධාරී | 2 | 1 | 1 |
| 9 | රාජ්‍ය කළමනාකරණ සහකාර අධිශ්‍රේණිය - පරිපාලන නිලධාරී | 11 | 2 | 9 |
| 10 | භාෂා පරිවර්තක සේවය - භාෂා පරිවර්තක | 6 | 5 | 1 |
| 11 | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය I/II/III - රා.ක.ස. | 1639 | 1626 | 13 |
| 12 | කාර්යාල සේවක සේවය I/II/III - කා.සේ.සේ. | 1706 | 1274 | 432 |
| **එකතුව** | | **3429** | **2947** | **482** |

මූලාශ්‍රය -පොලිස් මූලස්ථාන සිවිල් පරිපාලන අංශය

### 14.2 බඳවා ගැනීම්

2018 වසරේ ශ්‍රී ලංකා පොලීසියේ සාමාන්‍ය පොලිස් සේවය සහ විශේෂ කාර්ය බලකාය සඳහා කරන ලද බඳවා ගැනීම් නිලයන් අනුව පහත වගුව මගින් දක්වා ඇත.

වගු අංක 44 **2018 වසරේ බඳවා ගැනීම් සම්බන්ධ වගුව**

| තනතුරු | සාමාන්‍ය | | | | වි.ක.බ. | | | | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | සි. | දෙ. | මු. | එකතුව | සි. | දෙ. | මු. | එකතුව | |
| උ.පො.ප | 51 | 0 | 0 | 51 | 0 | 0 | 0 | 0 | 51 |
| කා.උ.පො.ප | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| පො.කො | 858 | 123 | 32 | 1013 | 468 | 0 | 3 | 471 | 1484 |
| කා.පො.කො | 561 | 31 | 0 | 592 | 41 | 0 | 0 | 41 | 633 |
| පො.කො.රි | 94 | 9 | 2 | 105 | 40 | 0 | 0 | 40 | 145 |
| **එකතුව** | **1564** | **163** | **34** | **1761** | **549** | **0** | **3** | 552 | 2313 |

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යා ලේඛන ඒකකය

❖ **දත්ත විශ්ලේෂණය**

වගුවට අනුව 2018 වසරේ සාමාන්‍ය පොලිස් සේවය සඳහා පොලිස් නිලධරයන් 1761 ක් බඳවාගෙන ඇති අතර එයින් නිලධරයන් 197 දෙනෙකු එනම් 11% ක් ජාතීන් අනුව එනම් දමිල සහ මුස්ලිම් ප්‍රජාව නියෝජනය වන පරිදි බඳවාගෙන ඇත.

විශේෂකාර්ය බලකාය සඳහා කරන ලද බඳවාගැනීම් සළකා බැලීමේ දී වගුවට අනුව 2018 වසරේ නිලධරයන් 552 ක් බඳවාගෙන ඇත. ඒ අනුව ශ්‍රී ලංකා පොලීසියට 2018 වසරේ බඳවාගෙන ඇති නිලධරයන් ගණන 2313 කි.

### 14.3 පුහුණු කිරීම්

නිලධරයන්ට න්‍යායාත්මක සහ ප්‍රායෝගික පුහුණුවක් ලබාදීම සඳහා ශ්‍රී ලංකා පොලීසිය සතුව විධිමත් පුහුණු මධ්‍යස්ථාන රැසක් පවතින අතර 2018 වසරේ එම පුහුණු ආයතන තුළ විවිධ පාඨමාලා මගින් නිලධාරීන් විශාල ප්‍රමාණයක් සඳහා පුහුණුවීම් සිදුකර ඇත. එමෙන්ම විවිධ බාහිර රාජ්‍ය ආයතනවල නිලධාරීන් සඳහා ද එම ආයතනවල ඉල්ලීම පරිදි විවිධ න්‍යායික හා ප්‍රායෝගික පුහුණු පාඨමාලා පවත්වා ඇති අතර පහත වගු මගින් එම පුහුණු පාඨමාලා පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර ඇත.

❖ **කළුතර පොලිස් විද්‍යාලය සහ අනුබද්ධ ඒකක මගින් පවත්වන ලද පාඨමාලා**

වගු අංක 45 **පොලිස් විද්‍යාල මගින් පවත්වන ලද පාඨමාලා දැක්වෙන වගුව**

| අනු අංකය | පාඨමාලාවේ නම | සංඛ්‍යාව | **සහභාගිත්ව නිලයන්** | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ජ්‍යෙනිපොප | නිපොප | ජ්‍යෙපොඅ | පොඅ/සහාපොඅ | සපොඅ/සහාසපොඅ | ප්‍රපොප/සහාප්‍රපොප | පොප/සහාපොප | උපපොප/සහාඋපපොප | පොසැ/සහාපොසැ | පොකොං/සහාපොකොං | පොකොංරි | ප්‍රජා සංවර්ධක |
| **1** | ද්‍රවිඩ භාෂා පුහුණු පාඨමාලාව | 2 | | | | | | 2 | 3 | 5 | 41 | 548 | | 10 |
| **2** | මූලික පුහුණු පාඨමාලාව | 8 | | | | | | | | 28 | | 1599 | 145 | |
| **3** | වි.ක.හ. මූලික පුහුණු පාඨමාලාව | 5 | | | | | | | | 49 | | 721 | | |
| **4** | ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමා පාඨමාලාව | 4 | | | | | | 6 | 19 | 244 | 47 | 338 | 1 | 13 |
| **5** | ධාරිතා සංවර්ධනය | 4 | | | | | | | 3 | 10 | 28 | 195 | | |
| **6** | තනතුරට හැඩගැන්වීමේ පුහුණු පාඨමාලාව | 7 | | | | | | 42 | 42 | 213 | 45 | | | |
| **7** | මූලික පරිගණක පුහුණු පාඨමාලාව | 9 | | | | | | | | | | 408 | | |
| **8** | වන සටන් පුහුණු පාඨමාලාව | 1 | | | | | | | | 27 | | 362 | | |
| **9** | පුහුණු කරන්නන් පුහුණුකිරීමේ පාඨමාලාව | | | | | | | | 7 | 18 | 23 | 26 | | |
| **10** | සාම සාධක හමුදා පෙර පුහුණුව | 1 | | | | | | 1 | 3 | 12 | 14 | 20 | | |
| **11** | මහජන සාමය හා කළමනාකරණ | 11 | | | | | | | | | 64 | 275 | | |
| **12** | මත්ද්‍රව්‍ය සහ මත්ද්‍රව්‍ය අපරාධ සම්බන්ධ පරිගණක මොඩියුල ආශ්‍රිත පාඨමාලා | 3 | | | | | | | | | 8 | 53 | | |
| **13** | ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය සහ සංනිවේදනය පාඨමාලාව i | | | | | | | | 1 | 5 | 8 | 25 | | |
| **14** | මතින් නිදහස් රටක් සම්බන්ධ පාඨමාලාව | 1 | | | | | | | 10 | 11 | 3 | 5 | | |
| | **එකතුව** | **56** | **0** | **0** | **0** | **0** | **0** | **51** | **88** | **622** | **281** | **4575** | **146** | **23** |
| | **බාහිර ආයතනවල නිලධාරීන් සඳහා පවත්වන ලද පුහුණු පාඨමාලා** | | | | | | | | | | | | | |
| **1** | ආගමන විගමන දෙපාර්තුමේන්තු නිලධාරීන් සඳහා පවත්වන ලද සේවාරම්භක පුහුණු පාඨමාලාව | 1 | ආගමන විගමන දෙපාර්තුමේන්තු නිලධාරීන් | | | | | | | | | | | |
| **2** | උසාවි කාර්යය පටිපාටිය පිළිබඳ පාඨමාලාව | 2 | දකුණු පළාත් සමුපකාර සංවර්ධන නිලධාරීන් 25, බස්නාහිර පළාත් සමාජ සේවා නිලධාරීන් 80 | | | | | | | | | | | |
| **3** | නායකත්ව හා ඵලදායිතා වැඩමුළුව | 4 | කළුතර දිස්ත්‍රික් තැපැල් දෙපාර්තමේන්තු නිලධාරීන් 282, පාසල් ගුරුවරු 80 | | | | | | | | | | | |
| | **එකතුව** | **7** | | | | | | | | | | | | |

මූලාශ්‍රය - ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලය




ජාත්‍යන්තර පොලීසිය මගින් සංවිධානය කරන ලද පුහුණු අවස්ථාවක්

❖ **පොලිස් විද්‍යාපීඨය සහ සේවාස්ථ පුහුණු ආයතන මගින් පවත්වන ලද පාඨමාලා**

වගු අංක 46 **පොලිස් විද්‍යාපීඨය සහ සේවාස්ථ පුහුණු ආයතන පාඨමාලා වගුව**

| අනු අංකය | පාඨමාලා පැවැත් වූ අංශය | පාඨමාලා ප්‍රමාණය | සහභාගී වූ නිලධාරීන් ප්‍රමාණය |
|---|---|---|---|
| **1** | දෙමළ භාෂා පුහුණු පාසල් සහ සේවස්ථ පුහුණු ඒකක | 803 | 28942 |
| **2** | අපරාධ විද්‍යා අධ්‍යයන අංශ | 6 | 194 |
| **3** | නීතිය බලගැන්වීමේ හා පොලිස් අධ්‍යයන අංශය | 23 | 815 |
| **4** | නායකත්ව හා කළමනාකරණ අංශය | 4 | 160 |
| **එකතුව** | | **836** | **30111** |

මූලාශ්‍රය - පොලිස් සේවස්ථ පුහුණු කොට්ඨාසය

## 14.4 උසස් කිරීම්, පත්කිරීම් හා ස්ථානමාරු

2018 වසරේ ශ්‍රී ලංකා පොලීසිය තුළ ක්‍රියාත්මක කරන ලද උසස්කිරීම්, පත්කිරීම් සහ ස්ථානමාරු කිරීම් සියලුම නිලයන්ට අදාළව පහත වගු අංක 47 සහ 48 මගින් දක්වා ඇත.

- **උසස් කිරීම්**

සෑම වසරක් පාසාම ශ්‍රී ලංකා පොලීසියේ නිලධරයන් සඳහා උසස්වීම් ක්‍රියාත්මක කරනු ලබන අතර 2018 වසරේද සියලුම නිලයන් සඳහා මෙම උසස්වීම් ක්‍රියාත්මක කර ඇත. වගුවෙහි දත්තවලට අනුව නිලධාරීන් 3282 ක් සහ නිලධාරිනියන් 467 ක් ලෙස නිලධරයන් 3749 දෙනෙකු සඳහා උසස්වීම් ක්‍රියාත්මක කර ඇත. පහත වගු අංක 47 මගින් 2018 වසර තුළ ක්‍රියාත්මක කළ සියලුම උසස්වීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර ඇත.

වගු අංක 47 **2018 වසරේ උසස් කිරීම් නිලයන් අනුව දැක්වෙන වගුව**

| අනු අංකය | නිලය | නිලධාරී සංඛ්‍යාව | නිලධාරිනියන් සංඛ්‍යාව | එකතුව |
|---|---|---|---|---|
| 1 | ජ්‍යෙ.නි.පො.ප | 1 | 0 | 1 |
| 2 | නි.පො.ප | 1 | 0 | 1 |
| 3 | ජ්‍යෙ.පො.අ | 1 | 0 | 1 |
| 4 | පො.අ | 54 | 0 | 54 |
| 5 | ස.පො.අ | 102 | 0 | 102 |
| 6 | ප්‍ර.පො.ප | 37 | 0 | 37 |
| 7 | පො.ප | 557 | 56 | 613 |
| 8 | උ.පො.ප | 576 | 77 | 653 |
| 9 | උ.පො.ප (ප්‍රවාහන) | 21 | 0 | 21 |
| 10 | පො.සැ | 1803 | 334 | 2137 |
| 11 | පො.සැ.රි | 129 | 0 | 129 |
| **එකතුව** | | **3282** | **467** | **3749** |

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යා ලේඛන ඒකකය

- **පත්කිරීම්**

මෙහිදී නව තනතුරුවලට පත්කිරීම, සමාන තනතුරක සිට වෙනත් සමාන තනතුරකට පත්කිරීම හෝ වැඩබලන තනතුරකට පත්කිරීම සිදුකර ඇත. 2018 වසරේ මෙබඳු පත්කිරීම් 188 ක් සිදුකර ඇති අතර ඒ පිළිබඳ දත්ත පහත 48 වගුව මගින් දක්වා ඇත.

වගු අංක 48 2018 වසරේ තනතුරු සඳහා පත්කිරීම් වගුව

| අනු අංකය | විස්තරය | පත්කළ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | ස්ථානාධිපති තනතුරට පත්කිරීම් | 76 |
| 2 | ස්ථානාධිපති තනතුරක සිට ස්ථානාධිපති තනතුරට පත්කිරීම් | 90 |
| 3 | වැඩබලන ස්ථානාධිපති තනතුරට පත්කිරීම | 22 |
| **එකතුව** | | **188** |

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යා ලේඛන ඒකකය

- **ස්ථානමාරු කිරීම්**

විවිධ වූ සේවා අවශ්‍යතාවයන් මත ශ්‍රී ලංකා පොලීසියේ නිලධරයන් සඳහා 2018 වසරේ ස්ථානමාරු කිරීම් ක්‍රියාත්මක කොට ඇති අතර එසේ ස්ථානමාරු කරන ලද නිලධරයන් සංඛ්‍යාව 10042 කි. පහත වගුව මගින් එම ස්ථානමාරු පිළිබඳ දත්ත ඉදිරිපත් කර ඇත.

වගු අංක 49 **2018 වර්ෂයේ ස්ථානමාරු කිරීම් වගුව**

| අනු අංකය | නිලය | නිලධාරීන් සංඛ්‍යාව | නිලධාරිනියන් සංඛ්‍යාව | එකතුව |
|---|---|---|---|---|
| 1 | ජ්‍යෙ.නි.පො.ප | 5 | - | **5** |
| 2 | නි.පො.ප | 17 | - | **17** |
| 3 | ජ්‍යෙ.පො.අ | 11 | - | **11** |
| 4 | පො.අ | 34 | - | **34** |
| 5 | කා.පො.අ | - | - | - |
| 6 | ස.පො.අ | 71 | - | **71** |
| 7 | කා.ස.පො.අ | - | - | - |
| 8 | ප්‍ර.පො.ප | 22 | 33 | **55** |
| 9 | පො.ප/ කා.පො.ප | 268 | 74 | **342** |
| 10 | උ.පො.ප/ කා.උ.පො.ප | 563 | 103 | **666** |
| 11 | උ.පො.ප (ප්‍රවාහන) | - | - | - |
| 12 | පො.සැ/කා.පො.සැ | 2233 | 448 | **2681** |
| 13 | පො.කො/කා.පො.කො | 5287 | 845 | **6132** |
| 14 | පො.සැ.රි | 41 | - | **41** |
| 15 | පො.කො.රි | 125 | - | **125** |
| **එකතුව** | | **8677** | **1503** | **10180** |

මූලාශ්‍රය - පොලිස් සංඛ්‍යා ලේඛන ඒකකය

## 14.5 දෙස් විදෙස් ක්‍රීඩා සහභාගීත්වය

විවිධ ක්‍රීඩා ඉසව් ඔස්සේ ජාතික මෙන්ම ජාත්‍යන්තර වශයෙන් දක්‍ෂතා දැක් වූ පොලිස් ක්‍රීඩක ක්‍රීඩිකාවන් රාශියක් ශ්‍රී ලංකා පොලීසිය තුළ සේවයේ යෙදී සිටී. මේ දක්වා ඔවුන් දෙස් විදෙස් ජයග්‍රහණ රැසක් සමඟින් ශ්‍රී ලංකා පොලීසියට මෙන්ම රටට විශාල කීර්තියක් අත්කර දී ඇත. 2018 වසරේ පොලිස් ක්‍රීඩක ක්‍රීඩිකාවන් විසින් විවිධ ක්‍රීඩා ඉසව් ඔස්සේ දැක්වූ ජාත්‍යන්තර දක්‍ෂතා පහත වගු අංක 48 මගින් විදහා දැක්වේ.දේශීය වශයෙන් අත්කරගත් ජයග්‍රහණ පිළිබඳ තොරතුරු ඇමුණුම 03 මගින් දක්වා ඇත

වගු අංක 50 **2018 වසරේ ජාත්‍යන්තර තරඟ සහභාගීත්වය හා ජයග්‍රහණ වගුව**

| අනු අංකය | තරඟ ඉසව්ව | තරඟකරුවන් සංඛ්‍යාව | ලබාගත් ජයග්‍රහණ | පවත්වන ලද රට |
|---|---|---|---|---|
| 1 | 2018 ආසියානු කුසලාන දුනු විදීමේ තරඟාවලිය | පො.සැ.01 | සහභාගීත්වය | තායිලන්තය |
| 2 | 2018 ආසියානු කුසලාන දුනු විදීමේ තරඟාවලිය | පො.ප. 01, පො.කො.01 | ලෝකඩ පදක්කම් 02යි. | බංග්ලාදේශය |
| 3 | 2018 ලෝක කුසලාන දුනු විදීමේ තරඟාවලිය අදියර 01. | පො.ප. 01 | සහභාගීත්වය | චීනය |
| 4 | 2018 ලෝක කුසලාන දුනු විදීමේ තරඟාවලිය අදියර 02. | පො.ප. 01 | සහභාගීත්වය | තුර්කිය |
| 5 | දකුණු ආසියාතික ජූඩෝ තරඟාවලිය | කා.පො.කො.02යි. | ලෝකඩ පදක්කම් 02යි. | නේපාලය |
| 6 | උතුරු බැංකොක් ජූඩෝ තරඟාවලිය | කා.පො.කො.01යි. | සහභාගීත්වය | තායිලන්තය |
| 7 | පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල | පො.සැ.01, කා.පො.කො.01 | ලෝකඩ පදක්කම් 01යි. | ඉන්දියාව |
| 8 | ලෝක ශූරතා කරාතේ තරඟාවලිය | පො.කො.01 | සහභාගීත්වය | ස්පාඤ්ඤය |

| | | | | |
|---|---|---|---|---|
| 9 | ආසියානු කරාතේ ශූරතාවලිය | පො.කො.01 | සහභාගීත්වය | ජෝර්දාන් |
| 10 | 2018 දෙවන දකුණු ආසියාතික සෙපැක්ටැක්රෝ තරඟාවලිය | කා.පො.කො.05යි. | සහභාගීත්වය | නේපාලය |
| 11 | IMMSU ලෝක ශූරතා වෙඩිතැබීමේ තරඟාවලිය | කා.පො.ප.01 | කාන්තා 05 වන ස්ථානය | පින්ලන්තය |
| 12 | යගුලිය විසිකිරීම ලෝක ප්‍රවීණයන්ගේ මළල ක්‍රීඩා තරඟාවලිය | කා.පො.කො.01යි. | තුන්වන ස්ථානය | ස්පාඤ්ඤය |
| 13 | IMMSU13TH METALLIC SILHOUETTE WORLD CHAMPION SHIP 2018 | ප්‍ර.පො.ප. 01, කා.උ.පො.ප 01 | රන් පදක්කම් 02යි. | පින්ලන්තය |

මූලාශ්‍රය - පොලිස් ක්‍රීඩා කොට්ඨාසය

## 14.6 පොලිස් වෛද්‍ය සේවාව

ශ්‍රී ලංකා පොලීසියේ නිලධාරීන් සඳහා ඉතා ඉහළ වෛද්‍ය පහසුකම්වලින් සමන්විත පොලිස් රෝහල් පද්ධතියක් ක්‍රියාත්මක වන අතර එමගින් පොලිස් නිලධාරීන් මෙන්ම ඔවුන්ගේ පවුල්වල ඉතා විශාල පිරිසකට සෙත සැලසේ.

පසුගිය වසර තුනක එනම් 2016, 2017 සහ 2018 යන වසර තුන තුළ ශ්‍රී ලංකා පොලිස් රෝහලින් ප්‍රතිකාර ලබාගත් රෝගීන් පිළිබඳ තොරතුරු වගු අංක 49 මගින් දක්වා ඇත.

වගු අංක 51 **2016 – 2018 දක්වා පොලිස් රෝල මගින් ප්‍රතිකාර ලබාගැනීම සම්බන්ධ වගුව**

| අනු අංකය | රෝගය | 2016 වසරේ රෝගීන් ප්‍රමාණය | 2017 වසරේ රෝගීන් ප්‍රමාණය | 2018 වසරේ රෝගීන් ප්‍රමාණය |
|---|---|---|---|---|
| 1 | දියවැඩියාව සහ රුධිර පීඩනය | 34123 | 35076 | 37024 |
| 2 | හෘද රෝග | 4515 | 5087 | 5924 |
| 3 | වෙනත් රෝග | 25708 | 24147 | 28046 |
| **එකතුව** | | **64346** | **64310** | **70994** |

මූලාශ්‍රය - පොලිස් වෛද්‍ය සේවා කොට්ඨාසය

ප්‍රතිකාර ගනුලබන රෝගීන් වෙත ඖෂධ සහ රෝහල් පහසුකම් සැලසීම සඳහා වාර්ෂිකව විශාල මුදලක් පොලිස් රෝහල මගින් වැයකරනු ලබන අතර වගු අංක 50 මගින් එම මූල්‍ය තොරතුරු දක්වා ඇත.

වගු අංක 52 **2016 -2018 දක්වා ඖෂධ හා රෝහල් පහසුකම් සඳහා වැයකිරීම් දැක්වෙන වගුව**

| 2:01 ඖෂධ හා රෝහල් පහසුකම් සඳහා | 2016 | 2017 | 2018 |
|---|---|---|---|
| 225-1-1-0-1204 වෛද්‍ය සැපයුම් | 549,499,797.43 | 499,900,232.51 | 781,455,245.50 |
| 225-1-1-0-2013 යන්ත්‍රෝපකරණ | 11,069,601.07 | 15,922,993.33 | 22,437,447.24 |
| **එකතුව** | 560,569,398.50 | 515,823,225.84 | 803,892,692.74 |

මූලාශ්‍රය - පොලිස් වෛද්‍ය සේවා කොට්ඨාසය

❖ දත්ත විශ්ලේෂණය

වගු අංක 50 ට අනුව පසුගිය වසර තුනක පොලිස් රෝහලින් ප්‍රතිකාර ලබාගත් රෝගීන් සංඛ්‍යාව වසරක් පාසා ඉහළ ගොස් ඇති ආකාරය හඳුනාගත හැකිය.

වැඩිම රෝගීන් ප්‍රමාණයක් ප්‍රතිකාර ලබාගෙන ඇති දියවැඩියාව සහ රුධිර පීඩනය යන රෝග ගත්විට 2016 වසරේ රෝගීන් 34123 දෙනෙකු ප්‍රතිකාර ලබාගෙන ඇති අතර 2017 වසරේ එම ප්‍රමාණය 35076 දක්වා 3% කින් ඉහළ ගොස් ඇත. එමෙන්ම 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ එම ප්‍රමාණය 5% කින් තවදුරටත් ඉහළගොස් ඇත.

හෘද රෝගීන් 4515 ක් 2016 වසරේ ප්‍රතිකාර ලබාගෙන ඇති අතර එම සංඛ්‍යාව 5087 දක්වා 13% කින් 2017 වසරේ ඉහළ ගොස් ඇත. 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ හෘදරෝග සඳහා ප්‍රතිකාර ගැනීම් 5924 දක්වා 16% කින් තවදුරටත් ඉහළ ගොස් ඇත.

වෙනත් රෝග සඳහා ප්‍රතිකාර ගැනීම් 25708 ක් 2016 වසරේ සිදුව ඇති අතර එය 2017 වසරේ 24147 දක්වා 6% කින් අඩු වුවද 2018 වසරේ එම ප්‍රමාණය 28046 දක්වා 16% කින් නැවත ඉහළ ගොස් ඇත.

සියළුම රෝග සඳහා ප්‍රතිකාර ලබාගත් සමස්ථ රෝගීන් ප්‍රමාණය ගත්විට 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ 10% කින් ඉහළ ගොස් ඇත.

වගු අංක 50ට අනුව වෛද්‍ය සේවා ගාස්තු ද 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ 56% කින් ඉහළ ගොස් ඇත.

## 14.7 විවිධ හේතූන් මත සිදුවන පොලිස් නිලධාරී මරණ

වර්ථමානය වන විට පොලිස් නිලධාරියා ඉතා කාර්යබහුල රාජකාරියක් ඉටුකරමින් සිටී. පැය 24 පුරාම රාජකාරියේ යෙදී සිටින්නෙකු ලෙස සැලකෙන පොලිස් නිලධාරියාගේ වෘත්තීය ස්වභාවය අනුව ඔහුගේ පෞද්ගලික ජීවිතය සීමා සහිත වන අතර ඔහුගේ රාජකාරි ස්වභාවය අනුව මානසික ආතතියට ලක්වීමේ වැඩි ඉඩක් පවතී. එමෙන්ම බෝ නොවන රෝගවලට භාජනය වීමේ අවස්ථාද ඉහළ මට්ටමක පවතින බව නිරීක්ෂණය වේ.

වාර්ෂිකව සිදුවන පොලිස් නිලධාරීන්ගේ මරණ පිළිබඳව සලකා බැලීමේ දී මේ සම්බන්ධයෙන් යම් අවධානයක් යොමු කිරීමේ අවශ්‍යතාවය පැන නැගී ඇත. පසුගිය වසර තුන තුළ එනම් 2016, 2017 සහ 2018 යන වසරවල පොලිස් නිලධාරීන්ගේ මරණ පිළිබඳ පහත වගු අංක 51 මගින් දක්වා ඇති සාරාංශගත තොරතුරු පිළිබඳ අවධානය යොමුකිරීම තුළින් මේ සම්බන්ධ නිගමනවලට එළඹීමේ ඉඩකඩ පවතී.

වගු අංක 53 **2016 – 2018 දක්වා පොලිස් නිලධාරී මරණ දැක්වෙන වගුව**

| අනු අංකය | මියයාමට හේතුව | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|
| 1 | විවිධ අසනීප | 101 | 88 | 43 |
| 2 | රිය අනතුරු | 41 | 38 | 54 |
| 3 | හෘදයාබාධ | 15 | 25 | 44 |
| 4 | පිළිකා | 9 | 14 | 16 |
| 5 | වකුගඩු ආබාධ | | 11 | 9 |
| 9 | දුම්රිය අනතුරු | 5 | 4 | 1 |
| | වෙනත් | 12 | 13 | 30 |
| **එකතුව** | | **183** | **193** | **197** |

මූලාශ්‍රය - පොලිස් වෛද්‍ය සේවා කොට්ඨාසය

## ❖ දත්ත විශ්ලේෂණය

වගුවෙහි දත්තවලට අනුව 2016 වසරේ විවිධ රෝගාබාධ සහ වෙනත් හේතුමත මිය ගොස් ඇති පොලිස් නිලධාරීන් සංඛ්‍යාව 183 ක් වූ අතර 2017 වසර වන විට එම සංඛ්‍යාව 193 දක්වා 5% කින් ඉහළ ගොස් ඇත. 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ එම සංඛ්‍යාව 197 දක්වා 2% කින් ඉහළ ගොස් ඇත.

විවිධ අසනීප නිසා මියගිය සංඛ්‍යාවෙහි පහළයාමක් 2016 වසරට සාපේක්ෂව 2017 සහ 2018 වසරවල හඳුනාගත හැකිය. 2016 වසරේ වාර්තා වූ මරණ ප්‍රමාණය 101 ක් වූ අතර 2017 වසරෙහි එම ප්‍රමාණය 88 දක්වා 13% කින් ද 2018 වසරේ මරණ සංඛ්‍යාව 43 දක්වා 51% කින් ද 2017 වසරට සාපේක්ෂව පහළ ගොස් ඇත.

හෘදයාබාධ හේතුවෙන් මියයන සංඛ්‍යාවේ ක්‍රමික වර්ධනයක් වගුවට අනුව හඳුනාගත හැකිය. ඒ අනුව 2016 වසරේ 15 දෙනෙකු හෘදයාබාධ හේතුවෙන් මියගිය අතර 2017 වසරේ එම ප්‍රමාණය 25 දක්වා 67% කින් ඉහළ ගොස් ඇත. 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ හෘදයාබාධ මරණ ප්‍රමාණය 44 දක්වා 76% කින් ඉහළ ගොස් ඇත.

පිළිකා රෝගය නිසා මියගිය සංඛ්‍යාව ද ක්‍රමික ඉහලයාමක් පෙන්නුම් කර ඇත. 2016 වසරේ වාර්තා වූ මරණ සංඛ්‍යාව 09 ක් වූ අතර 2017 වන විට පිළිකා මරණ ප්‍රමානය 14 දක්වා 55% කින් 2016 වසරට සාපේක්ෂව ඉහළගොස් ඇත. 2018 වසරේ පිළිකා රෝගය හේතුවෙන් මරණ 16 ක් සිදුව ඇති අතර එය 2017 වසරට සාපේක්ෂව 14% ක ඉහළයාමකි.

වකුගඩු ආබාධ මරණ 2016 වසරේ වාර්තා නොවූ අතර 2017 වසරේ 11 ක් වාර්තා වී ඇත. එම ප්‍රමාණය 2018 වසරේ 09 දක්වා 18% කින් අඩු වී ඇත.

රිය අනතුරු හේතුවෙන් සිදුව ඇති පොලිස් නිලධාරී මරණ ගත්විට 2016 වසරේ මරණ 46 ක් වාර්තා වූ අතර 2017 වසරේ 42 දක්වා දක්වා එම මරණ 9% කින් අඩු වී ඇත. එසේ වුවද 2017 වසරට සාපේක්ෂව 2018 වසරේ රියඅනතුරු මරණ 55 දක්වා 31% කින් වර්ධනය වී ඇත.

## ❖ දත්ත විශ්ලේෂණය මගින් අවධානයට ලක්කළ යුතු කරුණු

ඉහත දත්ත විශ්ලේෂණය මගින් හෙළිවන පොලිස් නිලධාරී මරණ සම්බන්ධ විශේෂ කරුණක් නම් සමාජය තුළ බෝ නොවන රෝග නිසා සිදුවන මරණවල එක් පැතිකඩක් ලෙස බෝනොවන රෝග නිසා සිදුවන පොලිස් නිලධාරී මරන හඳුනාගත හැකි බවයි.

විශේෂයෙන්ම හෘදයාබාධ නිසා සිදුවන පොලිස් නිලධාරී මරණ ක්‍රමිකව ඉහළයාම සළකාබැලූ විට රාජකාරිය තුළ පවතින කායික හා මානසික දැඩි වෙහෙසකර බව එක දිගට වැඩිකාලයක් රාජකාරියෙහි යෙදීම වැනි හේතූන් නිසා ශරීර සෞඛ්‍ය කෙරෙහි දැක්විය යුතු අවධානය අල්පවීම වැනි කරුණු කෙරෙහි අවධානය යොමු කළයුතුව ඇත. බොහෝ දුරට නිවසින් දුරබැහැර ප්‍රදේශවල රාජකාරි කිරීමට සිදුවීම තුළින් ඇති වන සෞඛ්‍යාරක්ෂිත ආහාර ලබාගැනීමේ ඉඩකඩ සීමාවීම, රථවාහන රාජකාරි වැනි දැඩි වෙහෙසකර කටයුතුවල නියැලීම, ප්‍රමාණවත් ව්‍යායාම නොලැබීම වැනි කරුණු කෙරෙහි ද විශේෂ අවධානයක් යොමු කළයුතුව ඇත.

බොහෝ නිලධාරීන්ට සේවා කාලය තුළ නිවසට ආසන්න ප්‍රදේශයක රාජකාරි කිරීමට ලැබෙන ඉඩකඩ සීමාවන අතර එමගින් පවුල සමඟ සමීප සම්බන්ධතාවයක් පවත්වා ගැනීමට නොහැකිවීම තුළ මානසික පීඩාවන්ට ලක්වීම ද හෘදයාබාධ සඳහා යම් බලපෑමක් ඇති කළහැකිය යන්න බැහැර කළ නොහැක.

වගුවෙහි දත්තවලට අනුව පිළිකා රෝගය ද ක්‍රමානුකූල වර්ධනයක් පෙන්නුම් කර ඇති අතර ඒ පිළිබඳව වෛද්‍යමය කරුණු ද අධ්‍යයනයට ලක්කිරීම තුළින් මෙම රෝගී තත්ත්වයන් තවදුරටත් වර්ධනය වීමට ඉඩනොදී පාලනය කරගැනීම කෙරෙහි විශේෂ අවධානයක් යොමුකළ යුතුව ඇත.

වාර්ෂිකව බෝ නොවන රෝග සඳහා විශාල පොලිස් නිලධරයන් ප්‍රමාණයක් පොලිස් රෝහල මගින් ප්‍රතිකාර ලබාගනු ලබන අතර ඉතා දුරබැහැර සිට ද රෝගීන් පොලිස් රෝහල වෙත ප්‍රතිකාර සඳහා යොමු වීමක් දැකිය හැකිය. ඇතැම් විට දුරබැහැර ගෙවා පැමිණ ප්‍රතිකාර ලබා ගැනීමේ දුෂ්කරතාවය සළකා රෝගාබාධ සඳහා නිසි ප්‍රතිකාර නොගැනීම සහ බෝ නොවන රෝග හඳුනාගැනීමට කළයුතු පරීක්‍ෂණ නිසි පරිදි සිදුකර නොගැනීමේ ඉඩකඩක් ද පවතින බැවින් ඒ පිළිබඳව ද වැඩපිළිවෙලක් සැකසීම මගින් ද එම රෝග තත්ත්වයන් කලින් හඳුනාගෙන නිසි ප්‍රතිකාර සඳහා යොමුවිය හැකිවනු ඇත.

# 15. භෞතික සම්පත් සංවර්ධනය

යම් ආයතනයක් සතු මානව සම්පත උපරිම කාර්යක්ෂම මට්ටමට ලඟාකර ගනිමින් සේවා ඵලදායිත්වය ඉහළ නැංවීම සඳහා භෞතික සම්පත් අවශ්‍ය ප්‍රමාණයට සපයා ගැනීම අතිශය වැදගත් සාධකයකි. ශ්‍රී ලංකා පොලීසිය මෙම අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා වාර්ෂිකව විශාල මුදලක් වැයකරමින් ගොඩනැගිලි ඉදිකිරීම්, රථවාහන මිලදී ගැනීම් හා නඩත්තු කටයුතු, නව තාක්ෂණික මෙවලම් භාවිතය සහ පොලිස් රාජකාරි සඳහා අවශ්‍ය අනෙකුත් භාණ්ඩ හා සේවා සපයාගැනීම් සිදුකරනු ලබයි.

මෙම පරිච්ඡේදය මගින් 2018 වසරේ භෞතික සම්පත් සංවර්ධනය සඳහා ශ්‍රී ලංකා පොලීසිය ක්‍රියාකර ඇති ආකාරය විදහා දැක්වේ.

## 15:1 ඉදිකිරීම්

2018 වසරේ ශ්‍රීලංකා පොලීසියේ පොලිස් ස්ථාන, පෙරසවි ව්‍යාපෘති, භට නිවාස, නිල නිවාස ඇතුළුව විවිධ ඉදිකිරීම් සඳහා වෙන් කරන ලද මුදල රුපියල් මිලියන 1736.93කි. එම ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් පෙරසවි ව්‍යාපෘති, යටිතල පහසුකම් ගොඩනැගීම, පොලිස් ස්ථාන ඉදිකිරීම, භට නිවාස හා නිල නිවාස ඉදිකිරීම ආදි ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කර ඇති අතර එක් එක් ව්‍යාපෘතිය සඳහා වැයවන මුදල, 2018 වසර සඳහා වෙන්කළ ප්‍රතිපාදන, 2018.12.31 දිනට වැයකර ඇති මුදල සහ එදිනට ප්‍රගතිය ඇතුළත් වගු මෙම වාර්තාවට ඇමුණුම් 04 මගින් යාකර ඇත.

❖ **දත්ත විශ්ලේෂණය**

ඇමුණුම් අංක 04 හි වගු අංක 67හි ඇතුළත් පෙරසවි ව්‍යාපෘති 45 ක් 2018 වසරේ ශ්‍රී ලංකා පොලීසිය විසින් ක්‍රියාත්මක කොට ඇති අතර ඒ සඳහා වෙන්කළ මුදල රුපියල් මිලියන 74.3 කි. එයින් 2018.12.31 දිනට වැයකර ඇති මුදල රු: මිලියන 63.14 කි. 2018.12.31 දිනට ව්‍යාපෘති 45 කින් ව්‍යාපෘති 32 ක 2018 වසරට අදාළ කොටස සම්පූර්ණයෙන්ම අවසන් කර ඇත.

ඇමුණුම් 04 හි වගු අංක 69 ට අනුව අනෙකුත් පොලිස් ස්ථාන 20 ක ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා වෙන්කළ සමස්ථ මුදලින් 2018 වසර සඳහා රු: මිලියන 456.15 ක් වෙන්කර ඇති අතර 2018.12.31 දිනට සමස්ථ ව්‍යාපෘතිය සඳහා වැයකළ මුදල රුපියල් මිලියන 1512.5 කි.

2018.12.31 දිනට ව්‍යාපෘති 20න් 11ක් එනම් 55%ක් සම්පූර්ණයෙන්ම අවසන් කර ඇති අතර 10% ක වැඩ අවසන් අදියරේ පවතී.

ඇමුණුම් 04 හි වගු අංක 68 ට අනුව යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ව්‍යාපෘති 04ක් දියත් කොට ඇති අතර එම ව්‍යාපෘති සඳහා 2018 වසරට වෙන්කළ ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 45.57 කි. 2018.12.31 දිනට සමස්ථ ව්‍යාපෘතියේ ඒ දක්වා නිමකළ කොටස සඳහා වැයකර ඇති මුදල රුපියල් මිලියන 90.36 කි. එම ව්‍යාපෘති 04 න් 03 ක එනම් 75% ක වැඩ සම්පූර්ණයෙන්ම අවසන් කර ඇත.

ඇමුණුම් 04 හි වගු අංක 70 මගින් ඉදිරිපත්කර ඇති දත්ත අනුව භට නිවාස, නිලනිවාස, භෝජනාගාර සඳහා ගොඩනැගිලි ඉදිකිරීමට ව්‍යාපෘති 32 ක් ආරම්භ කර ඇති අතර එම ව්‍යාපෘතිවල 2018 වසර සඳහා වෙන්කළ මුදල රුපියල් මිලියන 1160.11 කි. සමස්ථ ව්‍යාපෘතිවල 2018.12.31 දක්වා ඉදිකිරීම් සඳහා වැයකළ මුදල රුපියල් මිලියන 2164.84 කි. සමස්ථ ව්‍යාපෘති 32 න් 12 ක් එනම් 37% ක් වැඩ අවසන් කර ඇත.

## 15.2 ශ්‍රී ලංකා පොලීසිය සතු ඉඩම් සහ ගොඩනැගිලි

ශ්‍රී ලංකා පොලීසිය පොලිස් ස්ථාන, පොලිස් කාර්යාල, භට නිවාස, නිල නිවාස සහ අනෙකුත් විවිධ අවශ්‍යතා සඳහා භාවිතා කරනු ලබන ඉඩම් සහ ගොඩනැගිලිවල අයිතියේ ස්වභාවය සහ කුලී පදනම මත ලබාගත් ගොඩනැගිලි සඳහා ගෙවනු ලබන මාසික සහ වාර්ෂික මුදල් ප්‍රමාණය පිළිබඳ දත්ත තොරතුරු පහත වගු අංක 55 මගින් දක්වනු ලැබේ.

වගු අංක 54 **ශ්‍රී ලංකා පොලීසිය සතු ඉඩම් සහ ගොඩනැගිලි**

| **2018.12.31 දිනට ශ්‍රී ලංකා පොලීසිය සතු ඉඩම් ප්‍රමාණය** | | | | **2018.12.31 වන දිනට ශ්‍රී ලංකා පොලීසිය සතු කුලී පදනම මත ලබාගෙන ඇති ගොඩනැගිලි ප්‍රමාණය** | | **කුලී පදනම මත ලබාගෙන ඇති ගොඩනැගිලි සඳහා 2018 වර්ෂය තුළ ගෙවා ඇති මුදල් ප්‍රමාණය** | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| **ස්ථානය** | **ඉඩම් ප්‍රමාණය** | | | | | **ගොඩනැගිලි ලබාගෙන ඇති කාර්යය** | **ප්‍රමාණය** | **මාසිකව ගෙවනු ලබන කුලී මුදල් ප්‍රමාණය (රු.)** | **වාර්ෂිකව ගෙවන ලබන කුලී මුදල් ප්‍රමාණය (රු.)** |
| | අක්කර | රූඩ් | පර්චස් | | | | | | |
| පොලිස් ස්ථාන - 345 | 1014 | 2 | 39.56 | පොලිස් කාර්යාල | 72 | පොලිස් කාර්යයාල | 72 | 4,056,292.15 | 31,203,717.72 |
| පොලිස් කාර්යාල/ මුරපොල/ නිල නිවාස/ සංචාරක නිවාස සහ වෙනත් - 142 | 732 | 1 | 0 | පොලිස් ස්ථාන | 46 | පොලිස් ස්ථාන | 46 | 10,773,232.00 | 123,582,334.00 |
| **එකතුව** | **1746** | **3** | **39.56** | පොලිස් මුරපොල | 30 | පොලිස් මුරපොල | 30 | 413,022.50 | 3,050,670.00 |
| | | | | නිල නිවාස හා හට නිවාස | 83 | නිල නිවාස හා හට නිවාස | 83 | 3,628,985.00 | 16,596,736.00 |
| | | | | **මුළු එකතුව** | **231** | **මුළු එකතුව** | **231** | **18,871,531.65** | **174,433,457.72** |

මූලාශ්‍රය - දේපළ කළමනාකරණ කොට්ඨාසය

### ❖ දත්ත විශ්ලේෂණය

වගුවට අනුව ශ්‍රී ලංකා පොලීසිය සතු මුළු ඉඩම් ප්‍රමාණය අක්කර 1746 රූඩ් 3 යි පර්චස් 39.56 කි. එම ඉඩම් ප්‍රමාණය පොලිස් ස්ථාන 345 ක් සහ පොලිස් කාර්යාල, මුරපොළ, නිලනිවාස, හට නිවාස, සංචාරක නිවාස ආදි ගොඩනැගිලි 142 ක් සඳහා භාවිතයට ගනු ලැබේ. මුළු ඉඩම් ප්‍රමාණයෙන් 58% ක් පොලිස් ස්ථාන සඳහා භාවිතා කරනු ලැබේ. ඉතිරි 42% ක ප්‍රමාණය අනෙකුත් ගොඩනැගිලි අවශ්‍යතා සඳහා යොදා ගැනේ.

වගුවට අනුව 2018.12.31 දිනට ශ්‍රී ලංකා පොලීසිය කුලී පදනම මත ලබාගෙන ඇති මුළු ගොඩනැගිලි ප්‍රමාණය 231 කි. එයින් 72 ක් පොලිස් කාර්යාල සඳහා ද 46 ක් පොලිස් ස්ථාන සඳහා ද 30 පොලිස් මුරපොළ සඳහා ද වන අතර ගොඩනැගිලි 83 ක් නිල නිවාස සහ හට නිවාස සඳහා යොදා ගැනේ.

ඒ අනුව ප්‍රතිශතයක් ලෙස කුලී පදනම මත ලබාගත් ගොඩනැගිලිවලින් 64% ක් යොදාගෙන ඇත්තේ පොලිස් ස්ථාන ඇතුළු කාර්යාලීය අවශ්‍යතා සඳහා වේ. 36% ක් නේවාසික අවශ්‍යතා සඳහා යොදාගෙන ඇත.

වගුවට අනුව ගොඩනැගිලි සඳහා කුලී මුදල් ලෙස 2018 වසරේ ගෙවන ලද මුදල් ප්‍රමාණය සැළකූ විට මාසිකව සියළුම ගොඩනැගිලි සඳහා රු 188,71531.65 ක් ගෙවා ඇත. එය රුපියල් මිලියන 19 කට ආසන්න මුදලකි. වාර්ෂිකව ගොඩනැගිලි සඳහා කුලී මුදල් ලෙස 2018 වසරේ ශ්‍රී ලංකා පොලීසිය ගෙවා ඇති මුළු මුදල රු 174433457.72 කි. එනම් රුපියල් මිලියන 174 කි.

## 15.3 නව පොලිස් ස්ථාන විවෘත කිරීම

2015 අයවැය යෝජනා අනුව ජනතාවට පොලීසියේ සේවය පහසුවෙන් සහ කාර්යක්ෂම ලෙස ලබාදීම සඳහා පවතින පොලිස් ස්ථාන සංඛ්‍යාව 600 දක්වා වැඩිකිරීමට යෝජනා කෙරුණි. ඒ අනුව 2018 වසරේ පහත සඳහන් පොලිස් ස්ථාන ජනතා සේවය සඳහා අභිනවයෙන් විවෘත කර ඇති අතර ග්‍රාමනිලධාරි වසම් 13 ක 32214 ක ජනගහණයක් සඳහා ඉන් සේවය සැළසෙනු ඇත.

වගු අංක 55 **2018 වසරේ නව පොලිස් ස්ථාන විවෘත කිරීම් වගුව**

| **නව පොලිස් ස්ථානය** | **අයත් කොට්ඨාසය** | **සේවය ලබන ජනගහණය** | **ග්‍රාමනිලධාරි වසම් සංඛ්‍යාව** |
|---|---|---|---|
| මත්තේගොඩ | ගල්කිස්ස | 22882 | 08 |
| අක්කරායන්කුලම් | කිළිනොච්චිය | 9332 | 05 |

මූලාශ්‍රය - පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාසය



2018.06.13 මත්තේගොඩ නව පොලිස් ස්තානය විවෘත කිරීම



2018.06.13 මත්තේගොඩ නව පොලිස් ස්තානය විවෘත කිරීම

## 15.4 ආදර්ශ පොලිස් ස්ථාන සහ පොලිස් ලේඛනාගාරය අරම්භකිරීම

පොලිස්පති සංකල්පයක් මත ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය යටතේ දිවයිනේ පොලිස් කොට්ඨාස 42 ම ආවරණය වන පරිදි එක් පොලිස් කොට්ඨාසයකින් එක් පොලිස් ස්ථානයක් බැගින් පොලිස් ස්ථාන 42 ක් ආදර්ශ පොලිස් ස්ථාන බවට පත්කෙරේ. මෙම ව්‍යාපෘතිය 2018 අයවැය යෝජනාව මගින් අනුමත කරගනිමින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතියකි.

මෙය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමේ මූළික පරමාර්ථය වී ඇත්තේ ආදර්ශ පොලිස් ස්ථානය අනෙකුත් පොලිස් ස්ථානවලට ආදර්ශයක් වන ආකාරයට සෑම අතින්ම අංග සම්පූර්ණ කාර්යක්‍ෂම මහජන සේවයක් සළසන පොලිස් ස්ථානයක් බවට පත්කිරීම වේ. මෙය මූළිකවම ආකාර 03 ක් යටතේ ක්‍රියාත්මක වේ.

I. පොලිස් ස්ථානයේ සේවයේ නියුතු නිලධරයන්ට තම රාජකාරිය නිසි පරිදි ඉටුකිරීමට හැකි පරිසරයක් නිර්මාණය කිරීම.
II. පොලිස් ස්ථානයෙන් තම සේවා කටයුතු ඉටුකර ගැනීමට පැමිණෙන මහජනතාවට තම කාර්ය නිසි පරිදි ඉටුකර ගැනීමට අවශ්‍ය පහසුකම් හා පරිසරය නිර්මාණය කිරීම.
III. පොලිස් වසම තුළ නීතිය හා සාමය ස්ථාපිත කිරීම සහ අපරාධ මැඩලීමේ කටයුතු මෙන්ම රථවාහන පාලනය හා අනෙකුත් ක්‍රියාකාරකම් සැළසුම් සහගතව ක්‍රියාත්මක කිරීම සහ පොලීසියේ දර්ශනයට ලඟාවීම.

ආදර්ශ පොලිස් ස්ථාන සඳහා මේ වන විට කොට්ඨාස මට්ටමින් පොලිස් ස්ථාන නම්කර අවසන්ව ඇති අතර යටිතල පහසුකම් සංවර්ධනය යටතේ අගල් 32 වර්ණ රූපවාහිනියක්, ඩී.වී.ඩී ප්ලේයරයක්, විදුලි පංකාවක්, ඇදි පුටු 10 ක්, මහජනතාවට රැදී සිටීමේ ස්ථානයක් සහ විවිධ පැමිණිලි අංශය සහ පැමිණිලි සටහන් කිරීම සහ පැමිණිලි විභාග කිරීම සඳහා වෙන් වෙන්ව ස්ථාන සැකසීම ආදි කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබාදී එම කටයුතු සිදුකරමින් පවතී.

### ❖ පොලිස් ලේඛනාගාරය

ශ්‍රී ලංකා පොලීසියේ අතීතය විදහා දැක්වෙන ඉතා වටිනා ලේඛන රැසක් සංරක්‍ෂණය කිරීම සඳහා මෙම ලේඛනාගාරය පිහිටුවනු ලැබේ. පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාස භාර අධ්‍යක්‍ෂවරයාගේ අධීක්‍ෂණය යටතේ ක්‍රියාත්මක වන මෙම ලේඛනාගාරය පොලිස් ඉතිරිකිරීම් සංගම් ගොඩනැගිල්ලේ සිව්වන මහලේ ස්ථාපිත කොට ඇත. ලේඛනාගාරය තුළ පොලිස් ගැසට්පත්‍ර, චක්‍රලේඛ, පොලිස් ආකෘතිපත්‍ර, පැරණි ඡායාරූප ඇතුළු යටත්විජිත යුගයේ සිට මේ දක්වා පොලීසියේ ක්‍රියාකාරීත්වයට අදාළ ලේඛනවල පිටපත් සංරක්‍ෂණය කර ඇත.

 

පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාසයේ පිහිටුවා ඇති නව පොලිස් ලේඛනාගාරයේ ඡායාරූප

## 15.5 ශ්‍රී ලංකා පොලීසියේ රථවාහන

පොලිස් රාජකාරි කාර්යක්ෂමව හා ඵලදායීව ඉටුකර ගැනීම සඳහා ශ්‍රී ලංකා පොලීසිය සෑම විටම විවිධ රථවාහන භාවිතයට ගනී. එහිදී අවශ්‍යතාවය පරිදි රථවාහන අලුතෙන් මිල දී ගැනීම සිදුකරනු ලබන අතර පවතින රථවාහන ඉතා ඉහළ මට්ටමකින් නඩත්තු කර සේවයට යොදා ගනී. මේ සියලු අවශ්‍යතා සඳහා විශාල පිරිවැයක් දරනු ලබන අතර 2018 වසරේ රථවාහන මිල දී ගැනීම්, රථවාහන අලුත්වැඩියාව හා නඩත්තුකිරීම් සහ 2018.12.31 දිනට ශ්‍රී ලංකා පොලීසිය සතු වාහන පිළිබඳ තොරතුරු පහත වගු අංක 56, 57 සහ 58 මගින් දක්වා ඇත.

වගු අංක 56 **2018 වසරේ රථවාහන මිලදී ගැනීම් වගුව**

| වාහන වර්ගය | ප්‍රමාණය | ගෙවූ මුදල (රුපියල්) |
|---|---|---|
| ලෑන්ඩ් කෲෂර් | 11 | 49,787,080.00 |
| ත්‍රස්ත විමර්ශන කටයුතු සඳහා වෑන් රථ | 1 | 1,783,349.00 |
| යතුරු පැදි 250 CC | 10 | 43,878,324.00 |
| 1300 CC | 10 | |
| කාර්රථය | 2 | 15,449,000.00 |
| ජීප් රථ | 1 | 4,000,000.00 |
| මුළු මුදල (රුපියල්) | | 114,897,753.00 |

මූලාශ්‍රය - පොලිස් ප්‍රවාහන කොට්ඨාසය

වගු අංක 57 **2018 වසරේ රථවාහන නඩත්තුව සහ අලුත්වැඩියාව සඳහා වැයවීම් වගුව**

| කාරණය | වැය විෂය | මුදල (රු) |
|---|---|---|
| රථවාහන නඩත්තුව | 255-1-0-1301 | 74,567,867.43 |
| රථවාහන අළුත්වැඩියාව | 225-1-2-0-2003 | 85,495,991.90 |

මූලාශ්‍රය - පොලිස් ප්‍රවාහන කොට්ඨාසය

වගු අංක 58 **2018.12.31 දිනට ශ්‍රී ලංකා පොලීසිය සතු රථවාහන වගුව**

| වාහන වර්ගය | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජීප් රථ | කාර් රථ | ඉවත්විදුලි කාර් රථ | සිංගල් කැබ් රථ | ඩබල් කැබ් රථ | වෑන් රථ | ශිලත් රථ | ට්‍රක් රථ | සිමෝ බටා රථ | බස් රථ | ජලබවුසර් රථ | ට්‍රැක්ටර් රථ | අත්ට්‍රැක්ටර් රථ | ගලි බවුසර් රථ | ත්‍රී රෝද රථ | යතුරු පැදි | අශ්ව ප්‍රවාහන ට්‍රක් රථ | ශීල ක්‍රකම රථ | ජලප්‍රහාරක රථ | ශ්‍රඩ රථ |
| 1600 | 789 | 121 | 694 | 203 | 130 | 60 | 243 | 5 | 199 | 129 | 184 | 51 | 16 | 382 | 4327 | 5 | 21 | 15 | 54 |

| වාහන වර්ගය | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආපදා රථ | රිකවරි රථ | බුම්ට්‍රක් රථ | බෝට්ටු | බුල්ඩෝසර්/කැටපිලර් | බර උසුලන රථ | සිබ රෝවර් රථ | ජංගම බැඩ රථ | ජංගම ඩිවෙක රථ | ට්‍රැක්ටර් ටේලර් රථ | ට්‍රැක්ටර් බවුසර් රථ | ට්‍රැක්ටර් ගලි රථ | ගිනි නිවන රථ | ටිපර් රථ | ජංගම සෝදිසි රථ | ගල් රෝල | ශ්‍රඩ ටැංකි | දියගොඩ රථ | බිධාක | එකතුව |
| 9 | 2 | 1 | 33 | 9 | 11 | 5 | 3 | 2 | 140 | 76 | 12 | 1 | 2 | 2 | 1 | 5 | **2** | 3 | 9547 |

මූලාශ්‍රය - පොලිස් ප්‍රවාහන කොට්ඨාසය

## 15.6 භාණ්ඩ සහ සේවා මිල දී ගැනීම්

පොලිස් රාජකාරි යටතට ගැනෙන සියලුම කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායී අයුරින් ඉටුකර ගැනීම සඳහා ඉවහල් වන භාණ්ඩ සහ සේවාවන් රාශියක් ශ්‍රී ලංකා පොලීසිය විසින් සෑම වසරකම සපයාගනු ලැබේ. නිලධාරීන් බඳවාගැනීමේ සිට ඔවුන් පුහුණුකිරීම, ඔවුන් සේවයේ යෙදවීම, අපරාධ විමර්ශන, කැරලි මර්දන, මත්ද්‍රව්‍ය නිවාරණ ආදි සියලුම පොලිස් කාර්යයන් සඳහා අවශ්‍යකරන භාණ්ඩ හා සේවා මේ යටතේ සපයාගනු ලැබේ. ශ්‍රී ලංකා පොලීසිය සහ විශේෂ කාර්ය බලකාය මගින් 2018 වසරේ භාණ්ඩ හා සේවා සපයාගැනීම් පිළිබඳ තොරතුරු පහත වගු අංක 56 මගින් ඉදිරිපත් කර ඇත.

වගු අංක 59 **2018 වසරේ භාණ්ඩ හා සේවා මිල දී ගැනීම් වගුව**

| අනු අංකය | වැඩසටහන / ව්‍යාපෘතිය | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති/ කාර්යයන් | ආරම්භ කළ දිනය | අවසන් කළ දිනය | 2018 වර්ෂයේ ලද ප්‍රතිපාදන | වියදම (රු.මි.) (2018.12.31) | මේ වන විට ප්‍රගතිය (%) (2018.12.31) |
|---|---|---|---|---|---|---|---|
| | පුනරාවර්ථන වියදම් | | | | | | |
| 1 | 225-1-1-0-1203-(1) | නිල ඇඳුම් | 2018.01.01 | 2018.12.31 | 950,000,000.00 | 528,288,528.00 | 55.61 |
